
2022 ජූනි • 243 කලාපය

# රණවිරුවා



## අභිමන් මෙහෙවරට විකුමන් පිරි නායකත්වයක්..

# නව යුද්ධ හමුදාධිපති ගෞරවනීය හමුවීම් රැසක

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 24 වන යුද්ධ හමුදාධිපති ලෙස වැඩභාරගත් ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ නව ධුරයේ රාජකාරි භාර ගැනීමෙන් අනතුරුව පසුගිය ජුනි 02 වන දින අතිගරු ජනාධිපති තුමා, අග්‍රාමාත්‍ය තුමා සහ ආරක්ෂක ලේකම් තුමා හමුවිය.



ජනාධිපති මන්දිරයේදී අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා හමුවූ අවස්ථාව



අග්‍රාමාත්‍ය කාර්යාලයේදී අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා හමුවූ අවස්ථාව




ආරක්ෂක අමාත්‍යාංශ පරිශ්‍රයේදී ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) හමුවූ අවස්ථාව



ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලයේදී ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ගිල් හමුවූ අවස්ථාව

# 'Storm of Warriors' ග්‍රන්ථය අතිගරු ජනාධිපතිතුමන් වෙත පිළිගැන්වේ



නව ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහ නව යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ විසින් 'Storm of Warriors' ග්‍රන්ථයේ මංගල පිටපත ගජබා රෙජිමේන්තුවේ හිටපු සාමාජිකයකු වන අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා වෙත පසුගිය ජූනි 02 වන දින ජනාධිපති මන්දිරයේදී පිළිගන්වනු ලැබූහ.

ගජබා රෙජිමේන්තුවේ වීරෝදාර රණවිරුවන් මාතෘ භූමියේ විමුක්තිය සඳහා සිදුකරන ලද අසමසම කැපකිරීමත්, රෙජිමේන්තුවේ ආරම්භයේ සිට මේ දක්වා සිදුවූ ප්‍රවර්ධනයන්, එහි යටිතල පහසුකම් සංවර්ධනයන්, යුද පිටියේ ලද ජයග්‍රහණයන් සහ මානුෂීය මෙහෙයුම් සඳහා ගජබා රෙජිමේන්තුවේ වීරෝදාර රණවිරුවන්ගේ දායකත්වය ආදී වූ අමරණීය මතක රැසක් 'Storm of Warriors' නමැති මෙම ග්‍රන්ථයේ අන්තර්ගත වේ.

ගජබා රෙජිමේන්තු අධිපති ධූරය හෙබවූ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ගේ සංකල්පයකට අනුව එම රෙජිමේන්තු මන්ත්‍රණ සභාවේ සාමාජිකයින් විසින් රචනා කරනු ලැබූ මෙම ග්‍රන්ථය තුළ ගජබා රෙජිමේන්තුවේ රණවිරුවන් විසින් අතීතයේ සිදුකරනු ලැබූ මෙහෙයුම් සහ එම රෙජිමේන්තු රණවිරුවන්ගේ කැපකිරීම් පිළිබඳ ඡායාරූප සමගින් ඉතා වර්ණවත් හා අලංකාරවත් අයුරින් ලේඛනගත කර ඇත.

# "සම්බුද්ධ රාජ මණ්ඩපය" සඟසතු කෙරේ





ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සහ සුනේත්‍රා දේවි පිරිවෙනේ පිරිවෙනාධිපති පූජ්‍ය මහාචාර්ය මැදගොඩ අභයතිස්ස නායක හිමිපාණන්ගේ ආරාධනයකට අනුව පැපිලියාන ඓතිහාසික ශ්‍රී සුනේත්‍රා දේවි මහා පිරිවෙන් සංකීර්ණයේ පැවති උත්සවයකට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) සහභාගී වූ අතර යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහ තවත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් ද එම අවස්ථාවට එක්වූහ.

උත්සවයේ ආරම්භය සනිටුහන් කරමින්, කුඹුක් දැව භාවිතා කරමින් එම විහාරස්ථාන පරිශ්‍රයේ නිර්මාණය කරනු ලැබූ ලී මූර්ති සහ ලී කැටයම්වලින් පරිපූර්ණ "සම්බුද්ධ රාජ මණ්ඩපය" නම් දෙමහල් මණ්ඩපය මහා සංඝරත්නයේ සෙත් පිරිත් සජ්ඣායනා මධ්‍යයේ ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) ගේ සුරතින් සමරු ඵලකය නිරාවරණය කරමින් සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා විවෘත කරන ලදී.



ඉන් අනතුරුව, එම පරිශ්‍රයේ අභිනවයෙන් ඉදිකරනු ලැබූ නව දහම් පාසල් ගොඩනැගිල්ල යුද්ධ හමුදාධිපති ගේ සුරතින් සිසු සිසුවියන් ගේ අයිතියට පත්කරන ලදී.



# අභිමානවත් සෙවණකදී ඓතිහාසික ඇරඹුමක් සනිටුහන් වූ වගයි

24 වන යුද්ධ හමුදාධිපති ලෙස අභිනවයෙන් පත් වූ ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු පසුගිය ජුනි 01 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ හමුදා සම්ප්‍රදායානුකූලව පැවති අභිමානවත් උත්සවයකදී රාජකාරී භාරගන්නා ලදී.

වර්ෂ 1986 ඔක්තෝබර් මස 27 දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය බලසේනාවට කෙඩෙට් නිලධාරියකු ලෙස එක්වූ ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු පාඨමාලා අංක 26 යටතේ දියතලාව යුද්ධ හමුදා විද්‍යාපීඨයෙන් සහ පාකිස්ථාන යුද්ධ හමුදා විද්‍යාපීඨයෙන් මූලික පුහුණුව සාර්ථකව හදාරන ලදී. පසුව, එතුමන් දෙවන ලුතිනන්වරයකු ලෙස අධිකාරියට පත්ව ගජබා රෙජිමේන්තුවට අනුයුක්තව ඇත.



ඒකක මට්ටමේ සියලු තනතුරු දරා ඇති එතුමන් ඉන් පරිබාහිරවද දිවයින පුරා යුද්ධ හමුදා අංශ ආයතන රැසක විවිධ තනතුරු රැසක් හොබවා ඇති අයෙකි. විශේෂයෙන්ම 4 වන ගජබා රෙජිමේන්තුවේ සහ 8 වන ගජබා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ලෙසද කටයුතු කොට ඇති එතුමන් නැගෙනහිර ප්‍රදේශයේ ත්‍රස්තවාදය තුරන් කිරීම සඳහා පැවති මෙහෙයුම්වලදී ඉටුකරන ලද්දේ කැපී පෙනෙන මෙහෙවරකි. එසේම, මන්නාරම ප්‍රදේශයේ ත්‍රස්තවාදී ග්‍රහණයේ පැවති ප්‍රදේශ අත්පත් කරගැනීම වෙනුවෙන් දියත් කළ වන්නි මානුෂීය මෙහෙයුමේදී අණදෙන නිලධාරියකු ලෙස පුරෝගාමී මෙහෙවරක් ඉටුකරන ලදී.



තවද, එතුමන් ඉන්දියාව, පාකිස්ථානය, බංගලාදේශය සහ ඉන්දුනීසියාව ඇතුළු රටවල් රැසකද පාඨමාලා හදාරා ඇති අතර, ජාත්‍යන්තර වැඩමුළු රැසකටද එක්ව බොහෝ අත්දැකීම් ලැබුවෙකි. 225 සහ 553 වන පාබල බලසේනාවන්හි කාර්ය නියුතු බලසේනාධිපති, කලාප අණදෙන

"එල්ලවී ඇති ජාතික අභියෝගවලට මුහුණදීමේදී රටේ ආරක්ෂාවද ජනතා සුබසෙතද වෙනුවෙන් යුද්ධ හමුදාව ලෙස පැවරෙන කාර්යභාරය නොපිරිහෙලා ඉටුකිරීමද නව යුද්ධ හමුදාධිපතිගේ පැහැදිළි දැක්ම වේ. එසේම සාමූහික ශක්තියෙන් හෙබි විනයගරුක හමුදාවක් ලෙස "දෙස පළමුව දිවි දෙවැනිව" කටයුතු කරන්නට නව නායකත්වය යටතේ යුද්ධ හමුදාව සැදී පැහැදී සිටී. රණබිමෙහි විකුම් පෑ මතකයන්ද සෙසු අත්දැකීම් තුළින් ලද පරිචයද තුළින් යුද්ධ හමුදාව ශක්තිමත්ව ඉදිරියට ගෙනයාමට වත්මන් යුද්ධ හමුදාධිපති තුමන්ගේ අණදීම යටතේ හැකිවනු නොඅනුමානය"











නිලධාරි සහ මෙහෙයුම් ආඥාපති කොළඹ, 215, 542, 224, 221 සහ 623 වන පාබල බලසේනාවන්හි බලසේනාධිපති, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලයේ අධ්‍යක්ෂ පුහුණු හා මූලධර්ම සහ අධ්‍යක්ෂ ජෙනරාල් ක්‍රියා හා සැලසුම්, අම්පාර සටන් පුහුණු පාසලේ සේනාවිධායක, මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ ජෙනරාල්, 21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, බටහිර ආරක්ෂක සේනා ආඥාපති, මධ්‍යම ආරක්ෂක සේනා ආඥාපති, ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ රෙජිමේන්තු අධිපති මෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක ලෙසද වගකීම් සහගත ජ්‍යෙෂ්ඨ තනතුරු රැසක් හෙබවූ අතිදක්ෂ නිලධාරියෙකි.

# යුද්ධ හමුදාධිපති මහනුවර ශ්‍රී දළදා මාලිගාව වැඳපුදාගනී





අභිනවයෙන් පත් වූ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සිය ධුරයේ රාජකාරී භාරගැනීමෙන් අනතුරුව පසුගිය ජූනි 11 වන දින මහනුවර ශ්‍රී දළදා මාලිගාව වැඳපුදාගෙන ආශිර්වාද ලබා ගත්තේය. මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මැතිණිය සහ පවුලේ සාමාජිකයින් ද එක්වූහ. එහිදී, දියවඩන නිලමේ නිලංග දැල බණ්ඩාර මහතා සමඟ ද සුහද සාකච්ඡාවක නිරත වූ යුද්ධ හමුදාධිපති මල්වතු, අස්ගිරි මහනායක හිමිවරුන් බැහැදැක ආශිර්වාද ලබාගැනීමට ද අමතක නොකළේය.



# යුද්ධ හමුදාධිපති අනුරාධපුර පූදබිමෙහි සංචාරයක



ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 24 වන යුද්ධ හමුදාධිපති වශයෙන් අභිනවයෙන් පත් වූ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්විඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පසුගිය ජූනි 11 වන දින අනුරාධපුර පූජා නගරයේ සංචාරයක නිරත වෙමින් ජය ශ්‍රී මහා බෝධිය, රුවන්වැලි මහා සෑය සහ මිරිසවැටිය චෛත්‍ය රාජයාණන් වහන්සේලා වැඳපුදා ගන්නා ලදී.



අටමස්ථානාධිපති හා උතුරු මැද ප්‍රධාන සංඝනායක පල්ලේගම සිරිනිවාසාභිදාන නායක හිමිපාණන් වහන්සේ මෙන්ම රුවන්වැලි මහාසෑයේ විහාරාධිපති, මිරිසවැටිය විහාරාධිපති හිමියන් ඇතුළු මහා සංඝරත්නය බැහැදැක වැඳපුදා ආශිර්වාද ලබාගත්තේය.



එම අවස්ථාව සඳහා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය, එම පවුලේ සාමාජිකයින් සහ යුද සේවා ලේකම් මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ඇතුළු පිරිසක්ද සහභාගී වූහ.

# නව යුද්ධ හමුදාධිපතිට නාවික, ගුවන් හා පොලිසියෙන් හරසර





ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 24 වන යුද්ධ හමුදාධිපති ලෙස අභිනවයෙන් පත් වූ ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සිය ධුරයේ රාජකාරී භාරගැනීමෙන් අනතුරුව ඉකුත් ජූනි 06 වන දින නාවික හමුදා මූලස්ථානයේ දී නාවික හමුදාධිපති වයිස් අද්මිරාල් නිශාන්ත උළුගේතැන්න හමුවිය.





යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සිය ධුරයේ රාජකාරී භාරගැනීමෙන් අනතුරුව පසුගිය ජූනි 06 වන දින ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේදී ගුවන් හමුදාධිපති එයාර් මාර්ෂල් සුදර්ශන පතිරණ හමුවිය.





ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සිය ධුරයේ රාජකාරී භාරගැනීමෙන් අනතුරුව පසුගිය ජූනි 10 වන දින පෙරවරුවේ පොලිස් මූලස්ථානයේ සිය ප්‍රථම නිල සංචාරය සිදුකරන ලදී. එහිදී, නව යුද්ධ හමුදාධිපති වෙත පොලිස් නිලධාරීන්, නිලධාරිනියන් සහ පොලිස් විශේෂ කාර්ය බලකායේ භටපිරිස්වලින් සැදුම්ලත් සම්මාන මුරයේ ගෞරවාචාරය පුදකරනු ලැබූහ. පොලිස්පති සීඩී වික්‍රමරත්න ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමග එහිදී, යුද්ධ හමුදාධිපති සුහද කතාබහක ද නිරත විය.



# නව යුද්ධ හමුදාධිපති වෙත මව් රෙජිමේන්තුවෙන් බුහුමන්

පසුගිය දා යුද්ධ හමුදාධිපති ධුරයේ රාජකාරි ආරම්භ කළ ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගජබා රෙජිමේන්තු අධිපති ලෙස ඉකුත් ජූනි 18 වන දින රාජකාරි භාරගන්නා ලදී. මෙම අවස්ථාව සඳහා කෙඩෙට් නිලධාරි පාඨමාලා අංක - 26 හි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් ද සහභාගී වූහ.

ගජබා රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙත සපැමිණි යුද්ධ හමුදාධිපති එහිදී එම රෙජිමේන්තුවේ නිර්මාතෘ වන දිවංගත මේජර් ජෙනරාල් විජය විමලරත්න සිහිකරමින් එතුමන්ගේ පිළිරුවට පුෂ්පෝපහාර පුදකරනු ලැබීය. පසුව, එම රෙජිමේන්තුවේ බලඇණි 20 ක් නියෝජනය කරමින් එක් වූ භටපිරිස් 560 දෙනකුගෙන් සැදුම්ලත් පෙළපාලියේ ගෞරවාචාරය යුද්ධ හමුදාධිපති වෙත පිළිගන්වන ලදී.

යුද්ධ හමුදාධිපති ගජබා රෙජිමේන්තු මූලස්ථානය වෙත සපැමිණි ප්‍රථම අවස්ථාව සනිටුහන් කරමින් කඳවුරු පරිශ්‍රයේ නා පැළයක් රෝපණය කිරීමට ද, අනතුරුව රෙජිමේන්තු මධ්‍යස්ථානයේ නිලධාරීන් සමග ද කෙඩෙට් නිලධාරි පාඨමාලා අංක - 26 හි විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් සමග ද එහි පැමිණ සිටි යුද්ධ හමුදාධිපති ගේ ඒකකය වූ 4 වන ගජබා රෙජිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමගින් ද සමූහ ඡායාරූප කිහිපයකට පෙනී සිටියහ. පසුව, සියලු නිල තේ පැන් සංග්‍රහයකට මෙන්ම දිවා භෝජන සංග්‍රහයකට ද යුද්ධ හමුදාධිපති එක්විය.

මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනී ජානකී ලියනගේ මහත්මිය සහ පවුලේ සාමාජිකයින්, යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ, ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී හා ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ද එක්වූහ.







# යුද්ධ හමුදාධිපති සිය ඉදිරි සැලසුම් හා දැක්ම පැහැදිළි කරමින්




ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 24 වන යුද්ධ හමුදාධිපති ලෙස පසුගිය දා රාජකාරි භාරගත් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ නව ධූරයේ රාජකාරි ආරම්භ කිරීමෙන් පසුව පසුගිය ජූනි 16 වන දින පෙරවරුවේ යුද්ධ හමුදා මූලස්ථානයේදී ප්‍රථම වරට සියලු නිලයන් අමතනු ලැබීය. එහිදී, හටපිරිස්වල සුබසාධනය සලසමින් හමුදාවේ අභිවෘද්ධිය වෙනුවෙන් වූ සිය දැක්ම පැහැදිලි කරන ලදී. තවද, ජාතික අවශ්‍යතාවයන් මැනවින් හඳුනාගනිමින් දේශයේ ආරක්ෂාව සැලසීම ද දේශය ගොඩනැගීම උදෙසා උපරිම දායකත්වය සැලසීම පිළිබඳව ද යුද්ධ හමුදාධිපති එහිදී වැඩිදුරටත් පැහැදිලි කළේය.

තවද, නව යුද්ධ හමුදාධිපති යුද්ධ හමුදාවේ ප්‍රවර්ධනය වෙනුවෙන් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ සියලුම ප්‍රධාන මාණ්ඩලික නිලධාරීන්, ආරක්ෂක සේනා ආඥාපතිවරුන්, ඉදිරි තඩත්තු පෙදෙස් ආඥාපතිවරුන්, සේනාංකාධිපතිවරුන්, බලසේනාධිපතිවරුන්, පුහුණු පාසල් සහ ඒකක අණදෙන නිලධාරීන් ද දැනුවත් කරන ලදී.

ඉදිරි කාලසීමාවේදී යුද්ධ හමුදාවේ සියලුම රණවිරුවන්ගේ අවශ්‍යතාවයන් වෙනුවෙන් තවදුරටත් කඩිනමින් සිදුවිය යුතු පාලන හා හටකාර්ය සම්පාදන අවශ්‍යතා සඳහා ප්‍රමුඛත්වයක් ලබාදීම ද යුද්ධ හමුදාධිපතිගේ ප්‍රමුඛ කාර්යභාරයක් බව එහිදී අවධාරණය කෙරිණ. තවද, ජාතිය ගොඩනැංවීමේ මෙහෙවරේ පුරෝගාමී කාර්යභාරයක් යුද්ධ හමුදාව වෙත පැවරී ඇති බැවින් රටේ කෘෂිකාර්මික හා පශු සම්පත් ක්ෂේත්‍රයේ සීඝ්‍ර දියුණුවක් ඇතිකරමින් රට ස්වයංපෝෂිත කිරීම වෙනුවෙන්ද උපරිම දායකත්වය ලබාදීම යුද්ධ හමුදාධිපතිගේ අපේක්ෂාව වේ. ඕනෑම ආරක්ෂක තර්ජනයකට මුහුණදීම සඳහා ශක්තිමත්ව සූදානම් වෙමින් රටේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා පොලීසිය ඇතුළු අනෙකුත් ආයතනයන්ට අවශ්‍ය සහය ලබාදීමත්, නාවික හා ගුවන් හමුදාවන් සමග පවතින අන්‍යෝන්‍ය සහයෝගය ඉදිරි කාලසීමාවේදී තවදුරටත් වර්ධනය කරගනිමින් ඉදිරි ක්‍රියාකාරකම්හි නියැලමේ වැදගත්කම ද යුද්ධ හමුදාධිපති එහිදී සිහිපත් කළේය.

මෙරට තිබෙන වඩාත්ම සංවිධානාත්මක ආයතනය වශයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට රටේ මහජනතාව පීඩාවට පත්වූ ඕනෑම අවස්ථාවක ඔවුන් ඉන් මුදවාගැනීමේ කාර්යභාරයක් පැවරී තිබෙන හෙයින්, එවැනි විශේෂිත ජාතික ආපදාකාරී අවස්ථා සඳහා සහ ස්වභාවික ව්‍යසනයන්හිදී සහයෝගය ලබාදීමට අප බැඳී සිටිය යුතු බවද යුද්ධ හමුදාධිපති සිය දේශනයේදී තවදුරටත් අවධාරණය කරන ලදී.

"ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රමුඛතම රාජකාරිය වන්නේ රටේ ස්වෛරීත්වය හා භෞමික අඛණ්ඩතාවයට එරෙහිව පැමිණෙන තර්ජනයන් හඳුනාගනිමින් මෙරට පාලනය වන උත්තරීතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීම සහ රටතුළ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමට සහයෝගය දක්වමින් ජාතික ආරක්ෂාව තහවුරු කිරීම බව ඔබ හොඳින් වටහාගැනීම ඉතාමත් අත්‍යවශ්‍යයි. විශේෂයෙන්ම මෙහිදී, යුද්ධ හමුදාධිපති ලෙස මාගේ දැක්ම වනුයේ වෘත්තිය නිපුණත්වයකින් යුත් උසස් හමුදාවක් පවත්වා ගනිමින් එම අරමුණ ජයග්‍රහණය කිරීම බව කිව යුතුය."

\- යුද්ධ හමුදාධිපති







# ආහාර සුරක්ෂිතතා ව්‍යාපෘතිය ඇරඹුමට යුද්ධ හමුදාවෙන් නව මෙහෙයුම් කමිටුවක්



ජාතික සහ කාලීන වැදගත්කමකින් යුත් තවත් විශාල ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට සූදානම් වන ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ඉකුත් ජූනි 16 වන දින යුද්ධ හමුදා හරිත කෘෂිකර්ම මෙහෙයුම් කමිටුව ස්ථාපිත කරන ලදී. මෙම කමිටුව තුළින් දිවයින පුරා ඇති වගා නොකළ අතහැර දමා ඇති රජයේ ඉඩම් අක්කර 1500 කට අධික ප්‍රමාණයක් කෘෂිකාර්මික කටයුතුවලට යොදාගනිමින් දිවයිනේ ආහාර සුරක්ෂිතතා වැඩසටහන ප්‍රවර්ධනය කිරීමට බලාපොරොත්තු වේ.

රජය විසින් මෙම වසරේ ජූලි මස මුලදී මුළු දිවයිනම ආවරණය වන පරිදි ආරම්භ කරන කෘෂිකාර්මික ව්‍යාපෘතියට සමගාමීව යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ මඟපෙන්වීම මත හරිත කෘෂිකර්ම මෙහෙයුම් කමිටුවේ සමස්ත කළමනාකාරිත්වයේ ප්‍රධානී ලෙස යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ කටයුතු කරනු ලබයි. තවද, එම කමිටුවේ සාමාජිකයින් ලෙස අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී, උපකරණ මාස්ටර් ජෙනරාල් මේජර් ජෙනරාල් ආර්ජීඩීපී රණවක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී, මූල්‍ය කළමණාකරණ අධ්‍යක්ෂ ජෙනරාල් මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීඑස්එම් අබේසේකර ආර්එස්පී යූඑස්පී, යුද්ධ හමුදා භාණ්ඩකාර්ය සම්පාදන ආඥාපති මේජර් ජෙනරාල් එස්පීඒඅයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී, ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු මේජර් ජෙනරාල් එම්කේ ජයවර්ධන ආර්එස්පී යූඑස්පී එන්ඩියූ, ක්‍රියාන්විත අධ්‍යක්ෂ, ජනමාධ්‍ය අධ්‍යක්ෂ, විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ, කෘෂිකර්ම සහ පශු සම්පත් අධ්‍යක්ෂ, පර්යේෂණ සංකල්ප හා මූලධර්ම අධ්‍යක්ෂ ඇතුළු තවත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කටයුතු කරනු ලබති. මෙම ව්‍යාපෘතියේ සම්පූර්ණ අධීක්ෂණ කටයුතු යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ විසින් සිදුකරනු ලබයි.



සමාරම්භක සැසිවාරයේදී යුද්ධ හමුදාධිපති විසින් මෙම ජාතික ප්‍රයත්නයේ විෂය පථය පිළිබඳව පැහැදිලි කරමින් ජාතික ඉලක්ක කරා ළඟාවීමට සහ ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමේ අරමුණින් වගා කටයුතු සිදු නොකළ ඉඩම් කෘෂිකාර්මික කටයුතු සඳහා යොදාගනිමින් අනාගතයේදී ආහාර හිඟයක් ඇතිවීම වළක්වාගැනීම සඳහා යුද්ධ හමුදාවට කෘෂිකාර්මික අංශ සමග අත්වැල් බැඳගත හැකි ආකාරය පිළිබඳ නව කමිටුව දැනුවත් කරන ලදී.

මෙම ව්‍යාපෘතියේ පළමු අදියර වශයෙන් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ විශේෂඥයින්, ගොවිජන නිලධාරීන් සහ යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලයේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය පිළිබඳ දැනුමින් සමන්විත නිලධාරීන් සමග සාකච්ඡා කර දිවයින පුරා සේවයේ නියුතු යුද්ධ හමුදා භටපිරිස් විසින් එම රජයේ ඉඩම් එළිපෙහෙළි කිරීම, වගා කිරීම සහ තෝරාගත් බීජ වර්ග වගාකිරීම සඳහා පාත්ති සකස් කිරීම සිදුකිරීමට නියමිතව ඇත. ඒ වෙනුවෙන් මේ වනවිටත් යුද්ධ හමුදාව විසින් පාලනය කරනු ලබන ගොවිපලවල් 16 ක් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකායේ බළඇණි 6 ක් දිවයින පුරා ස්ථාපිත කර ඇත.




# ඔබ වෙනුවෙන්, රට වෙනුවෙන් මේ දුෂ්කර මොහොතේ අතැර නොයන හිතවත්කම...

අද වනවිට රටපුරා ඇති ඉන්ධන හල්වල පෝලිමක් නැති තැනක් සොයාගත නොහැකියි. ගෑස් සම්බන්ධවද එලෙසමයි. විශේෂයෙන්ම ඇතැම් අවස්ථාවලදී ප්‍රකෝපකාරී පිරිස්වල අරගල භූමි බවටද ඉන්ධන හල් පත්වෙලා. එවන් සංකීර්ණ වාතාවරණයක් තුළ ඒවායේ රාජකාරී සඳහා යොදවා ඇති හමුදා භටපිරිස්වලට පැවරී ඇත්තේ අසීමිත වගකීමක්. එවැනි සේවා සපයන තැන්වලට හමුදා සාමාජිකයින් රාජකාරීන්හි යොදවා ඇත්තේ ඒ වෙනුවෙන් ඉන්ධනහල් හිමියන් හා පොලිසිය දිගින් දිගටම සිදුකරන ලද ඉල්ලීම් සලකා බලාය. එසේම එවැනි සේවාවන් පවත්වාගෙන යාම සඳහා පවත්නා රජයට සහය වීම යුද්ධ හමුදාවේ මූලික වගකීමක්ද වෙනවා. විශේෂයෙන්ම මේ මට්ටමෙන් හෝ සිය සේවාවන් පවත්වාගෙන යාමට හැකිව ඇත්තේ එලෙස යුද හමුදාවේ ආරක්ෂාව ලබාදීම නිසා බැව් ඉන්ධනහල් හිමියන් නිරතුරු පවසන දෙයක්. අතලොස්සක් දෙනා කුමන චෝදනා නැගුවත් එමගින් කියවෙනුයේ යුද්ධයක් නොපැවතුනද යුද හමුදාවේ සේවය මෙවැනි දුෂ්කර අවස්ථාවලදී අත්‍යවශ්‍යම බව රටේ මහජනතාව පිළිගන්නා බවයි.





# සුහද හමුවීම්වල මතක සටහන්



ශ්‍රී ලංකා වෙරළ ආරක්‍ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ ජෙනරාල් රියර් අද්මිරාල් අනුර ඒකනායක ඉකුත් ජූනි 23 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ දී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ හමුවිය.

මෙම හමුවේදී වෙරළ ආරක්‍ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ ජෙනරාල් විසින් යුද්ධ හමුදාධිපති වෙත සිය සුබ පැතුම් පිරිනමමින් වෙරළාරක්‍ෂක හටපිරිස්හි කාර්යභාරයන් මෙන්ම එම දෙපාර්තමේන්තුව වෙතින් සැලසුම් කර ඇති ඉදිරි ව්‍යාපෘති පිළිබඳව යුද්ධ හමුදාධිපතිව දැනුවත් කරන ලදී.

ශල්‍ය වෛද්‍ය ක්ෂේත්‍රයේ අත්දැකීම් රසකින් පරිපූර්ණ ශ්‍රී ලංකාවේ ප්‍රවීණ ශල්‍ය වෛද්‍යවරයකු වන වෛද්‍ය ගාමිණී ගුණතිලක මහතා විසින් රචනා කරනු ලැබූ *"Extra Mile - A Surgeonzs Experience"* කෘතියේ මංගල පිටපත ඉකුත් ජූනි 21 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ දී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ වෙත පිළිගන්වනු ලැබීය. එම කෘතිය තුළින් වෛද්‍ය ගාමිණී ගුණතිලක මහතාගේ වසර 40 කට අධික වෘත්තීය දිවියේ ලද අත්දැකීම් පිළිබඳ විස්තර කරනු ලබයි.

ශල්‍ය වෛද්‍යවරයකු සහ කතුවරයකු වන වෛද්‍ය ගාමිණී ගුණතිලක මහතා සිය වෘත්තීය දිවියේ ලද අමතක නොවන මතකයන් ලේඛන කලාව තුළින් ඉස්මතු කර පෙන්වූ පසුබිම පිළිබඳ මෙම සුහද හමුවේදී යුද්ධ හමුදාධිපති විස්තර කරනු ලැබීය. පොළොන්නරුව දිසාරෝහලෙන් ආරම්භ වූ සිය වෘත්තීය දිවිය තුළ වගකීම් ඉටුකිරීමේදී අවශ්‍ය පහසුකම් සහ වෛද්‍ය උපකරණ නොමැතිව විවිධ දුෂ්කරතා හමුවේ ශල්‍ය වෛද්‍ය කටයුතු සිදුකිරීමේදී ලද අත්දැකීම් එම ක්ෂේත්‍රයේ නවක වෛද්‍යවරුන් වෙත ලබාදීමේ අරමුණ පෙරදැරිව මෙම ග්‍රන්ථය රචනා කළ බව ද එතුමන් වැඩිදුරටත් ප්‍රකාශ කරනු ලැබීය.



කීර්තිමත් ශල්‍ය වෛද්‍යවරයකු වශයෙන් දශක ගණනාවක් පුරාවට එතුමන් සිදුකළ කැපවීම මෙන්ම දිවයිනේ දුෂ්කර ප්‍රදේශ රැසක සේවය කරමින් අහිංසක රෝගීන් දහස් ගණනකගේ ජීවිත බේරාගැනීම වෙනුවෙන් එතුමන් දැක්වූ දායකත්වය වෙනුවෙන් යුද්ධ හමුදාධිපති විසින් වෛද්‍ය ගාමිණී ගුණතිලක මහතා වෙත එහිදී සිය ස්තුතිය පුදකරනු ලැබීය.



ගජබා රෙජිමේන්තුවේ සේවාමුක්ත හටසංගමයේ කීර්තිමත් ජ්‍යේෂ්ඨ නිලධාරීන් තිදෙනකු ඉකුත් ජූනි 22 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ගජබා රෙජිමේන්තු අධිපති සහ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ හමුවී එම රෙජිමේන්තුව සේවාමුක්ත හට සංගමය වෙතින් ඉදිරියේදී සිදුකිරීමට නියමිත කාර්යභාරය සහ ඒ වෙනුවෙන් සිදුකරනු ලබන සැලසුම් පිළිබඳව සාකච්ඡා කරනු ලැබූහ.

ගජබා රෙජිමේන්තුවේ සේවාමුක්ත හටසංගමයේ සභාපති ලුතිනන් කර්නල් දීපාල් සුබසිංහ (විශ්‍රාමික), එම සංගමයේ ලේකම් ලුතිනන් කර්නල් සීජේඑස් වීරකෝන් (විශ්‍රාමික) සහ භාණ්ඩාගාරික මේජර් සී ද සිල්වා (විශ්‍රාමික) යන නිලධාරීන් මෙම සුහද හමුව සඳහා එක්වූහ.

# නව යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී රාජකාරී අරඹයි

මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ඉකුත් ජූනි 08 වන දින හමුදා සම්ප්‍රදායානුකූලව පැවති උත්සවයකදී යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී ධුරයේ රාජකාරී භාරගන්නා ලදී. යුද්ධ හමුදාවේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියකු වන එතුමන් ශ්‍රී ලංකා පාබල හමුදාවේ රෙජිමේන්තු අධිපති ධුරය ද හොබවයි.

යුද්ධ හමුදාවේ මාණ්ඩලික ප්‍රධානී ධුරයේ රාජකාරී භාරගැනීමට ප්‍රථම එතුමන් බලසේනාධිපති, සේනාංකාධිපති තනතුරු ද ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ උපකරණ මාස්ටර් ජෙනරාල්, ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී වැනි සුවිශේෂී තනතුරු ද රාශියක් හොබවා ඇති පරිණත දක්ෂ නිලධාරියෙකි.





# යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී වෙත සිය මව් රෙජිමේන්තුවෙන් බුහුමන්



යුද්ධ හමුදාවේ 60 වැනි යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී ලෙස සිය ධුරයේ රාජකාරී ආරම්භ කළ මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ වෙත ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ ගෞරවාචාරය පුද කිරීමේ උත්සවයක් පසුගිය ජූනි 11 වන දින පනාගොඩ පිහිටි ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මූලස්ථාන පරිශ්‍රයේදී පැවැත්විණි. එහිදී, රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙත සපැමිණි මාණ්ඩලික ප්‍රධානී එම රෙජිමේන්තුවේ මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් ටීසීකේ පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් උණුසුම් අයුරින් පිළිගැනීමෙන් අනතුරුව එම  රෙජිමේන්තු භටපිරිස් විසින් හමුදා සම්ප්‍රදායානුකූල කඳවුරු මුරයක් හා සම්මාන පෙළපාළියක ගෞරවාචාරව එතුමන් වෙත පිරිනමනු ලැබීය.

අනතුරුව එම අවස්ථාව සනිටුහන් කරමින් නව යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී සිය රෙජිමේන්තු මධ්‍යස්ථානයේ නිලධාරීන් සමඟ සමූහ ඡායාරූපයකටද පෙනී සිටි අතර, පසුව රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයේ පිහිටි රණවිරු ස්මාරකය අභියසදී රට දැය වෙනුවෙන් දිවිපිදූ වීරෝදාර රණවිරුවන්ගේ අමිල කැපකිරීම සිහිපත් කරමින් ඔවුන් වෙත පුෂ්පෝපහාර පුදකරන්නටද අමතක නොකළේය. තවද, එම අවස්ථාවට සමගාමීව ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මූලස්ථාන පරිශ්‍රයේ පිහිටි නව ශ්‍රවණාගාරය, ආපනශාලා සංකීර්ණය සහ සෙසුනිල භෝජනාගාරය වෙත ගමන් කිරීම සඳහා ඉදිකරන ලද නව විදුලි සෝපානය විවෘත කිරීමද සිදුකෙරිණ.

# යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී රාජකාරී අරඹයි

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී ලෙස ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවට අයත් මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ඉකුත් ජූනි 16 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී රාජකාරී ආරම්භ කරන ලදී.

එම තනතුරේ රාජකාරී භාරගැනීමට ප්‍රථම හෙතෙම ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති ධූරය ද කොස්ගම පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක ධූරය ද, හෙබවූවේය. අත්දැකීම් සපිරි දක්ෂ නිලධාරියකු වූ එතුමන් අභිමානවත් ශ්‍රී ලංකා පාබල හමුදාවෙන් බිහිවූ නිලධාරියෙකි.





# ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක රාජකාරී අරඹයි



ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වෙච්ඡා බලසේනාවේ 49 වන සේනාවිධායක ලෙස මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ඉකුත් ජූනි 16 වන දින කොස්ගම පිහිටි ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථානයේදී රාජකාරී ආරම්භ කරන ලදී. හමුදා සම්ප්‍රදායානුකූල කඳවුරු මුරයේ සහ සම්මාන මුරයේ ගෞරවාචාරය පිරිනැමීමෙන් පසුව, නව සේනාවිධායක සිය සමාරම්භක දේශනය සිදුකරමින් ස්වේච්ඡා බලසේනාවේ ප්‍රමිතීන් තවදුරටත් ඉහළ නංවමින් ඵලදායී සේවයක නිරත වීම සිය අරමුණ බව අවධාරණය කළේය. එමෙන්ම, හිටපු සේනාවිධායකවරුන්, දිවංගත රණවිරුවන් සහ ක්‍රියාන්විතයේදී රණක්ෂිතයට පත් රණවිරුවන්ගේ සේවය ගෞරවයෙන් සිහිපත් කළ එතුමන් සේවයේ නියුතු සාමාජිකයින්ගේ කැපවීමද පැසසුමට ලක්කළේය.



# යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය සුබ මොහොතින් රාජකාරී අරඹයි

ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ 16 වන සභාපතිනිය ලෙස ජානකී ලියනගේ මහත්මිය ඉකුත් ජූලි 03 වන දිනට යෙදුණු සුබ මොහොතින් එම තනතුරේ රාජකාරී අරඹන ලදී.

මෙම අවස්ථාවට සහභාගී වූ සේවා වනිතා ඒකකයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකා ශිරෝමාලා කොඩිතුවක්කු මහත්මිය විසින් නව සභාපතිනිය සහ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ උණුසුම් අයුරින් පිළිගනු ලැබූහ. අනතුරුව බෞද්ධ චාරිත්‍රානුකූලව මහා සංඝරත්නයේ පිරිත් සජ්ඣායනා මධ්‍යයේ නව සභාපතිනිය සිය රාජකාරී අරඹන ලදී. එහිදී, සභාපතිනිය ඇතුළු යුද්ධ හමුදා සේවා වනිතා ශාඛාවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් යුද්ධ හමුදාධිපති සමඟ සමූහ ඡායාරූපයකට පෙනී සිටින්නටද අමතක නොකළේය.

**සේවා වනිතා සේවය හුදෙක් රණවිරු දිරිය හා සුබසාධනය පිණිස වුවද ඉන් ඔබ්බට විහිදුණු බොහෝ ක්ෂේත්‍රයන් කරා ඔවුන් සිය දායකත්වය සපයා ඇත. විටෙක බිරිඳක් ලෙසින්ද විටෙක සහෝදරියක්, මවක් ලෙසින්ද වූ එම මෙහෙවර වර්තමාන යුද්ධ හමුදාවට සුවිශාල ශක්තියක් එක්තැන් කොට ඇත්තේය. නව සේවා වනිතා සභාපතිනියගේ නායකත්වය හා මගපෙන්වීම යටතේ එකී මෙහෙවර තවදුරටත් පුළුල් වනු නොඅනුමානය.**




# යුද්ධ හමුදා සේවා වනිතා ශාඛාවෙන් බෝධි පූජා පිංකමක්





ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ 16 වන සභාපතිනිය ලෙස ජානකී ලියනගේ මහත්මිය පසුගිය ජුනි 03 වන දින යෙදුන සුබ මොහොතින් වැඩභාර ගත් අතර, එම අවස්ථාව සනිටුහන් කිරීම වස් ඒදින පස්වරුවේ බෙල්ලන්විල රාජමහා විහාරස්ථානයේදී බෝධි පූජා පිංකමක් පැවැත්විණි.

මෙම පිංකම සිංගප්පූරුවේ ප්‍රධාන සංඝනායක, කඩුගන්නාව පාරමිතා ජාත්‍යන්තර බෞද්ධ භාවනා මධ්‍යස්ථානාධිපති, අත්තිඩිය මාලිගාවත්ත පුරාණ විහාරය, දෙහිවල ප්‍රතිබිම්භාරාම විහාරය හා බෙල්ලන්විල රාජමහා විහාරයේ විහාරාධිපති ආචාර්ය බෙල්ලන්විල ධම්මරතන නාහිමි ඇතුළු මහා සංඝරත්නයේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. එම අවස්ථාවට සේවා වනිතා ඒකකයේ සාමාජිකාවන්, නිලධාරීන් හා සෙසුනිල 200 කට අධික පිරිසක් සහභාගී වූහ.




# සංඥා බලකා සේවා වනිතා ශාඛාව





හෘදයාබාධයක් හේතුවෙන් අභාවප්‍රාප්ත වූ 1 වන ශ්‍රී ලංකා සංඥා බලකායට අයත් සෙ/279704 මාණ්ඩලික සැරයන් දේශප්‍රිය ආර්ජීඑස්කේ ජෝංකොනොහි ගේ බිරිඳ වෙත පසුගියදා නව නිවසක් පරිත්‍යාග කෙරිණ. ඇය විසින් කරන ලද ඉල්ලීමකට අනුව සංඥා බලකායේ සේවා වනිතා සභාපතිනි සජීවනී පීරිස් මහත්මියගේ මැදිහත්වීමෙන් මෙම මානුෂීය කටයුත්ත සිදුකරන ලදී. නිවස භාරදීමේ අවස්ථාවට එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ රැසක්ද එක්වූහ.



# හරි දේ වුනත් පරිස්සමින් කරමු

1949 අංක 17 දරන යුද්ධ හමුදා පනතේ 23 සහ 23 ඒ වගන්ති අනුව ලාංකීය ජනතාවගේ හෝ ඔවුන්ගෙන් සැලකිය යුතු කොටසක ජීවිතයට ආහාර, ජලය, ඉන්ධන හා ආලෝකය වැනි අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ලැබීම වැළැක්වීමෙහිලා යම් ක්‍රියාවක් සිදුකර ඇති හෝ සිදු කිරීමේ තර්ජනයක් ඇති බව ජනාධිපතිට හැඟී ගියහොත් එවැනි අවස්ථාවක ජන ජීවිතයට අත්‍යවශ්‍ය සැපයීම් හා සේවාවන් පවත්වාගෙන යාම සඳහා මෙන්ම සිවිල් පරිපාලන රාජකාරි ඉටු කිරීම සඳහා යුද්ධ හමුදාවේ සමාජිකයන් හට අණ කළ හැකි බව සඳහන් වේ.

තවද වරින්වර සංශෝධිත 1947 අංක 25 දරන මහජන ආරක්ෂක ආඥා පනතේ 12 (1) වගන්තිය ප්‍රකාරව යම් ප්‍රදේශයක මහජන ආරක්ෂාවට තර්ජනයක් උද්ගත වී ඇති අවස්ථාවක හෝ උද්ගතවීමට ආසන්න අවස්ථාවක පොලීසිය ප්‍රමාණවත් නොවන බව ජනාධිපති විසින් තීරණය කරනු ලබන විටක සන්නද්ධ හමුදා හෝ කොටසක් යම් ප්‍රදේශයක මහජන සාමය පවත්වා ගෙන යාම සඳහා කැඳවිය හැකි වේ. ඒ අනුව ශ්‍රීලංකාවේ දැනට පවතින 1500 කට අධික ඉන්ධන පිරවුම්හල් සඳහා යුද්ධ හමුදාව රාජකාරීන්හි යොදවා ඇත්තේ එබැවිනි.

**පවතින ආර්ථික පීඩනය හමුවේ මිනිස්සු කුපිත වෙලා. පෙට්‍රල්වලට වඩා ඔවුන් "වහා ගිනි ඇවිලෙන සුළුයි". ඒ තත්වෙ නිවන්නනම් අධික ඉවසීමක් අධික විනයක් සහිත පිරිසක් ඕනෙමයි. අන්න ඒ නිසයි පෙට්‍රල් ෂෙඩ්වලට හමුදාව ඕන වුණේ.**

ඉන්ධනහල්වල රාජකාරි දැන් අපේ ජීවිතවලම කොටසක් ගානයි. ඒ තරමට ජාතික අවශ්‍යතාවය බලවත් වෙලා. නමුත් ඒක රට රකිනවාට වඩා අමාරුයි. අවි ඔසවන්න, බලය පාවිච්චි කරන්න තරම් හේතුවක් නැත්තෙ එතන පෙනෙන සතුරෙක් නැති නිසයි. ඉන්න සේරම අපේම අය. ඒ නිසා හැමදේම කරන්න වෙලා තියෙන්නෙ හරිම පරිස්සමට.

පවතින ආර්ථික පීඩනය හමුවේ මිනිස්සු කුපිත වෙලා. පෙට්‍රල්වලට වඩා ඔවුන් "වහා ගිනි ඇවිලෙන සුළුයි". ඒ තත්වෙ නිවන්නනම් අධික ඉවසීමක් අධික විනයක් සහිත පිරිසක් ඕනෙමයි. අන්න ඒ නිසයි පෙට්‍රල් ෂෙඩ්වලට හමුදාව ඕන වුනේ.

රටක විනය පවත්වා ගැනීම ආරක්ෂාවේම කොටසක්. ත්‍රස්තවාදීන් ඇතත් නැතත් රටක් සාමකාමීව සන්සුන්ව පවත්වාගෙන යාම හමුදාවේ වගකීමක්. හැබැයි පෙට්‍රල් ලැබෙන වෙලාව, ලැබෙන ප්‍රමාණය, ලැබෙන තැන අපට අදාළ නැහැ. හැබැයි ෂෙඩ්වල ආරක්ෂාව ඇතිව ඒවා ක්‍රමවත්ව බෙදන්න අවැසි වටපිටාව, හදන එකයි අපට පැවරිලා තියෙන්නෙ. ඉතින් රට යථාතත්වයට පත්වෙන තෙක් මේ අලුත් අභියෝගය අපි කොහොම හරි දිනන්න ඕනෙ. ඉන්ධන හල්වල විවිධ බලවේග මේ දවස්වල කරලියට ඇවිත් තියනව. පාතාලය ඇතුළු චන්ඩිකම් පෙන්වන කල්ලි කණ්ඩායම්, කපටි වංචාකාරයෝ, හොරු මේ හැම කෙනෙක්ම එතන. ඒ සියලු බලවේග මැද්දේ අහිංසක සාමාන්‍ය ජනතාවට අසාධාරණයක් නොවෙන තැනට අපි වගබලා ගන්න ඕනෙ.

මේ වෙලාවේ හමුදාව අකර්මන්‍ය වුනොත් මේ ඇවිලෙන ගිනි කොහෙන් නතරවෙයිද දන්නෙ නැහැ. සමහරු නම් කියනව හමුදාවට ගෙදර යන්න කියල. හමුදාව අවශ්‍යම නැති විදිහටයි ඔවුන් කතා කරන්නෙ. නමුත් ඒ අයටම විපතක් වුන වෙලාවට ඔවුන්ට විරුද්ධව බලවේගයක් ක්‍රියාත්මක වුනාම පිහිටට එන්නෙත් හමුදාව විතරමයි.

සමාජයේ ඕනෑම කෙනකුට ආරක්ෂාව සම්බන්ධව පැනනගින ගැටළුවලදී පිහිටට ඉන්න කෙනෙක් අවශ්‍යයි. අද හමුදාව කරන්න අන්න ඒ කාර්යභාරය. නිකමට හිතන්න හමුදාව නැති වුනොත් ඔබට විරුද්ධව කවුරු හරි ක්‍රියාත්මක වුනොත් ඔබට කාගෙ පිළිසරණක්ද. අනික හමුදාව කියන්නෙ කාගෙවත් දේශපාලන අතකොළුවක් නෙවෙයි. කවුරු ජනාධිපති වුනත් කවුරු ආණ්ඩු කළත් හමුදාවේ කාර්යභාරය වෙනස් වෙන්නේ නැහැ. අපි කරන කියන හැමදේම ජනතාව හා රට වෙනුවෙන් විතරමයි. ඒ හින්ද "හරි දේ වුනත් පරිස්සමින් කරමු".



# නිලාවේලි හිදී සිදුකරනු ලැබූ

# වීර ක්‍රියාව



**සෙ/කමා 553286 කෝප්‍රල්**
**නිලන්ත කුමාර එච්ච්**
**පිඩබ්ලිව්ව් ආර්එස්පි**
**කමාන්ඩෝ රෙජිමේන්තුව**



කුරුණෑගල පුරවරයේ මදුරාගම වාසය කළ එච්.ඒ. අනිල් කුමාර සහ ඩබ්ලිව්.ඒ. කරුණා යන පින්වත් යුවලට දාව 1980 නොවැම්බර් මස 20 වන දින උපත ලැබූ "හෙට්ටිආරච්චිලාගේ නිලන්ත කුමාර" මතු දිනක තම ජාතියෙහි පැවැත්ම උදෙසා දිවි පිදීමට නියමිතව තිබූ බව දැන සිටියේ ඔහුගේ දෛවය පමණි. වැඩිමහල් සොහොයුරියන් දෙදෙනකුගේ එකම සහෝදරයාවීම නිසාත් පවුලේ බාලයාවීම නිසාත් නිලන්තට පවුලේ සැමදෙනාගේම ආදරය සෙනෙහස නොඅඩුව ලැබුණි.

නිලන්ත අකුරු කළ පළමු තක්සලාව වූයේ ගිරිබාව මධ්‍ය මහා විද්‍යාලයයි. ඔහු අධ්‍යාපනයට පමණක් නොව ක්‍රීඩාවටද සුවිශේෂී දක්‍ෂතා පෙන්නුම්කොට ජයග්‍රහණ අත්කොට දී පාසලේ කීර්තිය ඔසවා තබන්නට සමත්විය. කොට්ඨාස තරඟවලදී වොලිබෝල්, ක්‍රිකට්, මළල ක්‍රීඩාවලින් ඔහු ලබාගෙන ඇති සහතික පත් ප්‍රමාණයද විශාලය.

නිලන්ත ගිරිබාව මධ්‍ය මහා විද්‍යාලයෙන් ඉවත්කොට ද්විතීයික අධ්‍යාපනය සඳහා ඉහළගම පිරිවෙනට දෙමව්පියන් විසින් යොමු කළේ ගුණ නැණ දෙකින් සමුපශෝභිත වූ පින්වත් පුතකු හදාගැනීමේ අරමුණෙනි. එහිදී, නිලන්ත පාරම්පරික පිරිවෙන් අධ්‍යාපනයේ උණුසුම ලබන්නටත්, වයෝවෘද්ධ, ගුණවෘද්ධ, තපෝවෘද්ධ, ශ්‍රේෂ්ඨ යතිවරයන් වහන්සේලාගේ ඇසුර ලබන්නටත් භාග්‍යසම්පන්න විය. නිලන්තගේ වසර ගණනාවක පිරිවෙන් අධ්‍යාපනය නිමාවට පත්වූයේ අපොස (සා/පෙළ) විභාගයට මුහුණදීමෙන් අනතුරුවය.

අධ්‍යාපන කටයුතුවලින් පසු නිලන්ත කඩවත ප්‍රදේශයේ සිය පියාගේ මිතුරකුගේ නිවසට

පැමිණෙන්නේ තම පවුලට බරක් නොවී ජීවත්වීම සඳහා සුදුසු රැකියාවක් සොයාගැනීමේ අධිෂ්ඨානශීලී බලාපොරොත්තුවෙනි. තාරුණ්‍යයේ ශක්තියත් රට ජාතිය කෙරෙහි නිසර්ගයෙන්ම තිබූ ඇල්මත් මැඩගැනීමට නොහැකි වූ නිසාවෙන්ම නිලන්ත යුද්ධ හමුදාවට එක්වීම සඳහා තම දෙමව්පියන්ගෙන් අවසර ඉල්ලා සිටියේය. පළමුව ඔවුන් ඒ සඳහා අකමැති වුවද තම ආදරණීය පුතාගේ ආශාවට පිටුපාන්නට ඔවුන්ට සිත් නොවීය.

දෙමව්පියන්ගේ අවසරය මත ඔහු මිටින් හළ කුරුල්ලකු මෙන් ගනේමුල්ල කමාන්ඩෝ රෙජිමේන්තු මූලස්ථානයේ පැවති සම්මුඛ පරීක්ෂණයට සහභාගී වී ඉන් සමත්ව 1999 ජුලි මස 21 වන දින ආධුනික සෙබළකු වශයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට එකතුවීමෙන් අනතුරුව ඌව කුඩාඔය කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසලෙන් මූලික පුහුණුව ලබාගනිමින් විනයගරුක යුද්ධ හමුදා සෙබළකු බවට පත්විය. තම දෙමව්පියන්ගේත්, යහළු යෙහෙළියන්ගේත් ඇසුර ලැබීමට ප්‍රිය වූ නිලන්ත විරුවා පුහුණුව අවසානයේ ලැබුණු පළමු නිවාඩුවේදී උපන්බිමට පැමිණීමට ද අමතක නොකළේය.

නිවාඩුව අවසානයේ නිලන්ත නැවත කඳවුර වෙත පැමිණෙන්නේ මහත් බලාපොරොත්තුවකින් සහ ස්ථිර වූ අධිෂ්ඨානශීලීත්වයෙන් ඔදවැඩුනු සිතිනි. මන්ද මීළඟට ඔහුට මුහුණදීමට තිබෙන්නේ අතිශය දුෂ්කර අභියෝගයකට බව ඔහු හොඳින් දන්නා නිසාවෙනි. ඔහු විශිෂ්ටයන් අතර විශිෂ්ටයන් බිහිකිරීමෙහිලා අතිදුෂ්කර පාඨමාලාවක් වන කමාන්ඩෝ තෝරාගැනීමේ පාඨමාලා අංක 49, 2001 ජනවාරි 31 වන දින සිට 2001 මාර්තු 09 වන දින දක්වා හදාරා එම පාඨමාලාව සාර්ථකව නිමාවට පත් කළේය. පුහුණුවෙන් අනතුරුව දින දහයක නිවාඩුවට ගමට පැමිණි නිලන්ත තුළ කායිකවූත් මානසිකවූත් විස්මයජනක වෙනසක් ඇතිවූ බව සැමදෙනාටම දැකිය හැකි විය.

අනතුරුව 2001 අප්‍රේල් මස 20 වන දින කමාන්ඩෝ උසස් පාඨමාලා අංක 30 ඇතුළත්ව එයද සාර්ථකව නිම කිරීමෙන් පසු 2001 ඔක්තෝබර් මස 17 දින නිලන්ත විරුවාට සුවිශේෂී දිනයක් උදාවිය. ඒ ලෝකයේ අතලොස්සකට පමණක් හිමිකම් කිවහැකි දුර්ලභ මෙරූන් හිස්වැසුම පැළඳ ඉදුරාම බඳවාගැනීම් අංක 18 යටතේ කමාන්ඩෝ රෙජිමේන්තුවේ නිත්‍ය සාමාජිකයකු ලෙස ප්‍රතිඥා දී කමාන්ඩෝ පවුලට එක්වීමේ භාග්‍යය උදාවීමයි. ඉන් අනතුරුව 2 වන කමාන්ඩෝ රෙජිමේන්තුවේ "ඒ" කණ්ඩායමට ඇතුළත්ව වැලිඔය නෙළුම් වැව ප්‍රදේශයෙන් සිය ප්‍රථම ක්‍රියාන්විත රාජකාරිය ආරම්භ කළේය.

කල්මඩු ප්‍රදේශය නිලන්තගේ දෙවන ක්‍රියාන්විත රාජකාරී ප්‍රදේශය වූ අතර, එහි රාජකාරියේ නිරතව සිටියදී මහනුවර පැවති විදුලි සංග්‍රාමික පාඨමාලාව 2003 ඔක්තෝබර් මස 17 වන දින සිට 2003 නොවැම්බර් මස 08 වන දින දක්වා සාර්ථකව නිමකොට නැවත තම කණ්ඩායමට එකතු විය. කමාන්ඩෝ සෙබළකු සතුවිය යුතු රණකාමීත්වයත්, විනයත්, චිත්ත ධෛර්යයත් මනාව ප්‍රගුණ කළ නිලන්ත තම කණ්ඩායමේ අණදෙන නිලධාරී සහ සහෝදර සෙබළුන් අතර "ගෝරා" යන අනුවර්ත නාමයෙන් ප්‍රකටව සිටියේය. නිලන්ත තම අසල්වැසි නිවසේ පදිංචිව සිටි වඩිග ආරච්චිලාගේ මල්කාන්ති නම් සුන්දර යුවතිය සමඟ ඇතිකර ගත් ආදර සම්බන්ධය මත දෙපාර්ශ්වයේම දෙමාපියන්ගේ ආශීර්වාද ලැබීමෙන් පසු යුගදිවියට එළඹියේ තම සේවා කාලය වසර පහක් සම්පූර්ණ කිරීමෙන් අනතුරුවය.

ඉන්පසු, කලාඔය කොමිෂන් නොලත් නිලධාරී පුහුණු පාසල වෙතින් කොමිෂන් නොලත් නිලධාරී නායකත්ව පාඨමාලාව



2004 මැයි මස 31 වන දින ආරම්භ කර 2004 ජුලි මස 09 වන දින එය සාර්ථකව නිමාවට පත් කළේය. මේ කාලවකවානුව නිලන්ත විරුවාගේ රාජකාරී දිවියේ ඉතා වැදගත් වූත් සුවිශේෂී වූත් සංධිස්ථානයක් ලෙස සැලකිය හැකිය. ඒ, ඔහු තම යුද්ධ හමුදා දිවිය තුළ එතෙක් සිදුකළ නොකැලැල් විශිෂ්ට සේවය නිසා ඔහු නිල උසස් කිරීම් සඳහා සුදුසුකම් ලැබීමය. ඒ අනුව සාමාන්‍ය සෙබළ නිලන්ත කුමාර ලාන්ස් කෝප්‍රල් නිලය දක්වා උසස්වීම් ලැබීමට භාග්‍යවන්ත විය. තමන්ට පැවරුනු රාජකාරිය අකුරටම ඉටුකිරීමේ මනා හැකියාවක් නිලන්තට පැවතුණි. ඒ නිසාම ඔහු යුද්ධ හමුදා කමාන්ඩෝ රෙජිමේන්තුවේ දිගුදුර විමර්ශන කණ්ඩායමක් වෙත තේරී පත්වූයේ නිතැතිනි. ඒ සඳහා අවශ්‍ය පුහුණු පාඨමාලාව 2006 අප්‍රේල් මස 26 වන දින අරඹා 2006 ඔක්තෝබර් මස 26 වන දින අතිශය සාර්ථක අන්දමින් නිමාවට පත් කළේය. අනතුරුව දිගුදුර විමර්ශන සෙබළකු ලෙස විසිර ගිය "ගෝරා" 3 වන කමාන්ඩෝ රෙජිමේන්තුවේ "ඉසෙඩ්" කණ්ඩායමට එක්වී සිය රාජකාරී නව මුහුණුවරකින් ආරම්භ කළේය.

බිරිඳකගේ ජීවිතයේ වාසනාවන්තම දිනය පිළිබඳව මල්කාන්ති සිහින මවමින් සිටියාය. එකී සිහිනය යථාර්ථයක් බවට පත්කරමින් වැඩි දවසක් ගතවීමට පෙර මල්කාන්ති උතුම් වූ මව් පදවිය ලැබුවාය. මෙය නිලන්තගේ ජීවිතයට අපමණ ප්‍රීතියකුත් නව බලාපොරොත්තු රාශියකුත් ඇතිකළ අතර, ඔහු තම දියණියට අසීමිතව ආදරය කළේය. ඕ නමින් "කල්පනී චමෝද්‍යා පාරමී" නම් වූවාය.

මේ අතර මානුෂීය මෙහෙයුම සඳහා පසුබිම සකස් වෙමින් පැවතුනු අතර, "පිල්ලුමලෙයි" යුද්ධ හමුදා කඳවුරේදී ලබාදුන් නියෝගයට අනුව "ගෝරා" ප්‍රමුඛ ඛණ්ඩය විමර්ශන කටයුතුවල නිරත විය. ක්‍රියාන්විතය ආරම්භ කරමින් නරකමුල්ල, තොප්පිගල, සාම්පූර්, මාවිල්ආරු, වෙරුගල්ආරු වැනි ප්‍රදේශවල සිට සතුරු බලමුළු විනාශ කිරීම සඳහා "ගෝරා" ප්‍රමුඛ කණ්ඩායම අවශ්‍ය විටදී බිහිසුණු වෙඩි බලයෙන් ද සියුම්

> "දුවටත් මටත් මගේ මහත්තයා නැති පාළුව නිතරම දැනෙනවා. ඒත් එයා අපිත් එක්ක ඉන්නවා වගේ සමහර වෙලාවට දැනෙනවා. ඒත් රණවිරුවෙක් විදිහට එයා එවෙලේ ගත් තීරණය ගැන මම පසුතැවෙන්නෙ නෑ"
>
> \- බිරිඳ -



බුද්ධියෙන් ද ක්‍රියාත්මක වූයේ කමාන්ඩෝ දිගුදුර විමර්ශන සෙබළකුගේ හැකියාව කුමක්දැයි හඳුනාගෙනය.

ගුවන් හමුදාවට නිවැරදි සතුරු ඉලක්ක ලබාගැනීම සඳහා "ගෝරා" ප්‍රමුඛ කණ්ඩායමෙන් ලැබුණු දායකත්වය අතිවිශාලය. නරකමුල්ල ප්‍රදේශයේදී තම ජීවිතය පරදුවට තබමින් ඉතාම සූක්ෂම ලෙස සතුරන් අබිමුවට ගොස් කාලතුවක්කු ප්‍රහාර සඳහා නිවැරදි ඉලක්ක ලබාදීමෙන් අතිවිශාල සතුරන් ප්‍රමාණයක් විනාශයට පත්කිරීමේ කාර්යයට දායක වූයේ "ගෝරා" ප්‍රමුඛ කමාන්ඩෝ දිගුදුර විමර්ශන කණ්ඩායමයි. තොප්පිගල ක්‍රියාන්විතයට යනවිට "ගෝරා" කියා සිටියේ "අපි මේ වතාවේ තොප්පිගල උඩ ජාතික කොඩියත්, කමාන්ඩෝ කොඩියත් අනිවාර්යයෙන්ම ඔසවනවා" යන්නය. නිලන්ත කුමාර සෙබළා තොප්පිගල, සාම්පූර්, නරකමුල්ල, තෝප්පූර්, මාවිල්ආරු, එරාවූර් ප්‍රදේශවල පැවති ක්‍රියාන්විතයන්හි ද තම පූර්ණ සක්‍රිය දායකත්වය ලබාදීම අගයනුවස් ඔහු, **රණශූර, පූර්ණභූමි හා උතුරු නැගෙනහිර සංග්‍රාමික පදක්කම** යන ක්‍රියාන්විත පදක්කම්වලින් පුදනු ලැබීය.

යුද්ධ හමුදාව මේ වනවිට නැගෙනහිර ප්‍රදේශය හා විල්පත්තුව ප්‍රදේශය සතුරාගෙන් මුදවාගෙන වන්නි ප්‍රදේශයේ ඉතාමත් සීමිත බිම්කඩකට සතුරා කොටුකරගෙන සිටි අතර, එම ග්‍රහණයෙන් මිදීමට නම් ඔවුන් වටකරගෙන සිටින හමුදාවන්ගේ අවධානය වෙනතකට යොමු කළ යුතුවිය. මෙම කරුණ මුල්කරගනිමින් සතුරන් විසින් ඉතාමත් නින්දාසහගත ක්‍රියාකාරකම් සිදුකළේය. මෙය සිදුකරන ලද්දේ තමා යටතේ සිටින ඉතාමත් දක්ෂ සතුරු කණ්ඩායම් කිහිපයක් නැගෙනහිර පළාත, දකුණු හා ඌව පළාත්වල ඇතැම් ප්‍රදේශ වෙත පිටත්කර ඔවුන් මාර්ගයෙන් අහිංසක සිවිල් ජනතාව මරුමුවට පත්කරමින් පීඩාවට පත්කර රටේ දකුණු ප්‍රදේශයේ කැළඹිල්ලක් ඇතිකිරීමට නියෝග කිරීමෙනි. මෙම තත්වය හමුවේ මෙම කණ්ඩායම් කොටුකරගනිමින් ඔවුන් විනාශ කිරීම රටේ සාමාන්‍ය තත්වය ආරක්ෂා කරගැනීමට අතිශයින් වැදගත් විය. නමුත් ඉතාම විශාල ප්‍රදේශයක් පුරා කට්ටි පනිමින් සිටි කුඩා සතුරු ඛණ්ඩ කොටුකර ගැනීම ඉතාමත් දුෂ්කර මෙන්ම අපහසු කටයුත්තක් වූයෙන් මෙවැනි කටයුතු උදෙසා සංවිධානාත්මක ක්‍රියාන්විතයක් 2009 ජනවාරි මස 27 වන දින දියත්වූ අතර, නිලන්ත කුමාර එහි ක්‍රියාකාරී සාමාජිකයකු විය.

සිවිල් වැසියන් සිටින ප්‍රදේශ මගහරිමින් මෙම ඛණ්ඩය ඉතාමත් දුෂ්කර හා කටුක ගමනකින් පසු නිලාවෙලි ප්‍රදේශයේ තිබූ සතුරු කඳවුරු ආසන්නයට ළඟාවූහ. දින ගණනාවක් පුරා විමර්ශනය කිරීම් සිදුකරන ලද අතර, සතුරා සිටි ස්ථානය නිශ්චිතව තිරකරගැනීම සඳහා අවස්ථානුකූලව ඉතාමත් සූක්ෂම විමර්ශනයක් සිදුකර මෙම කඳවුර තුළ අධික සතුරන් ප්‍රමාණයක් සිටින බවත්, ඔවුන් සතු අවි අතුරින් ප්‍රබලතම අභියෝගයක් විය හැක්කේ එම්පීඑම්ජී අවිය බවත් තිරකරගත්තේය.

කෙසේ හෝ සතුරු කඳවුර විනාශ කිරීම "ගෝරා" සිටි කණ්ඩායමේ ඒකායන අරමුණ විය. ඒ අනුව ක්ෂණිකව සැලසුම් කර එය විනාශ කිරීමේ මෙහෙයුම ක්‍රියාත්මක කරන ලද අතර, ඔවුන් බලාපොරොත්තු වූ පරිදිම සතුරා විසින් එම්පීඑම්ජී අවි යොදා ගනිමින් දැවැන්ත ලෙස "ගෝරා" සිටි කණ්ඩායම වෙත ප්‍රහාර එල්ල කිරීමට පටන් ගැනිණි. එනමුත් උපක්‍රමශීලී ලෙස භූමියේ ඇති ආවරණ උපයෝගී කර "ගෝරා" ඇතුළු කණ්ඩායම සතුරා වෙතද උපරිම ලෙස ප්‍රහාර දියත් කළේය.


සතුරු ප්‍රහාරද දිගින් දිගටම තීව්‍ර විය. එම්පීඑම්ජී අවියේ ප්‍රබල වෙඩි ප්‍රහාරයෙන් ගස්වල අතු කැඩී බිම වැටුණි. මෙම ප්‍රහාරය හමුවේ තම කණ්ඩායමට ඉදිරියට යාම අපහසු බව තේරුම්ගත් "ගෝරා" එම අවිය සතු සතුරා කෙසේ හෝ විනාශකර මෙහෙයුම ඉදිරියට ගෙනයාමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වී සතුරා විසින් එම්පීඑම්ජී වෙඩි ප්‍රහාර දියත් කරන ස්ථානය වෙත උපක්‍රමශීලීව සමීප විය. මේ වනවිටත් සතුරු ප්‍රහාරය තම කණ්ඩායම වෙත දැඩි ලෙස එල්ල වෙමින් පැවතුණි. "ගෝරා" ගේ අරමුණ වූයේ තම සහෝදර සගයන්ගේ ජීවිත ආරක්ෂාවත් ක්‍රියාන්විතය සාර්ථක කරගැනීමත් පමණි. ඒ අනුව නැගී සිටි ප්‍රතාපවත් පරහිතකාමී, අධිෂ්ඨානශීලී, රණකාමී තරුණයා තම මමත්වය පසෙකලා සතුරු ප්‍රහාර හමුවේ එම බංකරය වෙත ගොස් එම්පීඑම්ජී අවිය ක්‍රියාත්මක කර සතුරා වෙත ප්‍රහාරයක් එල්ල කරනුයේ විස්මිත අයුරිනි. එයත් සමගම සතුරු ප්‍රහාරවල ප්‍රබලත්වය හීන වන්නට විය. එම්පීඑම්ජී අවිය සහ එය ක්‍රියාත්මක කළ සතුරා විනාශකර තම සහෝදර කණ්ඩායමට ඉදිරියට ඇදෙන්නට මංපෙත් විවරකරදුන් මෙම විරෝදාර රණවිරුවා හට සැඟව සිටි සතුරකුගේ මාරාන්තික වෙඩි වරුසාවකට ගොදුරු වන්නට සිදුවිය. එම සතුරු ප්‍රහාරය හමුවේ "ගෝරා" තම අවසන් සුසුම් පොද වාතලයට මුසුකරන්නේ තම කණ්ඩායමේ අනෙකුත් සගයන් හට ක්‍රියාන්විතය සාර්ථකව නිමකිරීමට අවකාශය සලසා දෙමිනි.

සතුරු මර්මස්ථානය විනාශ කිරීමේ ක්‍රියාන්විතයේදී නිලාවෙලි අත්පත් කරගැනීමේ සටනේදී සතුරා අත තිබූ බලවත්ම අවියක් වූ එම්පීඑම්ජී අවිය සහ එය ක්‍රියාත්මක කරන ත්‍රස්තවාදියා විනාශ කිරීම පිණිස ස්වේච්ඡාවෙන්ම ඉදිරිපත් වී සතුරු වෙඩි වරුසා මැදින් ඉදිරියට ගොස් එම ත්‍රස්තවාදියා හා අවිය විනාශ කර තම සහෝදර සෙබළුන් ආරක්ෂා කරමින් ක්‍රියාන්විතය සාර්ථක කරගැනීමේ වීරක්‍රියාව අරබයා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී

ජනරජයේ ජනාධිපති සහ සන්නද්ධ සේවාවන්හි සේනාධිනායක ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් 2013 ජූලි මස 15 වන දින අරලියගහ මන්දිරයේදී මෙම වීරෝදාර රණවිරුවා පරම වීර විභූෂණයෙන් පිදුම් ලැබීය.

මෙම රණවිරුවාගේ බිරිඳ වන වඩිගආරච්චිලාගේ මල්කාන්ති මහත්මිය 2006 දෙසැම්බර් මස 12 වන දින කුරුණෑගල මහ රෝහලේදී බිහිකරනු ලැබූ මෙම දෙපලගේ එකම දියණිය වන එච්.ඒ. කල්පනී වමෝදා පාරමි දියණිය සමග අංක 62/ඒ/6, ගලහිටියාව, ගනේමුල්ල ලිපිනයේ දැනට පදිංචි වී සිටින අතර, දියණිය ගලහිටියාව හේමමාලි මහ විද්‍යාලයේ 8 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබයි.

*යුද්ධ හමුදා මූලස්ථානය මගින් ප්‍රකාශිත "උත්තමාචාරය" ග්‍රන්ථයෙන් උපුටා ගැනීමකි.*




# ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාල පාඨමාලා අංක 16







ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ පාඨමාලා - අංක 16 සහ භකාස පුහුණු පාසලේ පාඨමාලා අංක 08 හි දේශීය හා විදේශීය නිලධාරීන් සහ නිලධාරිනියන් සඳහා ඉතා වැදගත් අභ්‍යාසයක් වන සේනාංක පාලන ප්‍රදේශය (*Divisional Administrative Area (DAA)*) නිදර්ශනය ඉකුත් ජූනි 07 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර), ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) සහ භකාස ඒකකයන්හි ඉතා සාර්ථකව පවත්වන ලදී.

ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් කේඩබ්ලිව්එස් රත්නායක එන්ඩියූ ගේ පූර්ණ මගපෙන්වීම යටතේ මූලස්ථාන මාණ්ඩලික නිලධාරීන් හා භකාස ඒකක අණදෙන නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පැවති මෙම නිදර්ශනයට මාණ්ඩලික විද්‍යාල පාඨමාලා අංක 16 හි නිලධාරීන් සහ නිලධාරිනියන් 78 දෙනකුද භකාස පුහුණු පාඨමාලා අංක 08 හි දෙස් විදෙස් නිලධාරීන් සහ නිලධාරිනියන් 31 දෙනකුද සහභාගී වූහ.

එම අවස්ථාව නිරීක්ෂණය කිරීම සඳහා ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ සේනාවිධායක මේජර් ජෙනරාල් අයිඑච්එම්එන්එන් හේරත් ආර්එස්පී යූඑස්පී පීඑස්සී, භකාස අණසක පුහුණු පාසලේ සේනාවිධායක බ්‍රිගේඩියර් ඊඑම්එම් ප්‍රනාන්දු ඒඒටීඕ එල්එස්සී සහ ප්‍රධාන උපදේශකවරුද එක්වූහ.

# එස් නාගරත්නම් අනුස්මරණ ශූරතා කුසලාන ක්‍රිකට් තරඟාවලිය




ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති ගේ උපදෙස් පරිදි ප්‍රදේශයේ තරුණ ප්‍රජාව අතර සුහදත්වය හා අන්‍යෝන්‍ය සම්බන්ධතාවය වර්ධනය කිරීමටත්, ඔවුන්ගේ ක්‍රීඩා කෞශල්‍යය නංවාලීමත් අරමුණු කර ගනිමින් සංවිධානය කෙරුණු එස්. නාගරත්නම් අනුස්මරණ ශූරතා කුසලාන සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලිය ඉකුත් ජූනි 04 වන දින මයිලඩි තෛයිඩ්ඩි ස්ටාර් ස්පෝර්ට් ක්‍රීඩාංගණයේදී පැවැත්විණ.

මෙම සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟය සඳහා මයිලඩි තෛයිඩ්ඩි ස්ටාර් ස්පෝර්ට් ක්‍රීඩා සමාජය හා කෝප්පායි පැල්මයිරා ක්‍රීඩා සමාජය අතර පැවැත්වූ අතර, එහිදී කාසිය වාසිය දිනාගත් පැල්මයිරා ක්‍රීඩා සමාජය ප්‍රථමයෙන් පන්දුවට පහරදෙමින් නියමිත පන්දුවාර 12 අවසානයේ කඩුලු 08 ක් දැවී ලකුණු 79 ක් ලබාගන්නා ලදී. පිළිතුරු ඉනිම ක්‍රීඩා කළ තෛඩ්ඩි ස්ටාර් ස්පෝර්ට් ක්‍රීඩා සමාජය පන්දුවාර 09 යි පන්දු 04 ක් තුළ එක් කඩුල්ලක් පමණක් දැවී ලකුණු 85 ක් රැස් කරමින් තරඟයේ ජයග්‍රහණය වාර්තා කළේය. මෙම අවස්ථාවට ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, 51 සහ 52 වන පාබල සේනාංකයන්හි සේනාංකාධිපතිවරු, තෙලිප්පලෙයි ප්‍රාදේශීය ලේකම්, එස් නාගරත්නම් මහත්මිය ඇතුළු ප්‍රදේශවාසීන් විශාල පිරිසක් සහභාගී වූහ.

# ලෝක පරිසර දිනය වෙනුවෙන් අර්ථවත් වැඩසටහනක්



ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති ගේ උපදෙස් පරිදි ඉකුත් ජූනි 05 වන දිනට යෙදී තිබූ ලෝක පරිසර දිනට සමගාමීව යාපනය අර්ධද්වීපයේ වැඩසටහන් රැසක් සංවිධානය කරන ලදී. පරිසරයට හානිදායක වූ ප්ලාස්ටික්, පොලිතීන් හා වෙනත් අපද්‍රව්‍යයන්ගෙන් අපවිත්‍රව තිබූ මුහුදු තීරයේ ස්ථාන කිහිපයක් යුද්ධ හමුදා භටපිරිස් හා ප්‍රදේශවාසී ජනතාව සමග එක්ව පිරිසිදු කරන ලද අතර, එදින රුක් රෝපණ වැඩසටහනක් හා සිවිල් ජනතාව වෙත පොල් පැළ බෙදාදීමද සිදුකරන ලදී.

# යුද්ධ හමුදා පැරෂුට් භටයින් උඩුගුවනේ දස්කම් දක්වමින්





අම්පාර, උහන ගුවන් හමුදා කඳවුරේ පැවති පැරෂුට් පුහුණු සැසියකදී මෙරට ප්‍රථම වරට පැරෂුට් (canopies) 11 ක් උඩු ගුවනේ පෙළගස්වා විවිධ සංදර්ශන ඉදිරිපත් කරමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා පැරෂුට් භටයින් වර්ණවත් පැරෂුට් සංදර්ශණයක් ඉදිරිපත් කරන ලදී. මෙම පැරෂුට් කණ්ඩායමට කමාන්ඩෝ බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩබ්එම්එන් හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, කර්නල් එස්පී වික්‍රමසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී, මේජර් ඒඑන් අධිකාරි ආර්ඩබ්ලිව්පී යූඑස්පී පීඑස්සී, මේජර් වයිඑම්එන්ටී කුලතුංග ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී, මේජර් ඩබ්ලිව්පී සඳරුවන් ආර්එස්පී පීඑස්සී, බලලත් නිලධාරී II සේනාරත්න අයිපීඩීඑන්, මාණ්ඩලික සැරයන් සමන් කුමාර අයිජීඑ, මාණ්ඩලික සැරයන් ගුණවර්ධන ආර්ඩීඩී, සැරයන් කැලුම් එස්ආර්එන්, සැරයන් බණ්ඩාර එල්ආර්එන් සහ කෝප්‍රල් බණ්ඩාර බීඒපීජේපී යන නිලධාරීන් සහ කොමිෂන් නොලත් නිලධාරීන් ඇතුළත් වූහ.

# හිසට සෙවණක්



17 වන ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළු බලප්‍රදේශයේ ජයනගර් හි පදිංචි කැලුම් ත්‍රිශාන්ත දුමින්ද පිරිස් යන අය හට නව නිවසක් ඉදිකර භාරදීම ඉකුත් ජූනි 07 වන දින ආරක්‍ෂක සේනා (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් ජීආර්ආර්පී ජයවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ. ඕස්ට්‍රේලියාවේ පදිංචි ජයසංක පෙරේරා සහ මධුෂා පෙරේරා යන මහත්ම මහත්මීන්ගේ මූල්‍ය දායකත්වය මත 17 වන ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළු භටපිරිස්හි ශ්‍රම දායකත්වයෙන් මෙම නිවස ඉදිකෙරිණ. මෙම අවස්ථාවට 22 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීඩබ්ලිව්එම්ආර්එස්පී අලුවිහාරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, 221 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් එස්වියූඑ සේලංගආරච්චි ආර්එස්පී පීඑස්සී, 17 වන ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුවේ අණදෙන නිලධාරී මේජර් පීජීඑල් හේමකුමාර ඇතුළු පිරිසක් සහභාගී වූහ.



# පොසොන් පොහොය නිමිත්තෙන් දන්සැලක්





ආරක්‍ෂක සේනා ආඥාපති (නැගෙනහිර) මේජර් ජෙනරාල් ජීආර්ආර්පී ජයවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ මගපෙන්වීම මත එම ආරක්ෂක සේනා මූලස්ථානයේ හටපිරිස් විසින් ඉකුත් ජූනි මස 14 වන දින වැලිකන්ද නගරයේදී මඤ්ඤොක්කා සහ කොස් දන්සැලක් සංවිධානය කරන ලදී. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්‍ෂක සේනා (නැගෙනහිර) ආඥාපති සහ එම මූලස්ථානයේ අනෙකුත් ජ්‍යේෂ්ඨ නිලධාරීන් සෙසුනිලයින් සහභාගී වූහ. මෙම දන්සැල සඳහා ප්‍රදේශවාසීන් විශාල පිරිසක් එක්රොක් වූහ.

# පොසොන් පොහොයට කොස් දන්සැලක්






පසුගිය පින්බර පොසොන් පොහෝ දිනය නිමිත්තෙන් 6 වන කාරක රෙජිමේන්තුව ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ අණදෙන නිලධාරීගේ උපදෙස් සහ මගපෙන්වීම මත එහි හටපිරිස් විසින් කොස් දන්සැලක් සංවිධානය කරනු ලැබූහ. මෙම දන්සැල සඳහා පනාගොඩ, හබරකඩ ප්‍රදේශයේ වෙසෙන සිවිල් වැසියන් විශාල පිරිසක් සහභාගී වූහ.

# දිගු දුර මුර සංචාර පාඨමාලාවක සාර්ථකව සමාප්ත කෙරේ

දහසයවන දිගුදුර මුර සංචාර පාඨමාලා නිල ලාංඡන පැළඳවීමේ උත්සවය ඉකුත් මැයි 27 වන දින වවුනියාව කමාන්ඩෝ බලසේනා මූලස්ථාන පරිශ්‍රයේදී සිදුකරන ලදී. නිලධාරීන් දෙදෙනකු සහ සෙසුනිලයින් 39 දෙනකු වෙත එහිදී ලාංඡන පැළඳවිණ. එම උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 1 වන බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඒකේජීකේයූ ඥානරත්න එන්ඩීසී පීඑස්සී සහභාගී විය. මෙහිදී, පාඨමාලාව හදාරනු ලැබූ නිලධාරීන් සහ සෙසුනිලයින් සඳහා දිගුදුර මුර සංචාර පිහිද ප්‍රදානය කරන ලදී. එම පාඨමාලාවේ දක්ෂතම ශිෂ්‍යයා ලෙස කපිතාන් ටීබීටීඑන් රූපසිංහ ද, A101 කණ්ඩායමේ දක්ෂතම කණ්ඩායම ලෙස 8 වන කණ්ඩායම ද දක්ෂතම මඟපෙන්වන්නා ලෙස ලාන්ස් කෝප්‍රල් පුෂ්පකුමාර බීජී ද දක්ෂතම වෙඩික්කරු ලෙස ලාන්ස් කෝප්‍රල් පෙරේරා කේඑන්ඩී ද සම්මාන ලබාගත්හ. මෙම පාඨමාලාව වෙනුවෙන් කරන ලද අමිල සේවය අගයමින් මේජර් ජෙනරාල් කේඒ සමරසිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී සහ බ්‍රිගේඩියර් ඩීඑන්ජේ ප්‍රනාන්දු ආර්එස්පී යූඑස්පී වෙත ද එහිදී විශේෂ සමරු තිළිණ ප්‍රදානය කෙරිණ.





# වෙසක් පුන් පොහෝ දින පින්කම් රැසක්





1 වන බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඒකේජීකේයූ ඥානරත්න එන්ඩීසී පීඑස්සී ගේ මගපෙන්වීම යටතේ එම බලකායේ රාජකාරී නියුතු හටපිරිස් විසින් වෙසක් පුර පසළොස්වක පොහොය නිමිති කොටගෙන වැඩසටහන් මාලාවක් සංවිධානය කරන ලදී. එයට සමගාමීව එදින උදෑසන කිලිනොච්චි ඉරණමඩු ප්‍රදේශයේ ශාන්තිපුරම් ගම්මානයේ අඩු ආදායම්ලාභී පවුල් 100 ක් සඳහා වියළි සලාක මළු බෙදාදීමේ වැඩසටහනක් පැවැත්විණ. එහිදී, කිලිනොච්චි ලුම්බිණි විහාරාධිපති ඉංගිරියේ ධර්මාලංකාර නාහිමිපාණන් විසින් 1 වන බලකායේ රාජකාරී නියුතු නිලධාරීන් සහ සෙසුනිලයින් සඳහා සෙත් පැතීම සහ බෝධි පූජා පිංකමක් සිදුකරන ලදී. තවද, 11 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ හටපිරිස් විසින් ඉරණමඩු මංසන්ධියේ නිර්මාණය කරන ලද දර්ශනීය වෙසක් පහන් කූඩුවක් ද 1 වන බලකායේ බ්‍රිගේඩියර් (පාලන/හකාස) විසින් එදින සන්ධ්‍යාවේ විදුලි පහන් දල්වා විවෘත කළ අතර, 1 වන බලකායේ මාර්ගය දෙපස සහ එම මූලස්ථාන පරිශ්‍රයේ තවත් වෙසක් කූඩු රැසක් ද ප්‍රදර්ශනය කරන ලදී.

# දිළිඳු පවුල් වෙත සහන





ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩබ්ලිව්එච්එස් වනසිංහ ආර්ඩබ්ලිව්පී වයිඑස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් 682 වන පාබල බලසේනා බලප්‍රදේශයට අයත් සිවිල් ජනතාව සඳහා වියළි සලාක මළු සහ අතිරේක ආහාර වේලක් ලබාදීමේ ප්‍රජා සත්කාරක වැඩසටහනක් ඉකුත් ජූනි 11 වන දින පැවැත්විණ.

ඒ අනුව මු/මාතලන් රෝමානු කතෝලික දමිළ මිශ්‍ර පාසලේ දූ දරුවන් 41 දෙනකු වෙත අතිරේක ආහාර වේලක් සහ එම ප්‍රදේශයේ ජීවත්වන දිළිඳු පුද්ගලයින් 175 දෙනකු සඳහා වියළි සලාක මළු පරිත්‍යාග කෙරිණ. මෙම පරිත්‍යාගයන් සඳහා තලගල ශ්‍රී සිද්ධාර්ථ පදනම, *Tan Ngak & Kee Meng Leng Fountion Limited (Singapore)*, පිටින් පෙලේස් මාතලේ හා *JSBCLLC* ඩුබායි සමාග මේ අධිපති ප්‍රගලිත පුෂ්පකුමාර මහතා විසින් මූල්‍ය දායකත්වය ලබාදුන් අතර, කළුතර ශාසනාරක්ෂක බල මණ්ඩලයේ මෙහෙයවීමෙන් මෙම පරිත්‍යාගයන් ලබාදීම සිදුකෙරිණ.





මුලතිව් දිස්ත්‍රික්කයේ සිවිල් හමුදා සහයෝගීතාව ඉහළ නැංවීම සඳහා ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩබ්ලිව්එච්එස් වනසිංහ ආර්ඩබ්ලිව්පී වයිඑස්පී එන්ඩියූ ගේ අදහසකට අනුව අසරණ පවුල්වල දරුවන්ගේ අධ්‍යාපනයට උපකාර කිරීමක් වශයෙන් මු/උදයාර්කට්ටු මහා විද්‍යාලයේ දුවා දරුවන් හට පාසල් පාවහන් ප්‍රදානය කිරීමේ වැඩසටහනක් පසුගියදා සිදුකෙරිණ. 68 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ගේ සහ 681 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ගේ මගපෙන්වීම සහ අධීක්ෂණය යටතේ 6 වන ගැමුණු හේවා බළඇණිය සහ 9 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව විසින් මෙම උත්සවය සංවිධානය කරන ලදී.

# ජාතික වෙසක් උත්සවයේ ජයග්‍රාහකයින් හට ත්‍යාග පිරිනමයි





ජාතික වෙසක් උත්සවය ඉකුත් මැයි 15 වන දින සිට 21 දින දක්වා යුද, නාවික සහ ගුවන් හමුදා සහභාගීත්වයෙන් පුරාණ කුරගල රජමහා විහාරස්ථානයේදී පැවැත්විණි. මෙම තරගය සඳහා යුද්ධ හමුදාව සමඟ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පක්ෂාන්ගනයන් හතරක් හා නාවික හමුදා විධානයන් පහක් සහභාගී විය. එහිදී ගුවන් හමුදාවේ පක්ෂාන්ගනයන් හතර අතුරින් සිවිල් ඉංජිනේරු පක්ෂාන්ගනය හා නාවික හමුදා විධානයන් පහ අතුරින් බටහිර නාවික විධානය ද ප්‍රථම ස්ථාන හිමිකරගන්නා ලදි.

ඒම ජයග්‍රහණ සඳහා ත්‍යාග ප්‍රධානය කිරීම ආරක්‍ෂක සේනා (බටහිර) ආඥාපති සහ යුධ හමුදා බෞද්ධ බලමණ්ඩලයේ සභාපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් මැයි 30 වන දින ආරක්ෂක සේනා මුලස්ථානයේදී සිදුකරන ලදි.

# පොසොන් දින රණවිරු ශීල සමාධි වැඩසටහනක්





2022 පොසොන් පොහොයට සමගාමීව ආරක්‍ෂක සේනා මූලස්ථානය (බටහිර), ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථානය සහ ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බලමුළුව එක්ව බෝධිරාජාරාම යුද්ධ හමුදා විහාරස්ථානයේ දී "සීල සමාධි" වැඩසටහනක් සංවිධානය කරන ලදී.

ආරක්‍ෂක සේනා (බටහිර) ආඥාපති සහ යුධ හමුදා බෞද්ධ බලමණ්ඩලයේ සභාපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ උපදෙස් සහ මඟපෙන්වීම මත සංවිධානය කෙරූ මෙම "සීල සමාධි" වැඩසටහන සඳහා යුද්ධ හමුදා සාමාජිකයින් සියයකට වැඩි පිරිසක් සහභාගී වූහ.

# ජන දිවියට සත්කාර





ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති ගේ මගපෙන්වීමෙන් බණ්ඩාරවෙල ප්‍රදේශයට ආසන්න පූනාගල ක්‍රේග්වත්ත ගම්මානයේ වෙසෙන ආර්ථික අපහසුතා ඇති පවුල් 100 ක් වෙත රුපියල් 5000.00 ක් වටිනාකමකින් යුත් වියළි සලාක බෙදාදීමේ සත්කාරයක් සිදුකෙරිණ. කැනඩාවේ පදිංචි ශ්‍රී ලාංකික ව්‍යාපාරික ප්‍රජාවගේ අනුග්‍රාහකත්වයෙන් රුපියල් ලක්ෂ 05 ක මුදලක් වැය දරා මෙම වැඩසටහන පසුගිය මැයි 26 වන දින ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් සිදුකරන ලදී. මෙම අවස්ථාවට පූනාගල ක්‍රේග්වතු අධිකාරී, ආරක්ෂක සේනා (මධ්‍යම) ප්‍රධාන සිවිල් සම්බන්ධීකරණ නිලධාරී ඇතුළු සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.



# වියළි සලාක මළු බෙදාදෙමින්




ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති ගේ මගපෙන්වීම හා සම්බන්ධීකරණයෙන් 2022 වර්ෂයේ වෙසක් මංගල්‍යය වෙනුවෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ අඩු ආදායම්ලාභී පවුල් 1400 ක් වෙත රුපියල් මිලියන 2.25 ක වටිනාකමකින් යුත් වියළි සලාක මළු බෙදාදීමේ වැඩසටහනක් පසුගිය මැයි 20 වන දින සිදුකෙරිණ. ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් සංවිධානය කළ මෙම වැඩසටහන සඳහා තලගල ශ්‍රී සිද්ධාර්ථ පදනමේ සහ Tan Ngak Bauy & Kee Meng lang Foundation Limited (Singapore) විසින් පූර්ණ දායකත්වය ලබාදෙන ලදී. මෙම වැඩසටහන සඳහා සුබෝධාරාමයේ විහාරාධිපති, ප්‍රදේශවාසීන් සහ ආසේමු (මධ්‍යම) සිවිල් සම්බන්ධීකරණ නිලධාරී ඇතුළු සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

# සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව



සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය ලෙස ඔමිලා ජයවර්ධන මහත්මිය ඉකුත් මැයි 23 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී සුබ මොහොතින් රාජකාරී අරඹන ලදී. මෙම අවස්ථාවට ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ රැසක් ද එක්වූහ.

# සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාව





සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි මනෝරි සලේ මහත්මියගේ මගපෙන්වීම මත සංවිධානය කරන ලද "මා දකින සිංහල දමිළ අවුරුද්ද" යන මාතෘකාව තේමා කරගත් චිත්‍ර තරගයක් කරන්දෙණිය සන්නද්ධ බුද්ධි බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී ඉකුත් අප්‍රේල් 30 වන දින පවත්වන ලදී. මෙම තරගාවලිය සඳහා රෙජිමේන්තුවේ සාමාජිකයින්ගේ දූවා දරුවන් සහභාගී වූ අතර, මූලික වටය ඒකක මට්ටමින් වයස් කාණ්ඩ තුනක් යටතේ දියත් කෙරිණ. එහිදී, මූලික වටයේ ජයග්‍රාහකයින් 27 දෙනකු සඳහා රුපියල් 2500.00 බැගින් වූ ත්‍යාග මුදල් ලබාදුන් අතර, ඉදිරියේදී පැවැත්වෙන අවසන් වටයේ ජයග්‍රාහකයින් සඳහා පිළිවෙලින් පළමු, දෙවන හා තෙවන ස්ථාන වෙත රුපියල් 7000.00, 5000.00 හා 3000.00 බැගින් මුදල් ත්‍යාග ලබාදීමට නියමිතය.

තවද, සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාව වෙතින් පසුගියදා මියගිය සහ ආබාධිත රණවිරුවන් හට සෙත්පතා අම්බලන්ගොඩ, පොල්වත්ත හි පිහිටි වරුසවිතාන වැඩිහිටි නිවාසය වෙත උදෑසන, දහවල් සහ රාත්‍රී දානය ලබාදීම එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි මනෝරි සලේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ. මෙම අවස්ථාවට එම සේවා වනිතා ශාඛාවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් රැසක් සහභාගී වූහ.

# ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාව




ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය ලෙස රුවිනි ලමාහේවා මහත්මිය ඉකුත් මැයි 13 වන දින සුබ මොහොතින් රාජකාරී අරඹන ලදී. මෙම අවස්ථාවට එම සේවා වනිතා ශාඛාවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් රැසක් ද සහභාගී වූහ.

# සේවා බලකා සේවා වනිතා ශාඛාව



යුද්ධ හමුදා සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය ලෙස තුෂාරි වනිගසේකර මහත්මිය පසුගියදා එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී සුබ මොහොතින් රාජකාරි ආරම්භ කළාය. මෙම අවස්ථාවට එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ රැසක් ද එක්වූහ.

# වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාව





වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාවේ අනුග්‍රහයෙන් සංවිධානය කෙරුණු ලේ දන්දීමේ වැඩසටහනක් කොළඹ යුද්ධ හමුදා රෝහල් ශ්‍රවණාගාරයේදී පසුගියදා පැවැත්විණ. එම අවස්ථාවට එම සේවා වනිතා ශාඛාවේ උප සභාපතිනි වෛද්‍ය නාමලී තිලකරත්න මහත්මිය ඇතුළු සාමාජිකාවන් හා යුද්ධ හමුදා රෝහලෙහි රාජකාරි නියුතු නිලධාරින් සහ සෙසුනිලයින් 300 ක පමණ පිරිසක් සහභාගී වූහ. තවද, එදින එම අවස්ථාවට සහභාගී වූ අයවලුන් වෙනුවෙන් ටී ෂර්ට් ලබාදීමටද කටයුතු කෙරිණ.

# විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාව




ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය යටතේ රාජකාරි නියුතු නිලධාරින්, සෙසුනිලයින්, සිවිල් සේවක මහතුන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් වෙනුවෙන් සංවිධානය කෙරුණු ජංගම අක්ෂි සායනයක් පසුගිය මැයි 23 වන දින කොස්ගම පිහිටි විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු වැඩපල දී පවත්වන ලදී. තවද, හේප්ප්ප් ශ්‍රී ලංකා ආයතනයේ අනුග්‍රාහකත්වයෙන් ඇස් කණ්ණාඩි බෙදාදීම ද හකාස අණසක මූලස්ථානයේ සේවයේ නියුතු සිවිල් සේවක මහතුන්ගේ පාසල් අධ්‍යාපනය හදාරනු ලබන දූවා දරුවන් වෙනුවෙන් පාසල් උපකරණ බෙදාදීමේ ප්‍රජාසත්කාරයක් ද ක්‍රියාත්මක කෙරිණ. මෙම වැඩසටහන හටකාර්ය සම්පාදන ආඥාපති මේජර් ජෙනරාල් එස්පීඒඅයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී හා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි නන්දනී සමරකෝන් මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

# යාන්ත්‍රික පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව





යාන්ත්‍රික පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව මගින් පසුගිය දිනට යෙදුණු පොසොන් පොහොය නිමිත්තෙන් ප්‍රථම වරට සංවිධානය කරනු ලැබූ මඤ්ඤොක්කා දන්සැලක් දඹුලුහල්මිල්ලෑව ආදර්ශ මහා විද්‍යාලීය ක්‍රීඩා පිටියේදී එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ධනූෂා වීරසූරිය මහත්මිය සහ යාන්ත්‍රික පාබල රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ.

# කෘෂිකර්ම හා පශු සම්පත් සේවා වනිතා ශාඛාව





කෘෂිකර්ම හා පශු සම්පත් සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ශාන්ති අබේසේකර මහත්මියගේ අදහසකට අනුව පසුගිය පොසොන් පොහෝ දින යක්කල පිහිටි "ලීලා විතාන වැඩිහිටි නිවාසය" වෙත වියළි සලාක පරිත්‍යාග කිරීමේ මාහැඟි සත්කාරයක් සිදුකරන ලදී. මෙම වැඩසටහනට යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකායේ බලකාධිපති මෙන්ම අධ්‍යක්ෂ ජෙනරාල් මූල්‍ය කළමනාකරණ මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීඑස්එම් අබේසේකර ආර්එස්පී යූඑස්පී ද සහභාගී විය. වැඩිහිටි සාමාජිකාවන් 30 දෙනකු නේවාසිකව සිටින එම නිවාසයේ දැනට පවතින අඩුපාඩු හා ඔවුන්ගේ අනෙකුත් අවශ්‍යතාවන් පිළිබඳවද එහිදී සොයා බැලිණ.

# යුද්ධ හමුදා පොදුසේවා බලකා සේවා වනිතා ශාඛාව





අපොස (සා/පෙළ) විභාගය සඳහා පෙනී සිටිනු ලබන සියලුම දූ දරුවන් වෙත ආශිර්වාදාත්මක බෝධිපූජා පින්කමක් පසුගිය මැයි 21 වන දින යුද්ධ හමුදා බෝධිරාජාරාමය පනාගොඩදී පවත්වනු ලැබීය. යුද්ධ හමුදා පොදුසේවා බලකා සේවා වනිතා ශාඛාව මගින් සංවිධායනය කරනු ලැබූ මෙම බෝධිපූජා පින්කම සඳහා පනාගොඩ යුද්ධ හමුදා ජනපදය තුළ පිහිටි රෙජිමේන්තු මධ්‍යස්ථාන හා ඒකක සාමාජිකයින්ගේ දූ දරුවන් සහභාගී වූහ. එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි එරංගා හේවාවසම් මහත්මියගේ ප්‍රධානත්වයෙන් සංවිධානය වූ මෙම පින්කම සඳහා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් රැසක් සහභාගී වූහ.

# සංචාරයක මතක සටහන්



සංඥා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් පීඒජේ පීරිස් එන්ඩීයූ ඉකුත් මැයි 29 වන දින 9 වන ශ්‍රී ලංකා සංඥා බලකායේ සංචාරයක නිරත විය. එම ඒකකයේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් බීඑම්එම්බී හේරත් ආර්එස්පී යූඑස්පී විසින් එහිදී බලකාධිපති උණුසුම් අයුරින් පිළිගන්නා ලද අතර, හමුදා සම්ප්‍රදායානුකූලව කඳවුරු සම්මාන මුරයක් ද ඔහු වෙත පිළිගන්වනු ලැබීය. මෙම සංචාරය අතුරතුරදී රුක් රෝපණයක්, ඒකක හටපිරිස් ඇමතීම, සියලු නිල තේ පැන් සංග්‍රහය සහ සමූහ ඡායාරූපයකට පෙනී සිටීමටද බලකාධිපති අමතක නොකළේය.

# සිසු සිසුවියන් හා ගුරුවරුන් වෙත දිවා ආහාර





64 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් යූපීආර් වීරකෝන් ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ උපදෙස් මත එම සේනාංක බලප්‍රදේශයේ අපොස (සා/පෙළ) විභාගය සඳහා පෙනී සිටින දුවා දරුවන් 236 දෙනකු හා ගුරුවරුන් 30 දෙනකු වෙත දිවා ආහාර පාර්සලය බැගින් ප්‍රදානය කෙරිණ. එහිදී, 64 වන පාබල සේනාංකය හා 641,642,643 වන පාබල බලසේනා ද 8 ශ්‍රීලංසිරෙ, 23 විපාරෙ හා 17 (සෙව්) ගරෙ යන ඒකක ද මෙම මාහැඟි කටයුත්තට මුල්විය.

# බැතිමතුන්ට විශේෂ දිවා භෝජන සංග්‍රහයක්





20 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරී ගේ අධීක්ෂණයෙන් සෙල්ල කතරගම කෝවිල් පූජා චාරිත්‍රයට සහභාගී වීම සඳහා යාපනයේ සිට පාගමනින් ගමන් කරන 57 දෙනෙකුගෙන් සමන්විත දමිළ බැතිමතුන් කණ්ඩායමකට විශේෂ දිවා භෝජන සංග්‍රහයක් පිරිනමන ලදී. 66 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති බ්‍රිගේඩියර් එස්ජේ ප්‍රියදර්ශන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ මගපෙන්වීමෙන් එම සත්කාරය සිදුකළ අවස්ථාව සඳහා 662 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්එම්එල්එස් දයාවංශ, 66 වන පාබල සේනාංකයේ සිවිල් සම්බන්ධීකරණ නිලධාරී ලුතිනන් කර්නල් එච්පීඩීජී විජේසේකර, 662 වන පාබල බලසේනාවේ සිවිල් සම්බන්ධීකරණ නිලධාරී ලුතිනන් කර්නල් එච්එම්යූඩී හේරත් ඇතුළු නිලධාරීන් සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

# යුද්ධ හමුදා ශ්‍රම දායකත්වයෙන් නිවාස පිරිනැමීමක්





මහනුවර දිස්ත්‍රික්කයේ තෙල්දෙණිය රංගල්වත්ත පේරු කොටමෙහි අඩු ආදායම්ලාභී පවුල් අතුරින් තෝරාගත් පවුල්වල අර්ධ නිවාස අංග සම්පූර්ණ නිවාස ලෙස ඉදිකොට ඔවුන් වෙත භාරදීම පසුගිය මැයි 24 වන දින සිදුකෙරිණ. ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ උපදෙස් මත එම බලප්‍රදේශයේ රාජකාරී නියුතු භටපිරිස්හි ශ්‍රම දායකත්වයෙන් සිදුකෙරුණු මෙම ව්‍යාපෘතිය සඳහා ව්‍යාපාරික ශ්‍රී මෝහණ ශංකර් මහතා මූල්‍ය දායකත්වය ලබාදෙන ලදී. මෙම අවස්ථාවට 111 වන සහ 112 වන පාබල බලසේනාවන්හි බලසේනාධිපතිවරු ඇතුළු නිලධාරීන් හා සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

# අන්තර් ඒකක පාපන්දු තරඟාවලියක්



ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති ගේ අදහසකට අනුව අන්තර් සේනාංක පාපන්දු තරඟාවලියක් පැවැත්වීමට සැලසුම් කොට ඇත. ඊට සමගාමීව 54 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් යුඩී විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී ගේ අධීක්ෂණය යටතේ අන්තර් ඒකක පාපන්දු තරඟාවලියක් එම පාබල සේනාංකය යටතේ ඇති ඒකකවල සහභාගීත්වයෙන් පසුගිය පෙබරවාරි 02 වන දින එම පාබල සේනාංක ක්‍රීඩාංගණයේදී පවත්වනු ලැබීය. එහිදී, 10 වන ගැමුණු හේවා බලකා කණ්ඩායම එහි ජයග්‍රහණය ලබමින් අන්තර් සේනාංක අවසන් මහා තරඟාවලිය සඳහා කණ්ඩායම සුදුසුකම් ලැබීය.

# පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක්





54 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් යුඩී විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී ගේ අදහසකට අනුව එම ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල්වල දූවා දරුවන් වෙනුවෙන් පාසල් පොත් හා උපකරණ බෙදාදීමේ වැඩසටහනක් පසුගිය මාර්තු මස 19 වන දින 10 වන ගැමුණු හේවා බලකායේදී පැවැත්විණ. 541 වන පාබල බලසේනාව යටතේ ඇති තෝරාගත් පාසල් දෙකක ළමයින් සඳහා එම පරිත්‍යාග පිරිනැමුනු අතර, ඊට ඩයලොග් ආසියාටා ආයතනය හා දානපතිවරුන්ගේ අනුග්‍රහය හිමිවිය.



# ගැහැනිය



ලුතිනන් දිලංක ගුණතිලක,
ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය

ගැහැණිය ඕනෑම දුෂ්කර අවස්ථාවකදී හෝ තත්වයකදී ක්‍රියාත්මකය. ඒ ඇගේ දරාගැනීමේ හැකියාවයි. ඇයට එක්වර දරුවන් කිහිප දෙනකුට වුවද ජන්මය ලබාදිය හැක. එසේම බිඳුණු අස්ථියක සිට බිඳුණු හදවතක් දක්වා සුවපත් කළ හැක. නමුත් ඈ මෘදුය. එහෙත් ඈ ශක්තිමත්ය. ඈ කඳුළු සලන්නේ ඇගේ ශෝකය, සැක සංකාව, ප්‍රේමය, තනිකම, ඇගේ අභිමානය ප්‍රකාශ කිරීම වෙනුවෙනි. එසේම ඈට සතුට සහ වේදනාව සිරකර සිටිමින් දුක් කරදර කන්දරාවක බර දරාගෙන සිටීමේ හැකියාව ඇත. ඇගේ ආදරය කොන්දේසි විරහිතය. ඇය තම විශ්වාස උදෙසා සටන් වදින්නීය. ඒ නිසාම දෙවියන් වහන්සේට ගැහැනිය නිර්මාණ කිරීමට දිගු කාලයක් ගත විය. මේ ඒ සියලු ශක්තීන්ගෙන් සපිරි කාන්තාවන් පිරිසක් ගැන සොඳුරු කතාවකි.

ඔවුන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කාන්තා බලකාය නියෝජනය කරන මේ වනවිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කමාන්ඩෝ රෙජිමේන්තුවෙන් විශේෂ ආධාරක ඛණ්ඩ පුහුණු පාඨමාලාවේ සුවිශේෂී පුහුණුවක් ලබා සිටින සහ මේ වනවිට පුහුණු වෙමින් සිටින පිරිසකි. මෙරට උපාය මාර්ගික ස්ථාන, ඉහළ වටිනාකමක් ඇති ස්ථාන, විශේෂ පුද්ගල ආරක්ෂාව හා විශේෂිත මෙහෙයුම් රාජකාරිවල යෙදවීමේ අරමුණින් විශේෂ මෙහෙයුම් සිදුකිරීමට අවශ්‍ය කුසලතාවයන්ගෙන් සපිරි කාන්තා නිලධාරිනියන් සහ සෙබලියන් බිහිකිරීම වෙනුවෙන් මේ පුහුණුව සිදුකෙරේ. ඔවුන් අවි පුහුණුව, ජීව වෙඩි තැබීම්, බුද්ධි පරීක්ෂණය, සිතියම් කියවීම හා භූමියේ ගමන් කිරීම, යුධ භූමියෙන් තුවාලකරුවන් ඉවත් කිරීම, ක්ෂේත්‍ර ඉංජිනේරු රාජකාරි, කතා පිළිවෙත, නායකත්වය, මූලික යුධ උපක්‍රම, අභ්‍යන්තර ආරක්ෂක රාජකාරි, පුද්ගල ආරක්ෂක රාජකාරි - ජීව වෙඩි තැබීම්, සංග්‍රාමික ජීව වෙඩි තැබීම්, නගරබද සටන්, පිහිණුම් අභ්‍යාසය, ආත්ම ආරක්ෂක සටන්, අවසන් ක්ෂේත්‍ර පුහුණු අභ්‍යාසය ආදී දේශන, නිදර්ශන හා ප්‍රායෝගික පුහුණුවීම් සිදුකරනු ලබයි. 2016 වර්ෂයේදී මෙම විශේෂ ආධාරක ඛණ්ඩ පුහුණු පාඨමාලාවේ පළමු පාඨමාලාව පවත්වා ඇති අතර, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී හා එවක යුද්ධ හමුදාධිපති ගේ උපදෙස් මත ආරම්භ කළ එහි දෙවැනි පාඨමාලාව මේ වනවිට කුඩාඔය කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසලේදී ක්‍රියාත්මකය. විශේෂ ක්‍රියාන්විත ආධාරක කණ්ඩ පාඨමාලාව සාර්ථකව හදාරනු ලැබූ නිලධාරිනියන් හා සෙබළියන් හට දුඹුරු පැහැති කාන්තා බලකාය සඳහා විශේෂිත හිස්වැස්ම යුද්ධ හමුදාපතිතුමන් විසින් ලබාදෙන අතර, පාඨමාලාව සාර්ථකව හැදෑරීම වෙනුවෙන් හිමි නිල ලාංඡනය පැළඳවීමෙන් පසු ඔවුන් පරිපූර්ණ පුහුණුව ලත් විශේෂ ක්‍රියාන්විත ආධාරක කණ්ඩ සාමාජිකාවන් වශයෙන් විසිරයනු ලබයි. එලෙස විශේෂ ආධාරක ඛණ්ඩ පුහුණු පාඨමාලාවේ නිරතව සිටින නිලධාරිනියක සමග අදහස් හුවමාරු කර ගැනීමට අපට අවස්ථාව උදාවිය. මේ ඇගේ කතාවයි.

**ඔබේ නම මොකක්ද ?** මම දෙවැනි ලුතිනන් ජේ.එච් අහමඩ්.

**ඔබේ පාසල මොකක්ද ?** මම ඉගෙන ගත්තේ ගලහිටියාව මහා විද්‍යාලයෙන්.

**එතකොට ඔබ යුද්ධ හමුදාවට බැඳුණේ කොයි කාලෙද ?** 2019 ජනවාරි තමයි මම දියතලාව යුද්ධ හමුදා විද්‍යාපීඨයට ඇතුලත් වුණේ. 2019 දෙසැම්බර් මගේ විසිරයාමේ පෙලපාලිය පැවැත්වුණා. මම දන්න විදිහට මම තමා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ඉන්න එකම මැලේ ජාතික කාන්තා නිලධාරිණිය.

**ඔබ මැලේ ජාතික කාන්තාවක්. ඔබේ පවුලේ අය කැමති වුණාද ඔබ යුද්ධ හමුදාවට බැඳෙනවාට ?** ඔව්... මගේ අම්මයි තාත්තයි, අයියලා දෙන්නයි හැමෝම කැමති වුණා. මගේ අයියලා දෙන්නා තමා මගේ වැඩවලට ගොඩක් උදව් කරන්නේ. ඇත්තටම එයාලා මට කිසිම බලපෑමක් කරන්නේ නෑ. ඒක මට ලොකු ශක්තියක්.

**ඔබ කොහොමද මේ පුහුණුවට එකතු වුණේ ?** මේ පුහුණුව මුලින්ම ලබාදීලා තියෙන්නේ 2016 අවුරුද්දේ. දෙවැනි පාඨමාලාවේ එකේ තමා මම ඉන්නේ. මුලින් අපේ කාන්තා බලකායට මේ පාඨමාලාව ගැන දැනුම් දීලා තිබ්බා. ඉතින් රෙජිමේන්තුවෙන් මේ ගැන අපිට දැනුම් දුන්නාම මට විශාල කැමැත්තක් ඇතිවුණා මේකට සහභාගී වෙන්න. ඒ අනුව තමයි මම මේ එස්ඔඑස්ජී පාඨමාලාවට ආවේ.

**මේ පුහුණුවේ පළවෙනි දවස කොහොමද ?** ඇත්තටම ඒදානම් අමතක වෙන්නෙම නැති දවසක්. පළවෙනි දවස කොච්චර අමාරුයිද අභියෝගාත්මකද කියනවානම් ඇත්තටම හිතුණා පාඨමාලාව දාලා යනවා කියලා. එච්චරටම බය හිතුණා. මුලින්ම අපිට අවි රහිත පුහුණුව නිදර්ශනයක් දුන්නා. ඊට පස්සේ අපිට ඒ දේවල් කරන්න කිව්වා. ඒක ගොඩක් හාර්ඩ්. කරගන්න බැරිවෙයි කියලමයි හිතුණේ. අපිත් එක්ක පුහුණුවට ආපු ළමයි 20 ක් මේක කරන්න බෑ කියලා අයින් වුණා. දැනට මේ කෝස් එකට නිලධාරීන් 6 ක් සහ සෙසු නිලයින් 53 ක් සහභාගී වෙලා ඉන්නවා.

**මේ පාඨමාලාව අනෙක් පාඨමාලාවලින් වෙනස් වෙන්නේ කොහොමද ?** අනෙක් පාඨමාලාවල නොලැබෙන අත්දැකීම් විශාල ප්‍රමාණයක් අපිට ලැබෙනවා. විශේෂම දේ තමයි කමාන්ඩෝ සෙබළුන් විතරක් භාවිතා කරන HKMP5A3 කියන නගරබද සටන් සඳහා භාවිත කරන කෙටිදුර ගිනිඅවිය පුහුණුවීමේ අවස්ථාව ලැබෙනවා. ඒක ඉතාම විරල අවස්ථාවක්. මොකද කාන්තා බලකායේ කෙනකුට මේ අවිය පාවිච්චි කරන්න නම් මේ පාඨමාලාවට සහභාගී වෙන්නම ඕන.

**මේක බොහොම අභියෝගාත්මක පාඨමාලාවක්. ඇත්තටම මේ පාඨමාලාව මොකටද කරන්නේ ?** මේ පුහුණුව ලබා දෙන්නේ විශේෂයෙන්ම ප්‍රභූ ආරක්ෂක රාජකාරි වෙනුවෙන් යොදවන්න තමයි.

**මොනවාද මේ පුහුණුවේදී ඔබට ලැබුණු අමතක නොවන අත්දැකීම් ?** මේ පුහුණුව පටන් ගත්තු දවසේ ඉඳන්ම සෑම අත්දැකීමක්ම අපිට අමතක නොවන අත්දැකීමක්. මොකද ගොඩක් දේවල් අපි කරන්නේ පළවෙනි වතාවට. මට නම් රැපලින් (කඹ ආධාරයෙන් බැසීම) දාපු දවස තමයි අමතක වෙන්නේම නැත්තේ. පළවෙනි වතාවටනේ අඩි 80ක් උඩ ඉඳලා බිමට පනින්නේ. ඉතින් ඒ අත්දැකීම අමතක වෙන්නේ කොහොමද ?

**මේක විශේෂ පුහුණුවක්. ඉතින් කාන්තාවක් විදිහට ඒ පුහුණුව දැනෙන්නේ කොහොමද ?** අපේ සමාජයේ බහුතරයක් දෙනා හිතන්නේ කාන්තාවන්ට අභියෝග භාරගන්න බෑ, හරියට වැඩක් කරන්න බෑ, ශක්තිය නෑ කියලා. හැබැයි අපිට පුළුවන් ඒ අදහස වෙනස් කරන්න. අපිදෙයක් හිතුවොත් ඒක කරන්න අපිට පුළුවන්. ඒ විශ්වාසය මේ පුහුණුවෙන් අපිට තවත්



වැඩි කරනවා. අනිත් කාරණය තමයි මට මම ගැන විශාල අභිමානයක් තියෙනවා. මගේ සමවයසේ යාළුවෝ එක්ක සංසන්දනය කරද්දි මට තියෙන අත්දැකීම් වෙන කාටවත් නැහැ. ඉතින් මම කියනවා අනිත් තරුණියන්ටත් හමුදාව එක්ක එකතු වෙන්න කියලා. විශේෂයෙන්ම මැලේ ජාතික තරුණියන්ටත් මම ආරාධනා කරනවා එන්න ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සමග එකතු වෙන්න කියලා.

විශේෂ ආධාරක බණ්ඩ පුහුණු පාඨමාලාවේ පළමු පාඨමාලාවට සහභාගී වී දැනට පුහුණු උපදේශිකාවක වශයෙන් කටයුතු කරන කෝප්‍රල් චන්දිමා තෙරංජලී විමලරත්න සමගද අදහස් හුවමාරු කර ගැනීමට අපට හැකිවිය. ඇය අප සමග කීවේ මෙවැනි කතාවකි.

මම හමුදාවට ආවේ 2008 අවුරුද්දේ. මම හමුදාවට එනවාට ගෙදරින් කැමති වුනේ නැහැ. ඇත්තටම කිව්වොත් මම හමුදාවට ආවේ ගෙදරට හොරෙන්. ඒත්, අද මම ලංකාවේ හමුදාවේ කාන්තා බලකායට තියෙන සුවිශේෂීම පාඨමාලාවක පුහුණු උපදේශිකාවක් විදිහට කටයුතු කරන එක ගැන මට ලොකු ආඩම්බරයක් තියෙන්නේ. මේ පාඨමාලව කරන්න නම් දරාගැනීමේ හැකියාව උපරිමෙන්ම තියෙන්න ඕනෑ. ඒ වගේම අනිත් හැමදේම අමතක කරලා පාඨමාලාවට විතරක් අවධානය තියාගන්න එක තමා වැදගත්ම. අපිත් එක්ක මේ පාඨමාලාව හදාරපු පිරිසක් මේවන විට එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරිවල පවා නිරතවෙලා ඉන්නවා.

මේ පුහුණුව තමයි මගේ ජීවිතේ ප්‍රධානම හැරවුම් සන්ධිස්ථානය. ඒ කියන්නේ මට මේ පුහුණුවෙන් ලැබුණු අත්දැකීම් නිසා මට අද ඕනෑම අභියෝගයකට සාර්ථකව මුහුණ දෙන්න පුළුවන් කියන ආත්ම විශ්වාසය මට තියෙනවා. මේ පුහුණුවේ එක් ප්‍රායෝගික අභ්‍යාසයක් තියෙනවා ඒක හරිම අභියෝගාත්මකයි. ඒකේදි වෙන්නේ අපිව ගමකට හරි නගරයකට හරි ගිහින් දානවා යම් ඉලක්කයක් දීලා. ඉතින් අපි සතුරු හමුදාවන්ට අහුවෙන්නේ නැතිව අපිට දීපු ඉලක්කය අපි සම්පූර්ණ කරන්න ඕන. සතුරු හමුදාවන්ට අපිට අහුවුණොත් ඔවුගෙන් අපිට දඬුවම් ලැබෙනවා. ඒක හරිම අභියෝගාත්මක ප්‍රායෝගික අත්දැකීමක්. ඒ වගේම තමයි අපි ජංගල් කියලා කියන වනගත පුහුණු අභ්‍යාස. ජංගල් එකේදි තමන්ගේ ජීවිතය ආරක්ෂා කරගන්න මඩ වතුර පවා බොන්න වෙනවා. ඒ වගේම තමා වන සතුන්ගෙන් ආරක්ෂා වීම තමයි අනිත් අභියෝගාත්මකම කටයුත්ත. ඉතින් මම අපේ රටේ තරුණියන්ට කියනවා එන්න අපිත් එක්ක එකතු වෙන්න කියලා. මොකද හමුදාවට එන එක වගේම විශේෂ ආධාරක බණ්ඩ පුහුණු පාඨමාලාවට එන්නත් හැමෝටම බැහැනේ.

# නොමසුරු ක්‍රියාව අගයමින්



3 (සෙව්) ගැමුණු හේවා බලඇණි සුබසාධක වෙළඳසැලේ රාජකාරියේ නියුතු සෙ/21එෆ්00178 ලාන්ස් කෝප්‍රල් විතාරණ එන්ජී යන කොනොනි විසින් ඉකුත් මැයි 23 වන දින එම වෙළඳ සැලෙහි බිම වැටී තිබූ මුදල් පසුම්බියක් අහුලාගෙන එය අදාළ අයිතිකරුට භාරදීමට කටයුතු කරන ලදී. අකුරැස්ස ප්‍රදේශයේ පදිංචි ගුරුවරයකු වන බන්දුල දිසානායක මහතාට අයත් එම මුදල් පසුම්බියේ ඒ වනවිට රුපියල් 183,000.00 ක් වටිනා මුදල් කළ හැකි ප්‍රේෂණපතක් හා මුදලින් රුපියල් 41,300.00 ක මුදලක් තිබී ඇත.

මෙම කොනොනි විසින් සිදුකරන ලද එම විශිෂ්ට ක්‍රියාව 3 (සෙව්) ගැමුණු හේවා බලඇණියේත්, ගැමුණු හේවා රෙජිමේන්තුවේත්, සමස්ත යුද්ධ හමුදාවේත් කීර්තිනාමය ඉහළට ගෙන ඒමට හැකිවූවා මෙන්ම සිවිල් ජනතාවගේ හදවත් තුළ යුද්ධ හමුදාව කෙරෙහි ඇති විශ්වාසය වැඩි කිරීමට ද හේතුවකි.

# අම්පාර සටන් පුහුණු පාසලේ පාඨමාලා නිමාව



අම්පාර සටන් පුහුණු පාසල වෙතින් සාර්ථකව දියත් කෙරුණු "කොනොනි නායකත්ව හා ප්‍රගමන ප්‍රවර්ධන පාඨමාලාව - අංක 43" පසුගිය මැයි 25 වන දින සාර්ථකව අවසන් කරන ලදී. මෙම පාඨමාලාව සඳහා සිසු සිසුවියන් 101 දෙනකු සහභාගී වූ අතර, සෙ/654596 කෝප්‍රල් ගමගේ බීඒ - 1 ශ්‍රීලයුමෙව විසින් එහි ප්‍රථම ස්ථානය හිමි කරගන්නා ලදී.

තවද, නිත්‍ය හා ස්වේච්ඡා ඒකකයන්හි සිසු සිසුවියන් 266 දෙනකුගේ සහභාගීත්වයෙන් පැවති "ඉගැන්වීමේ ක්‍රමවේදය පාඨමාලා - අංක 56" ද පසුගිය මැයි 24 වන දින පැවති අතර, එහි දක්ෂතම සිසුවා ලෙස සෙ/521054 කෝප්‍රල් බංඩාර ටීඑම්ඩබ්ලිව් - 11 විපාරෙ විසින් සම්මාන හිමිකර ගන්නේය. පාඨමාලාවල අවසන් දේශන සහ සහතික පත් ප්‍රදානය පුහුණු පාසලේ සේනාවිධායක බ්‍රිගේඩියර් ජේඑම්ආර්එන්කේ ජයමාන්න ආර්ඩබ්ලිව්පී විසින් සිදුකරන ලදී.

# වියළි සලාක මළු බෙදාදීමේ වැඩසටහනක්





ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති ගේ මගපෙන්වීම මත ආර්ථික අපහසුතා ඇති පවුල් 1500 ක් සඳහා වියළි සලාක බෙදාදීමේ ප්‍රජාසත්කාරක වැඩසටහනක් ඉකුත් මැයි 19 වන දින යාපනය ශ්‍රී නාග විහාරය, රදගුරු නිල නිවස, කීරමලේ කෝවිල හා යාපනය මුස්ලිම් පල්ලිය පරිශ්‍රයේදී පවත්වන ලදී. හොරණ තලගල ශ්‍රී සිද්ධාර්ථ පදනමේ හා සිංගප්පූරුවේ Tan Ngak Bauy & Kee Meng lang Foundation Limited (Singapore) ආයතනය විසින් මූල්‍ය දායකත්වය ලබාදුන් මෙම වැඩසටහන 51 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ගේ අධීක්ෂණය මත 11 වන ශ්‍රී ලංකා පාබල හමුදාව හා 16 වන ගැමුණු හේවා බලඇණිය විසින් ශ්‍රම දායකත්වය ලබාදෙන ලදී.

# "*Creators Military Items & Textile*" විවෘත කෙරේ





පනාගොඩ යුද්ධ හමුදා ජනපදය ඉදිරිපිට පිහිටි ක්‍රියේටර්ස් සුබ සාධක වෙළඳසැල් ගොඩනැගිල්ලේ බිම් මහලෙහි "*Creators Military Items & Textile*" නව වෙළඳ සැල යුද්ධ හමුදා සෙබළුන්ගේ සහ මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා ඉකුත් ජූනි 10 වන දින ඉංජිනේරු සේවා බලකායේ කර්නල් සේනාවිධායක බ්‍රිගේඩියර් කේඑම්එස් කුමාර ගේ සුරතින් විවෘත කෙරිණ. තවද, මෙම අවස්ථාවට ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ කර්නල් ඉංජිනේරු සේවා ලෙස රාජකාරි නිරත කර්නල් එන්ඩබ්ලිව්පීඑස්එම් පෙරේරා, ඉංජිනේරු සේවා මධ්‍යම වැඩපළෙහි සේනාවිධායක කර්නල් එම්එස්ඩී පෙරේරා යූඑස්පී ඇතුළු නිලධාරීන්, නිලධාරිණියන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගි වූහ.

# කාබනික පොහොර බෙදාදීමක්



වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය කිරීම තුළින් සෞඛ්‍ය සම්පන්න ජාතියක් බිහිකිරීම සහ පරිසර හිතකාමී තිරසර ගොවිතැන ප්‍රචලිත කිරීමේ අරමුණින් යුද්ධ හමුදාධිපති ගේ උපදෙස් පරිදි 10(සේවා) ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ භටපිරිස් විසින් නිෂ්පාදනය කරන ලද කාබනික පොහොර කිලෝග්‍රෑම් 8000 ක තොගයක් සීමාසහිත (ලක් පොහොර) සමාගම වෙත භාරදීම ඉකුත් ජූනි 06 වන දින එම සමාගමේ සූරියවැව ප්‍රාදේශීය පොහොර ගබඩාවේදී සිදුකරන ලදී. 10(සේවා) ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී මේජර් ආර්පීජී රෝහණ යූඑස්පී එල්එස්සී එම පොහොර තොගය ලංකා පොහොර සමාගමේ නිලධාරීන් වෙත සංකේතාත්මකව භාරදීමේ අවස්ථාවට එක්විය.

# මාහැඟි පරිත්‍යාගයක්



56 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් එල්ඩීඑස්එස් ලියනගේ ආර්එස්පී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී ගේ මගපෙන්වීම මත 561 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ජීපීපී කුලතිලක ගේ අධීක්ෂණය යටතේ එම බල ප්‍රදේශයේ පිහිටි කනගරායන්කුලම් ගම්මානයේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා වියළි සලාක පිරිනැමීම සහ එම පවුල්වල අධ්‍යාපනය ලබන දරු දැරියන් සඳහා පාසල් උපකරණ පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් ජූනි 06 වන දින පැවැත්විණ. මේ සඳහා මූල්‍ය දායකත්වය පත්මහංස ප්‍රජා සේවා ව්‍යාපෘතියේ අධ්‍යක්ෂිකා සමන්ති පැලපොල මහත්මිය, කොළඹ රාජකීය විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ සම්බන්ධීකරණ නිලධාරී ප්‍රසාද් ලොකුබාලසූරිය මහතා ඇතුළු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය, මෙරට සහ විදේශගත ශ්‍රී ලාංකික පරිත්‍යාගශීලීන් විසින් දරණ ලදී.



# කල්කුඩා
## "දොස්තර මහතා"

1996 වසර වෙද්දී මා රාජකාරි කරන ලද්දේ මඩකලපුව වාලච්චේන ප්‍රදේශයේය. වාලච්චේන කලපු "ජැටියේ" සිට කල්කුඩා දෙසට කිලෝමීටර් තුනක් පමණ ගියතැන හමුවන "පේතාලේ" හි මා සිටි කඳවුර පිහිටා තිබිණ. අතහැර දැමූ දෙමහල් නිවසක් වටකොට ඉදිකළ එම කඳවුරෙහි පොලිස් අනුබණ්ඩයක්ද විය. කඳවුර ඉදිරිපසින් කල්කුඩා වාලච්චේන මාර්ගය දිවුණු අතර පෙනෙන දුරින් පේතාලේ ගම්මානය දැකිය හැකි විය.

එම කාලවකවානුවේ අප රට තුළ පැවතියේ දැවැන්ත විදුලි අර්බුදයකි. දිවයිනේ උතුරු නැගෙනහිර ක්‍රියාන්විත සේවාවන්හි නියැලි හමුදා සාමාජිකයන්ද එම අර්බුදය හමුවේ බැටකෑවේය. මේ අතර එවක ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියද පැවැත්වෙමින් තිබූ අතර අප රටෙහි ක්‍රිකට් කණ්ඩායම එහි මුල සිටම පෙරලියක් කරමින් සිටියහ. එනිසාම අවසන් ජයග්‍රහණය පිළිබඳ නිසැක බලාපොරොත්තුවක් සමස්ත රට වැසියන් තුළම මෝදුව තිබිණ. මේ අතර ආරක්ෂක අංශ සාමාජිකයන් ලෙස අප තුළද එම තරගාවලිය නැරඹීම වෙනුවෙන් පැවතියේ නොතිත් ආසාවකි. නමුත් මා සිටි කඳවුර තුළ රූපවාහිනී යන්ත්‍රයක් නොමැතිවීම අප මුහුණදුන් ගැටලුවයි.


කෙසේ වුවද කඳවුර තුළ පිහිටි පොලිස් අනුබණ්ඩයේ සාමාජිකයින් ඉහත ගැටලුව සඳහා ක්‍රමයක් සකසා ගෙන තිබුණි. එහිදී, ඔවුන් විසින් සිදුකරන ලද්දේ යාබද පිහිටි පේතාලේ ගම්මානයේ කොහේ හෝ නිවසකින් දින කිහිපයකට වරක් රූපවාහිනී යන්ත්‍රයක් ඉල්ලාගෙන ඒමය. විදුලිය නොමැති අවස්ථාවලදී රූපවාහිනිය නැරඹීම සඳහා චාර්ජ් කරන ලද බැටරියක්ද භාවිතයට ගැනිණ. එහිදී, විවිධ ප්‍රමාණයේ රූපවාහිනී යන්ත්‍ර විටින් විට කඳවුරේ ප්‍රයෝජනය සඳහා රැගෙන විත් තිබූ අතර එලෙස දින දෙක තුනකට තම රූපවාහිනී යන්ත්‍ර ලබාදීමට සිදුවීම පිළිබඳ එම ගම්මානයේ සිටියවුන්ගේ අකමැත්තක්ද නොවීය. එහෙත් කලාතුරකින් අයකු ඊට නොසතුට පළකළ අවස්ථාද තිබිණ. කෙසේ වුවද, ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලිය පැවති කාලසීමාව සඳහා පමණක් එම ක්‍රියාව සිදුකිරීමට පොලිස් අනුබණ්ඩයේ පිරිස් පියවර ගත්හ. පැවති ක්‍රියාන්විත තත්ත්වය හමුවේ නිදහසේ රූපවාහිනිය නැරඹීමට හැකි වේලාවක් සොයාගැනීම අපහසු වුවද ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලිය නිසාම සියලු කටයුතු අස්සේ කෙසේ හෝ ඒ සඳහා වේලාවක් සොයාගැනීමට කවුරු කවුරුත් වගබලාගෙන තිබුණි.

මෙලෙස සති කිහිපයක් ගෙවෙද්දී එක්තරා දිනෙක මා උදෑසනින් අවදි වූයේ එතෙක් නොදැනුණු තරමේ ආස්වාදජනක හැඟීමකිනි. ඒ පෙර දින රාත්‍රියේ ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම ලෝක කුසලානය හිමිකර ගැනීමේ උද්දාමයෙනි. එහිදී, කඳවුරේ උඩු මහලෙහි ඇති සඳලුතලයට පැමිණි මා අවට විපරම් කරද්දී දුටුවේ කඳවුර ඉදිරියේ ඇති මාර්ගය අසල සුදු පැහැති නවීන පන්නයේ මෝටර් රථයක් නවතා ඇති අයුරුය. ටයිපටියක් පැලඳ අව්කණ්ණාඩියකින් සැරසී පිළිවෙලට ඇඳපැළඳගත් මැදිවිය ඉක්මවූ අයකු ඉන් බැස සිටියේය. ඒ

සමගම මාර්ගය අසල මුර රාජකාරි නියුතු සෙබළා මා වෙත පැමිණ දන්වා සිටියේ යාබද කල්කුඩාහි පදිංචි වෛද්‍යවරයකු මා හමුවීමේ අපේක්ෂාවෙන් එහි පැමිණ ඇති බවයි.

අනතුරුව මා ඔහු හමුවට යද්දී දුර තියාම සිනාමුසු මුහුණින් යුතුව හෙතෙම මා හා කතාබස් කරන්නට වූයේ බොහෝ ලෙංගතු කමකිනි. එහිදී ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම ලෝක කුසලානය ජයග්‍රහණය කිරීමේ සතුට ඔහු මා හා බෙදාගත්තේය. එය සැමරීම වස් පෙට්ටියක දමා සුරැකිව අසුරන ලද ඉතා වටිනා පෑනක්ද ඔහු මා වෙත තිළිණ කරන ලදී. කල්කුඩාහි පදිංචි එම දොස්තර මහතා නමින් " බාලක්‍රිෂ්ණන්" විය. වාලච්චේනෙහි පිහිටි බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යන ඔහු එහි ඔසුසලකද හිමිකරුවකු වන අතර උදේ හවස කඳවුර ඉදිරි මාර්ගයෙන් යාම් ඊම් කළ අයෙකි. ඒ වනවිට ප්‍රදේශයේ යුද හමුදාව හා පොලිසිය සමග ඔහු සමීපව කටයුතු කර තිබුණද හෙතෙම මා හමුවූ මුල්ම අවස්ථාව එය විය. එම ක්‍රියාන්විත පරිසරය තුළ ප්‍රදේශයේ පිළිගත් ද්‍රවිඩ ජාතිකයකු සමග එලෙස මිතුරුවීමට ලැබීම පිළිබඳ මා තුළ වූයේද පහන් හැඟීමකි. අවසානයේ ඔහු ඉන් නික්මගියේ අප අතර දිගුකාලීන හිතවත්කමකට පදනම යොදමිණි.

එතැන් පටන් සෑම දිනකම පාහේ කඳවුර ඉදිරියෙන් සිය වෛද්‍ය මධ්‍යස්ථානය කරාගිය වෛද්‍ය බාලක්‍රිෂ්ණන් එහිදී වචනයක් දෙකක් මා සමග කතාබස් කිරීමට හෝ අඩු තරමින් වාහනයේ නලාව හෝ හඬවා යන්නට අමතක නොකළේය. එසේම කඳවුරේ සෙසු භටපිරිස් අතරද ඔහු ප්‍රියමනාප චරිතයක් වූයේ නිරායාසයෙනි. මෙලෙස කාලය ගතවෙද්දී අප අතර ගොඩනැගුණු මිතුදම කොතෙක් දුලු ලා ගියේද යත් කල්කුඩාහි පිහිටි ඔහුගේ නිවසට පවා ඉඩ ලද විටෙක යාම් ඊම්ද



සිදුකිරීමට මා පෙළඹුණේය. එහිදී ඔහුගේ බිරිඳ, කුඩා දියණිය හා පුතාද එහි වූහ. සිංහල ජාතික කාන්තාවක් වූ ඔහුගේ බිරිඳ පස්යාල - මීරිගම ප්‍රදේශයේ පදිංචිව සිටි අයෙකි. වෛද්‍ය බාලක්‍රිෂ්ණන් ද හැටන් ප්‍රදේශයේ සිට බොහෝ කලකට ඉහතදී කල්කුඩා වෙත පදිංචියට පැමිණ තිබුණි.

මෙලෙස කාලය ගතවෙද්දී එක්තරා දිනක වෛද්‍ය බාලක්‍රිෂ්ණන් සිය පවුලේ සාමාජිකයින් සමග කිසියම් අවශ්‍යතාවයකට කොළඹ යාමට නියමිත වූහ. එදින මාද නිවාඩු ලැබ නිවසට යාමට සූදානම්ව සිටි බැවින් සිය මෝටර් රථයේම කොළඹ යාම සඳහා ඔහු මා හට ද ඇරයුම් කළේය. කොළඹ ප්‍රදේශයේ වීම ඔහුට අපහසුතාවක් වූයෙන් ඒ සඳහා විශ්වාසවන්ත රියදුරකු සොයාගැනීමටද ඔහු එහිදී මාගෙන් උපකාර පැතීය. ඒ අනුව මා පදිංචි ප්‍රදේශයේ දන්නා හඳුනන රියදුරු මහතකු ඔහුට සම්බන්ධ කරදීමට එකඟ වෙමින් මා ඔහු සමග කොළඹ බලා පිටත් වූහ. එදින අප බොහෝ සතුටු සාමීචියෙන් යුතුව යක්කල මා පදිංචි නිවසට පැමිණි අතර ඒ වනවිට බොහෝ සෙයින් රෑ බෝ වී තිබිණ. එනිසාම වෛද්‍ය බාලක්‍රිෂ්ණන් ඇතුළු පවුලේ අය වෙනුවෙන් එදින රාත්‍රියේ අප නිවසේ නවාතැන් පහසුකම් සලසාදීමටද මා විසින් කටයුතු කරන ලදී.

පසුදින සිය බිරිඳ හා දරුවන් අප නිවසේම රඳවා මා සොයාදුන් රියදුරුද සමග වෛද්‍ය බාලක්‍රිෂ්ණන් කොළඹ බලා පිටත් වූහ. අනතුරුව සිය කටයුතු අවසානයේ එදින සවස යළි පැමිණි ඔහුගේ ඉල්ලීම වූයේ සිය පවුලේ සාමාජිකයින් සමග එම රාත්‍රිය ප්‍රදේශයේ හෝටලයක නතරවීමට අවැසි බවය. එසේම රාත්‍රී භෝජනය සඳහා මා එහි ගෙන්වා ගැනීමද ඔහුගේ අදහස විය. ඒ අනුව යක්කල නගරාසන්නයේ වූ හෝටලයක් වෙත ඔවුන්ව ගෙනත් ඇරලීමට මා විසින් කටයුතු කරන ලදී. නමුත් ඔහු ද්‍රවිඩ ජාතිකයකු බැවින් එවක රටේ පැවති වාතාවරණය මත රාත්‍රියේ එවැනි පවුලකට හදිසියේ නවාතැන් දීමට හෝටල් හිමිකරු අකමැත්ත ප්‍රකාශ කළේය. එවක රටපුරා ත්‍රස්ත ක්‍රියා බහුලව පැවති හෙයින් සිංහල දමිළ ජන කොටස් අතර විශ්වාසය නැතිබල ලෙස පලුදුව තිබූ සමයකි. එනමුත් වෛද්‍ය බාලක්‍රිෂ්ණන් ඇතුළු පවුලේ සාමාජිකයින් අපහසුතාවයට පත්වීමට ඉඩදිය නොහැකි බැවින් වහාම මා මාගේ යුද හමුදා හැඳුනුම්පත ඉදිරිපත්කොට හෝටල් හිමිකරු සමග එකඟව ඔවුහු එහි නැවැත්වීමට පියවර ගත්හ. කුඩා දරු දෙදෙනාද සමග ඒ වන විට බොහෝ අසරණව සිටි වෛද්‍ය බාලක්‍රිෂ්ණන් වෙනුවෙන් එහිදී මා සිදුකළ මැදිහත්වීම ඔහුගේ අප්‍රමාණ ඇගයීමට බඳුන් විය.

කාලය කෙමෙන් ගෙවී ගියේය. යළි මා ජේතාලේ කඳවුරේ රාජකාරී කරන අතරතුර තවත් සුවිශේෂී සිදුවීමක් විය. එනම් එක්තරා දිනක අලුයම ඒ ආසන්නව පිහිටි කල්කුඩා පොලිස් ස්ථානයට ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල වීමයි. වෛද්‍ය බාලක්‍රිෂ්ණන්ගේ

**එක්තරා දිනක අලුයම කල්කුඩා පොලිස් ස්ථානයට ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල විය. වෛද්‍ය බාලක්‍රිෂ්ණන්ගේ නිවස පිහිටා තිබුනේද එම පොලිස් ස්ථානයට යාබදව බැවින් එම ප්‍රහාරය ඔහුටද සෘජුවම දැනුණේය. එම ප්‍රහාරය කොතරම් දරුණුවිද යත් පොලිස් භටයින් දස දෙනකුට වැඩි පිරිසක් එහිදී මියගිය අතර බරපතල තුවාල ලැබූවන් සංඛ්‍යාවද එවැනිම විය. එහිදී උද්ගත වූ තත්ත්වය හමුවේ වෛද්‍ය බාලක්‍රිෂ්ණන්ට නිහඬව පසුවීමට හිත නොදුන්නේය. සිය නිවසේ තාප්පයෙන් එපිට සිදුවූ එම ප්‍රහාරය හමුවේ බරපතල ලෙස තුවාල ලැබ සිටි පොලිස් භටයින්ට ක්ෂණිකව ප්‍රතිකාර කොට ඔවුන්ව රෝහල කරා යැවීම දක්වා වූ අතිශය අවදානම් සහගත කටයුත්තට ඔහු ඉදිරිපත් වූයේ ජාතිබේදයෙන් පිරුණු සමාජයට මනුස්සකමේ අගය පෙන්වා දෙමිණි. එහිදී ඔහුගේ එම ක්ෂණික මැදිහත්වීම නොවන්නට එම ප්‍රහාරයෙන් තවත් පිරිසක් මියයාමටද හොඳටම ඉඩකඩ තිබුණි. ද්‍රවිඩ ජාතිකයකු වුවද එල්ටීටීඊ තර්ජන නොතකා ඔහු එම සත්ක්‍රියාවට පණදුන්නේ තමා වෛද්‍යවරයකු බව වචනයේ පරිසමාප්තයෙන්ම සනාථ කරමිණි.**

නිවස පිහිටා තිබුණේද එම පොලිස් ස්ථානයට යාබදව බැවින් එම ප්‍රහාරය ඔහුටද සෘජුවම දැනුණේය. එම ප්‍රහාරය කොතරම් දරුණුවීද යත් පොලිස් භටයින් කිහිපදෙනකු මියගිය අතර සැලකිය යුතු පිරිසක් තුවාල ද ලැබූහ. එහිදී, උද්ගත වූ තත්ත්වය හමුවේ වෛද්‍ය බාලක්‍රිෂ්ණන්ට නිහඬව පසුවීමට හිත නොදුන්නේය. සිය නිවසේ තාප්පයෙන් එපිට සිදුවූ එම ප්‍රහාරය හමුවේ බරපතල ලෙස තුවාල ලැබ සිටි පොලිස් භටයින්ට ක්ෂණිකව ප්‍රතිකාර කොට ඔවුන්ව රෝහල කරා යැවීම දක්වා වූ අතිශය අවදානම් සහගත කටයුත්තට ඔහු ඉදිරිපත් වූයේ ජාති භේදයෙන් පිරුණු සමාජයට මනුස්සකමේ අගය පෙන්වා දෙමිණි. එහිදී ඔහුගේ එම ක්ෂණික මැදිහත්වීම නොවන්නට එම ප්‍රහාරයෙන් තවත් පිරිසක් මියයාමටද හොඳටම ඉඩකඩ තිබුණි. දෙමළ ජාතිකයකු වුවද එල්ටීටීඊ තර්ජන නොතකා ඔහු එම සත්ක්‍රියාවට පෙළඹුන්නේ තමා වෛද්‍යවරයකු බව වචනයේ පරිසමාප්තයෙන්ම සනාථ කරමිණි.

කලක් ගතවෙද්දී එතෙක් "ජේතාලේ" කඳවුරෙහි සේවය කළ මාහට අප ඒකක මූලස්ථානය පිහිටි යාබද කල්කුඩා කඳවුරට මාරුවීමට සිදුවිය. එහිදීද එම කඳවුරේ විශේෂ උත්සව කටයුතුවලදී වෛද්‍ය බාලක්‍රිෂ්ණන්වද ඇරයුම් කළ අවස්ථා තිබුණි. අනතුරුව එම ප්‍රදේශයේම පිහිටි කල්මාඩු, කුඹුරුමුල්ල, වෙංකල්අඩි ආදී කඳවුරුවලද වරින් වර රාජකාරී කළ මා හට අවසානයේ කොළඹ යුද හමුදා මූලස්ථානයට මාරු වීමක් ලැබුණි. මාගේ මතකයට අනුව ඒ 1998 වසර අගභාගයේදීය. එහිදී, කොළඹ ප්‍රදේශයට මාරුවක් ලැබීම මා පදිංචි නිවසටද ආසන්න වූ බැවින් එය යම් අස්වැසිල්ලක් වුවද එතෙක් වසර ගණනාවක් ගතකළ හුරුපුරුදු පරිසරයෙන් මිදීම සංවේගයට හේතුවක් විය. විශේෂයෙන්ම වෛද්‍ය බාලක්‍රිෂ්ණන් වැනි හිතවතුන්ගෙන් සමුගන්නට වීම නිසාම එම තත්ත්වය තදින්ම දැණුනේය.

මෙලෙස කාලය ගතවුවද වෛද්‍ය බාලක්‍රිෂ්ණන් හා බැඳුණු හිතවත්කම් යටපත් නොවීය. ඒ අතරවාරයේ සිදුවූ තවත් විශේෂත්වයක් වූයේ මාගේ විවාහ මංගල්‍යය වෙනුවෙන් ඔහු මඩකලපුවේ සිට සිය පවුලේ සාමාජිකයින් ද සමගම සහභාගී වීමය. එසේම විවාහ උත්සවයේ කටයුතු වෙනුවෙන් ඔහු සිය මෝටර් රථය පවා එහිදී මා වෙත ලබා දුන්නේය. එපමණකුදු නොව විවාහ දිනයේ ඔහු ඉතා වටිනා තිළිණයක්ද මා වෙත පුද කළේය. එය රන් පැහැයෙන් යුතු ඉතා වටිනා නවීන විදුලි පංකාවකි. එලෙසින්ම පසුකාලීනව ඔහු හා බැඳුණු තවත් මතයක්ද විය. එනම් ඔහුගේ දියණියගේ විවාහ උත්සවය සඳහා මාහටද ඇරයුම් ලැබීමය. ඒ වනවිට රට පුරා ත්‍රස්තවාදී ක්‍රියා බහුලව පැවති සමයක් වුවද මහනුවර හින්දු සංස්කෘතික මධ්‍යස්ථානයේ පැවති එම මංගල උත්සවය සඳහා මා පමණක් පුද්ගලිකවම සහභාගී වුණෙමි.


මෙලෙස කාලය ගතවෙද්දී වෛද්‍ය බාලක්‍රිෂ්ණන් හා මා විටින් විට කතාබස් කළ වාර ගණන බොහෝය. එසේම සැම දෙසැම්බරයකම ඔහුගෙන් නත්තල් සුබපැතුම් පතක්ද මා වෙත නොවරදවාම ලැබුණි. එසේම පවුලේ සාමාජිකයින් හා එක්ව දිනක් මා කල්කුඩා ප්‍රදේශයේ සංචාරයක ද නිරත වූ අතර එහිදී අපගේ නවාතැන වූයේද වෛද්‍ය බාලක්‍රිෂ්ණන්ගේ නිවසය. එම අවස්ථාවේදී ඔහු අප වෙත දැක්වූ ආගන්තුක සත්කාරය කිසිදා අමතක නොවන තරම්ය.

අනතුරුව තවත් වසර කිහිපයක් ගෙවීගියේය. එම කාලසීමාව පුරාම අප එකිනෙකාට හමුනොවූ අතර, කථාබහ කළ අවස්ථාද විරල විය. කිසිදු පලුද්දක් නොවුවද කාලය හා අප පදිංචි දුර අනුව එතෙක් කලක් අප අතර තිබූ සබඳතා යම් දුරස් බවක් පෙන්නුම් කළේය. මේ අතර මා විසින් එළිදැක්වීමට නියමිත වූ නවතම කෘතියක වැඩ කටයුතු ඇරඹීය. 30 වසරක් වූ මාගේ යුද හමුදා දිවියේ අත්දැකීම් ඇසුරෙන් ලියන එම කෘතියට වෛද්‍ය බාලක්‍රිෂ්ණන් හා බැඳුණු සුන්දර මතකයද එක්කරන්නට අදහස් කළේ ඒ පිළිබඳ ඔහුද නිසැකවම සතුටු වන බව දත් හෙයිනි.

ඒ අනුව පසුගිය දිනක රාත්‍රියේ මා ඔහුට දුරකථන ඇමතුමක් ලබාදුන්නේය. නමුත් ඊට පිළිතුරු ලැබුනේ ඔහුගේ දියණියගෙනි. "ආ අංකල් කොහොමද" කතා කළ පළමු වදනින්ම ඇය මා හඳුනාගත්තාය. "කෝ දුව ඩොක්ට ඉන්නවද" නමුත් ඊට ක්ෂණික පිළිතුරක් ඇයගෙන් නොවූවාය. ඒ වෙනුවට සැලකිය යුතු නිහඬ බවකින් අනතුරුව ඇසුනේ සිහින් ඉකිබිඳුමකි. "He passed away uncle" ඇය ඉකිබිඳුම් අතරේ කීවාය. ඊට මාස තුනකට ඉහතදී ඇයගේ පියා කොරෝනා රෝගය වැළඳීම හේතුවෙන් මියගිය බව ඕ මා හමුවේ පවසන්නට වූවාය. ඔහුගේ අවසන් කටයුතු වාලච්චේන ඕට්ටමාවඩි පොදු සුසාන භූමියේදී පවුලේ සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් පමණක් සිදුකළ බවද ඇය වැඩිදුරටත් පැවසුවාය. කිසිසේත්ම අදහාගත නොහැකි එම අනපේක්ෂිත පිළිතුරින් මා කොතරම් තැති ගත්තේද යත් ඉහළට ගත් හුස්ම පහළට හෙලන්නට පවා අමතක වූ සෙයකි. 67 වන වියේ පසු වුවද වෛද්‍ය බාලක්‍රිෂ්ණන් සිය වයස ඉක්මවා ක්‍රියාශීලීව කටයුතු කළ අයකු බැවින් එවැනි අනපේක්ෂිත ඉරණමකට ගොදුරුවීම පිළිබඳ මා තුළ හටගත් පශ්චාත්තාපය නිමක් නොවීය. කෙසේ වුවද කිසිවක් ආපසු හැරවිය නොහැකි අයුරින් අවාසනාවන්ත ලෙස සියල්ල සිදුවී හමාරය. වෛද්‍ය බාලක්‍රිෂ්ණන් හා බැඳුණු දශක දෙකහමාරක් ඉක්මවූ දීර්ඝ පරිච්ඡේදය සදහටම නිමාවූවා නොවේදැයි ක්ෂණිකව මා සිහියට නැගිණි.

අසුරු සැනින් කාලය ගෙවුනද හදවත් තුළ සැඟවුණු සුන්දර මතක සැමදා අලුත් වෙමින් තිබේ. අයහපත බැහැරවෙමින් යහපත්දේ ජීවිතත් සමග ඉදිරියට ගමන් කරනුයේ අපටද නොදන්වාය. වෛද්‍ය බාලක්‍රිෂ්ණන් වැනි සත්පුරුෂ මිනිසුන්ගේ ඇසුර යුද බිමෙහි අත්දැකීම් ලැබූ බොහෝ අයකු තුළ නිසැකවම ඇතුවාට සැක නැත. යුද්ධයේ නටඹුන් එම බිම්තීරවල සදාතනිකව වැළලෙද්දී යුද්ධය නිසාම අප ජීවිත වලට එකතු වූ හිතවත්කම් පිරි මනුස්සකමේ සුවඳ අදටද දැනේ.

"මොනවද අනේ ෆෑන් එක දාගෙන උඩ බලාගෙන තාමත් කල්පනා කරන්නේ. වැඩ ඇරිලා ආපු ගමන් නේද? ඔය ඇඳුම් මාරුකරගන්නකෝ" බිරිඳගේ කටහඬින් මං තිගැස්සී ගියෙය. 21 වසකට එපිටදී වෛද්‍ය බාලක්‍රිෂ්ණන් අප විවාහ දිනයේදී තිළිණ කළ රන් පැහැයෙන් යුත් විදුලි පංකාව තවමත් කරකැවේ. එහෙත් මුලදී ඉන් නැගී සිසිලස වෙනුවට මට දැනුනේ හද දවාලන රස්නයකි. මා එය නිවාදමා කාමරයෙන් පිටවූයේය.



සටහන:
ලුතිනන් කර්නල්
පුචිත් චමින්ද එදිරිසිංහ

# පළමු 'Cast Master' පාඨමාලාව සාර්ථකව අවසන්







නයාරු පිහිටි විශේෂ බලකා සංග්‍රාමික කිමිදුම් පුහුණු පාසල වෙතින් පවත්වනු ලැබූ ප්‍රථම සමුද්‍ර හා ජලජ ක්‍රියාන්විත පාඨමාලාව වන 'Cast Master' පාඨමාලාව ශ්‍රී ලංකා ගුවන් හමුදාව සමග විශේෂ බලකාය ඒකාබද්ධව පසුගිය මැයි මස 4 වන දින ආරම්භ කර මැයි මස 9 වන දින අවසන් කරනු ලැබීය. විශේෂ බලකාය විසින් සමුද්‍ර හා ජලජ ක්‍රියාන්විත සිදුකිරීමේදී ගුවනින් ගොස් ක්‍රියාන්විත ස්ථානයන් වෙත නිවැරදිව බෝට්ටුවක් මතට පතිත කරවීමේ දැනුම හා නිවැරදිව ජලජ ක්‍රියාන්විත සිදුකිරීමත්, පිහිනීම හා කිමිදුම් පුහුණුව විශේෂ බලකා සාමාජිකයින් වෙත ලබාදීමේ අරමුණින් මෙම පාඨමාලාව පවත්වන ලදී. යුද්ධ හමුදාවේ පවතින එකම කිමිදුම් පුහුණු පාසල වන මුලතිව්, නයාරු ස්ථාපිත විශේෂ බලකා සංග්‍රාමික කිමිදුම් පුහුණු පාසලේදී පැවැත්වූ ප්‍රථම සමුද්‍රීය හා ජලජ ක්‍රියාන්විත පාඨමාලාව මෙය වේ. මෙම පුහුණු පාඨමාලාව විශේෂ බලකායේ නිලධාරියෙක් සහ සෙසුනිලයන් 15 දෙනකුගේ සහභාගීත්වයෙන් පැවැත්විණි.

# ඔරු පැදීමේ තරඟාවලියේ ශූරතාවය යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට







ශ්‍රී ලංකා ඔරු පැදීමේ ජාතික සංගමය විසින් සංවිධානය කරන ලද ජාතික ඔරු පැදීමේ (Canoeing, Kayaking) තරඟාවලිය - 2022 දියවන්නාව වැව් පරිශ්‍රයේදී ජුනි මස 3 දින සිට 5 දින දක්වා පැවති අතර, ඒ සඳහා සහභාගී වූ යුද්ධ හමුදා ක්‍රීඩකයින් තරඟාවලියේ සමස්ත ශූරතාවය දිනා ගැනීමට සමත් වූහ.

තරඟාවලිය සඳහා පිරිමි කාණ්ඩය නියෝජනය කරමින් සහභාගී වූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ක්‍රීඩකයින් රන් පදක්කම් 10 ක්, රිදී පදක්කම් 8 ක් සහ ලෝකඩ පදක්කම් 4 ක් දිනා ගනිමින් ශූරතාවය දිනාගත්හ. එමෙන්ම, ජාතික තරඟාවලියේ රන් පදක්කම් 8 ක්, රිදී පදක්කම් 2 ක් සහ ලෝකඩ පදක්කමක් දිනාගනිමින් ශූරතාවය හිමිකරගැනීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා ක්‍රීඩිකාවෝ ද සමත් වූහ.

පසුගිය වසර කිහිපය තුළ යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවෝ සෑම ඉසව්වකදීම ශූරතාව දිනාගනිමින් අඛණ්ඩව මෙම තරඟාවලිය ජය ගැනීමට සමත්වීම කැපීපෙනේ.



# ක්‍රීඩා විත්ති

## ජාතික සහ දකුණු ආසියානු නව වාර්තාවක්




ශ්‍රී ලංකා යුද්ධ හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ මාණ්ඩලික සැරයන් යුපුන් අබේකෝන් විසින් පසුගිය මැයි 26 වන දින ජර්මනියේ පැවති ජර්මානු විවෘත මලල ක්‍රීඩා ශූරතාවලියේදී මීටර් 100 විවෘත ධාවන ඉසව්ව තත්පර 10.06 ක කාලයක් වාර්තා කරමින් නව දකුණු ආසියානු වාර්තාවක් පිහිටුවීමට සමත් විය. ඒ ඔහු විසින්ම 2021 වසරේදී තැබූ තත්පර 10.15 ක වාර්තාව බිඳ දමමිනි. ඒ අනුව මාණ්ඩලික සැරයන් යුපුන් අබේකෝන් සියලුම දකුණු ආසියානු වාර්තාවන් බිඳ හෙළමින් මීටර් 100 ඉසව්ව ජයග්‍රහණය කර නව දකුණු ආසියානු වාර්තාවට හිමිකම් කියනු ලබයි.

## 'PATS' තරඟාවලියේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට රිදී පදක්කමක්




පාකිස්තානයේ ඛාරියන් (Kharian) ප්‍රදේශයේ පිහිටි පාකිස්තානු යුද්ධ හමුදා ජාතික ත්‍රස්ත මර්ධන මධ්‍යස්ථානයේදී පැවති 5 වන ජාත්‍යන්තර 'Pakistan Army Team Spirit (PATS)' තරඟාවලියට සහභාගී වූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා කණ්ඩායම රිදී පදක්කමක් දිනාගැනීමට සමත්වූහ. මෙවර තරඟාවලිය පසුගිය මාර්තු මස 3 වන දින සිට 13 වන දින දක්වා පැවති අතර, ඒ සඳහා නේපාලය, තුර්කිය, මොරොක්කෝව, උස්බෙකිස්තානය, බහරේන්, කෙන්යාව ඇතුළු රටවල් නියෝජනය කරමින් යුද්ධ හමුදා කණ්ඩායම් 16 කට වැඩි සංඛ්‍යාවක් තරග වැදුණි. උද්වේගකර තරග වට 30 කින් අනතුරුව මනා කායික හා මානසික හැකියාවකින් යුත් හොඳම කණ්ඩායම තෝරාගන්නා ලදී. කිලෝමීටර් 80 ක අති දුෂ්කර පා ගමන, ජල බාධක තරණ, බණ්ඩ වෙඩි තැබීමේ සරඹයන්, රැකසිට පහරදීම සහ රැකසිට පහරදීම වැළැක්වීමේ සරඹයන්, ගුවන් යානා අභ්‍යාසයන් සහ වෙහෙසකර පා ගමන් යනාදී තරග ඉසව් රැසකින් මෙම PATS තරඟාවලිය සමන්විත වේ. මෙවර තරඟාවලියට එක්වූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා PATS කණ්ඩායම සඳහා ශ්‍රී ලංකා පාබල හමුදාව, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව, ගජබා රෙජිමේන්තුව, විජයබාහු පාබල රෙජිමේන්තුව සහ යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව නියෝජනය කරමින් නිලධාරීන් තිදෙනකු සහ සෙසුනිලයින් අට දෙනකු සහභාගී වූහ.

# එතෙර දස්කම් පෑ යුද්ධ හමුදා බොක්සිං ශූරයෝ





'Eindhoven Box Cup - Netherland 2022' බොක්සිං තරගාවලිය නෙදර්ලන්තයේදී ජූනි මස 3 දින සිට ජූනි මස 6 දින දක්වා පැවති අතර, ඒ සඳහා කිලෝග්‍රෑම් 51 න් පහළ බර පන්තිය නියෝජනය කරමින් සහභාගී වූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා බොක්සිං ක්‍රීඩක 16 වන ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා බලකායේ මාණ්ඩලික සැරයන් බණ්ඩාර එම්වීඅයිආර්එස් එහි රිදී පදක්කමක් දිනාගැනීමට සමත්විය. තවද, ප්‍රංශයේ, පැරිස් නුවරදී මැයි මස 12 දින සිට 15 දින දක්වා පැවති 'LES Centuries International Boxing Tournament Paris - 2022' බොක්සිං තරගාවලිය සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව නියෝජනය කරමින් සහභාගී වූ 24 වන විජයබාහු පාබල රෙජිමේන්තුවේ ලාන්ස් කෝප්‍රල් ප්‍රසන්න පීඒආර් කිලෝ ග්‍රෑම් 57 බර පන්තිය නියෝජනය කර ප්‍රථම ස්ථානය හිමිකරගනිමින් මවු බිමටත්, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවටත් ඉමහත් කීර්තියක් අත්කර දෙන ලදී.

# යුද්ධ හමුදා කාන්තා හොකී ක්‍රීඩිකාව ඉන්දුනීසියාවේ දිදුලයි



ඉන්දුනීසියාවේදී ජූනි මස 6 වන දින සිට 14 දින දක්වා පැවති ආසියානු හොකී ශූරතා තරගාවලියේදී ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ සාමාන්‍ය සෙබළ (කාන්තා) එල්එස්ඩී පෙරේරා පසුගිය ජූනි මස 7 දින පැවති පළමු වටයේදී ඇයගේ ප්‍රතිවාදී කණ්ඩායම පරාජයට පත්කරමින් ජයග්‍රහණය හිමිකර ගැනීමට සමත් විය.

ඒ අනුව ඉන්දුනීසියාවේ ජකර්තා නුවර පැවති මෙම තරගාවලියේදී ශ්‍රී ලංකා හොකී කණ්ඩායම ගෝල 5 - 0 ක් ලෙසින් ලකුණු රැස්කරගමින් තරගාවලියේ ජයග්‍රහණය හිමිකර ගැනීමට සමත්වූ අතර, එහිදී "දක්ෂතම" ක්‍රීඩිකාවට හිමි කිරුළ ශ්‍රී ලංකා කණ්ඩායම නියෝජනය කළ යුද්ධ හමුදා කාන්තා බලකායේ සාමාන්‍ය සෙබළ (කාන්තා) එල්එස්ඩී පෙරේරා සමත් වූවාය.

# යුද්ධ හමුදා රට හරහා දිවීමේ ක්‍රීඩකයින් ඉන්දියාවේදී දස්කම් දක්වයි

ඉන්දියාවේ නාගලන්ඩ් ප්‍රදේශයේ පැවති ආසියානු රට හරහා දිවීමේ ශූරතාවලියට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගී වූ 5 වන ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ සැරයන් ආර්එම්එස් පුෂ්පකුමාර රිදී පදක්කමක් දිනාගැනීමට සමත් විය. එසේම, එම තරගාවලියට සහභාගී වූ තරගකරුවන් තිදෙනකුගෙන් සමන්විත ශ්‍රී ලංකා යුද්ධ හමුදා පිරිමි කණ්ඩායම තරගාවලියේ සමස්ත අනුශූරතාවය හිමිකර ගැනීමටද සමත් වූහ.



තවද, මෙම තරගාවලිය නියෝජනය කරමින් සහභාගී වූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා කණ්ඩායමේ සෙබළියන් දෙදෙනකු සමස්ත කාන්තා අංශයේ අනුශූරතාවය දිනාගැනීමට සමත්වීමද කැපීපෙනේ.


5 වන ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ සැරයන් ආර්එම්එස් පුෂ්පකුමාර, 5 වන ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ බොම්බාඩියර් කේ සම්මුගේෂ්වරන් හා 19 වන ගැමුණු හේවා බලඇණියේ කෝප්‍රල් පීඑම්එස් විජයකුමාර විසින් පිරිමි සමස්ත අනුශූරතාව ද, 11 වන ශ්‍රී ලංකා සංඥා බලකායේ සංඥා සෙබළ කාන්තා ඒඑම්එන් නිදර්ශණි හා 2 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකායේ ආධුනික කාන්තා සෙබළ එච්එම්සීඑස් හේරත් විසින් කාන්තා සමස්ත අනුශූරතාව ද දිනාගැනීමට සමත් වූහ.




# අවි දරන දෑත්වල මනුස්සකමේ අගය

පසුගියදා ඇති වූ ගංවතුර තත්වය හේතුවෙන් දිවයිනේ ප්‍රදේශ රැසක ජන ජීවිතයට තදබල බලපෑම් එල්ල විය. විශේෂයෙන්ම ඉන් වඩාත් පීඩාවට පත්වූයේ එවක පැවති අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයට පෙනීසිටි සිසු දරු දැරියන්ය. එහිදී ඔවුන්ගේ ප්‍රවාහන කටයුතු මුළුමනින්ම ඇනහිටි අතර, විභාග මධ්‍යස්ථාන පැවති ඇතැම් පාසල් පවා සැළකිය යුතු ලෙස ජලයෙන් යටවිය.

එහිදී, වහා මැදිහත් වූ යුද්ධ හමුදාව සිය භටපිරිස් යොදවා එම දරු දැරියන්ට ආරක්ෂිතව ප්‍රවාහන පහසුකම් සැලසීමටත්, ජලයෙන් යටවූ විභාග මධ්‍යස්ථාන වෙනුවට ක්ෂණිකව වෙනත් විභාග ශාලා සකස් කරදීමටත්, එම දරු දැරියන්ට අවශ්‍ය ආහාරපාන පවා ලබාදීමටත් වගබලා ගත්තේය.





"විපත් පැමිණෙන්නේ අනපේක්ෂිතව වුවද අපේක්ෂිත ලෙස ජනතාව රැකගැනීමට යුද්ධ හමුදාව කිසිසේත් පසුබට නොවේ. අවි දැරූ දෑත් හිමි හදවත්වල පිරුණු මනුස්සකම් අගය කොතරම්ද යන්න ඔවුහු යළි යළිත් මේ හරහා පසක් කොට ඇත"









# කිසාගෝතමිය

ඇය කිසාගෝතමිය නම් වූවාය. උපතින්ම කෘෂ හෙවත් සිහින් සිරුරකට හිමිකම් කියූ බැවින් කිසාගෝතමිය විය. ඇය දිළිඳු දූරියකි. එබැවින් විවාහ වූ පසුවද ඇයගේ දුගී දුප්පත්කම් හේතුවෙන්ම සැමියාගේ පාර්ශ්වයේ ඥාතීන්ගේ අඩත්තේට්ටම් හා නිග්‍රහයට නිරතුරුව භාජනය වූවාය. එසේ වුවද වාසනාවකට මෙන් ඇය පුතකු බිහිකළ බැවින් මෙතෙක් අපහාස කළ පාර්ශ්වයන්ගේ ගෞරවයටත් ප්‍රසාදයටත් පාත්‍ර විය. ඇගේ කුළුඳුල් දරුවා කාගේත් අවධානයට හා ආදරයට ලක්ව දුවපැන සෙල්ලම් කරන අවධියේ එක් දිනක් හදිසියේ මරණයට පත්විය. මෙම මරණය කිසාගෝතමියට කෙසේවත් දරාගැනීමට නොහැකි විය. මේ හේතුවෙන් ඇය ඉමහත් කම්පනයට පත්වූ අතර, දරාගැනීමට නොහැකි වේදනාවෙන් කැමොර දුන්නාය. දරුවා නිසා තමා ලද සහනයත්, සතුටත්, ප්‍රීතියත් අවසන් වනු දුටු කිසාගෝතමිය දැඩි මානසික පීඩාවකට ලක්වූවාය. මෙවැනි තත්ත්වයකට පත් බොහෝ දෙනකුට සිදුවන ආකාරයෙන්ම ඇය ද යම් මානසික විකෘතිතාවයක් ප්‍රකට කරමින් දරුවාද කරපින්නාගෙන මියගිය තම පුතුට ප්‍රතිකාරයක් පතා හිස හැරුණු අතේ දිවගියාය. දරුවාගේ ක්ෂණික මරණය පිළිගැනීමට හෝ දරාගැනීමට ඇය අපොහොසත් වූවාය. ඇය මෙම ව්‍යාධි තත්ත්වයෙන් පෙළෙමින් ගෙයක් ගානේ නගරයක් නගරයක් ගානේ ගියාය. දරුවාට නැවත පණ ලබාදෙන ලෙස ඉල්ලා සිටියාය. බොහෝ මිනිසුන් ඇයව දුටුවේ පිස්සියක් ලෙසිනි. එබැවින් බැණ වැදුණේය. ගල්මුල්වලින් දමා ගැසුවේය.
මේ හේතුවෙන් ඇය තව තවත් විකෘතිතාවයට පත් වූවාය. එනමුදු එක් නගරයක විසූ නැණවත් පුද්ගලයකු ඇය අමතා නිසි ප්‍රතිකාරයක් ලබාගැනීමට නම් නුදුරේ වැඩ වසන බුදුරජාණන් වහන්සේ වෙත යන ලෙස දන්වා සිටියේය. කිසාගෝතමිය ඉමහත් බලාපොරොත්තු සහිතව බුදුන් වහන්සේ සොයා ගියාය.

බුදුන් වහන්සේට කිසාගෝතමිය පත්ව සිටි මානසික ව්‍යාධි තත්වය අවබෝධ කරගැනීමට අපහසු නොවීය. උන්වහන්සේ ඇය අමතා ''නැගෙණියනි දරුවාට ප්‍රතිකාර පිණිස නගරයට ගොස් නොමළ ගෙයකින් අබ මිටක් රැගෙන එන්න'' යි පවසා ඇය පිටත්කර හැරි සේක. කිසාගෝතමිය ඉමහත් සතුටට පත්වී දිව ගියාය. ඇය නගරයේ පළමු ගෙට ගියාය. ''මගේ දරුවාට ප්‍රතිකාර ගැනීමට අබ මිටක් අවශ්‍යයි. බුදුන් වහන්සේ එය රැගෙන එන ලෙස මාහට දන්වූවා''.

''මොහොතක් ඉන්න. කඩිනමින් රැගෙන එන්නම්'' නිවැසියා පැවසීය.

ඉන්න... මේ නිවසේ කවුරුන් හෝ මියගොස් සිටීද?

ඔව්... මේ නිවසේ සිටි අපගේ පරපුරට අයත් මියගිය ගණන කිවහැක්කේ කාටද? මීට මසකට කලිනුත් අපගේ වැඩිහිටියකු මියගියා.

එහෙමද? ඇය නැවතත් ඊලඟ නිවසට දිව ගියාය. මෙසේ ඇය අබ මිටක්

සොයාගිය නිවෙස් ප්‍රමාණය අති මහත්ය. ඒ සෑම නිවසකින්ම ලැබුණේ එක හා සමාන පිළිතුරකි. මෙසේ ගෙන්ගෙට ගොස් විමසීමේදී ඇය යථා තත්ත්වයට පත්වූවාය. මරණය යනු මෙලොව ඉපදෙන කාහටත් පොදු දෙයක් බවත්, එය තමාට හෝ තම පුතුට පමණක් හිමිවන දෙයක් නොවන බවත්, යථා පරිදි අවබෝධකොට ගත්තාය. මෙම ලෝක ධර්මතාවය අනුව මෙම නගරයට හෝ සමස්ත රට වැසියන්ට පමණක් නොව මුළු විශ්වයේ සියලු ඉපදෙන්නන්ට මරණය හිමිවන බව තේරුම් ගත් ඇයට තම ශෝකය තුනීකර ගන්නට හැකිවිය.

තමාට ගෙයින් ගෙට ගොස් නොමළ ගෙයකින් අබ මිටක් සොයාගෙන පැමිණෙන ලෙස බුදුන් වහන්සේ පිටත්කර හැරියේ මරණයේ මෙම යථා ස්වරූපය අවබෝධකර දීමට නොවේදැයි කිසාගෝතමියට වැටහුණි. ඇය සොහොනට ගොස් දරුවා මිහිදන්කර නැවත බුදුන් සොයා ගියේය.''නැගෙණියනි, අබ සොයා ගත්තේද?'' බුදුන් වහන්සේ විමසීය.

''ස්වාමිනී... මා ගෙයින්ගෙට ගොස් අබ ඉල්ලා සිටියෙමි. ඇති තරම් අබ සොයා ගැනීමට හැකිවූවත්, නොමළ ගෙයකින් අබ මිටක් සොයා ගැනීමට මාහට නොහැකි විය. එබැවින් මම අබ සෙවීම අත්හලෙමි... නුඹ වහන්සේ මා යථාතත්වයට පත්කළ සේක. මා නුඹ වහන්සේ ගේ සරණ යමි.'' කිසාගෝතමිය පැවසුවාය.

මෙතෙක් මෙලොව බිහිවූ ශ්‍රේෂ්ඨතම මනෝ වෛද්‍යවරයා බුදුන් වහන්සේය. ''ආරෝග්‍යා පරමා ලාභා'' වශයෙන් දේශනාකර වදාළ උන්වහන්සේ මෙලොව ජීවත්වන්නන්ට උතුම්ම ලාභය  නිරෝගීකම බව දේශනාකර වදාළේය. එසේම යම් අයකුගේ නිරෝගීකම නැති කරන රෝගී තත්ත්වයන් මානසික රෝග හා කායික රෝග වශයෙන් කොටස් දෙකක් පවතින බැව් පෙන්වා දුන්නේය. ඒ අනුව පෘතග්ජන මිනිසුන් මුහුණදෙන මානසික රෝගී තත්ත්වයේ යථා ස්වභාවය හැඳින නිසි ප්‍රතිකාර ලබාදීමටද උන්වහන්සේ ක්‍රියාකර ඇත්තේ දක්ෂතම මනෝ වෛද්‍යවරයකු ලෙසනි.

තම එකම පුතු මළ ශෝකයෙන් දැඩි මානසික කම්පනයකට හා මානසික විකෘතිතාවයට පත්වූ කිසාගෝතමියට සෘජු උපදේශනයක් නොව ප්‍රායෝගික ක්‍රියාකාරකමක් මගින් චතුරාකාරව ප්‍රතිකාරයක් හා ගැඹුරු අවබෝධයක් ලබාදීමක් මෙහිදී සිදුවී ඇත. තම පුතු මියගිය කරුණ මානසිකව පිළිගත නොහැකිව ඒ පිළිබඳ අතාර්තික විශ්වාසයක් ගොඩනගාගෙන වෙහෙසුණු කිසාගෝතමියට එම අතාර්තික විශ්වාසය ක්‍රමානුකූලව දුරුවෙන ආකාරයේ ඉතා සාර්ථක ක්‍රමෝපායන් මෙහිදී භාවිතා වී ඇත. මනෝ

> **ස්වාමිනී... මා ගෙයින්ගෙට ගොස් අබ ඉල්ලා සිටියෙමි. ඇති තරම් අබ සොයා ගැනීමට හැකිවූවත්, නොමළ ගෙයකින් අබ මිටක් සොයා ගැනීමට මාහට නොහැකි විය. එබැවින් මම අබ සෙවීම අත්හලෙමි... නුඹ වහන්සේ මා යථාතත්වයට පත්කළ සේක. මා නුඹ වහන්සේ ගේ සරණ යමි**

චිකිත්සක දෘෂ්ටිකෝණයෙන් බලන විට මෙම සිදුවීම් තුළ මනෝවිද්‍යාත්මක වටිනාකම් රාශියක් දැකගත හැකිය.

බුදුරාජාණන් වහන්සේ කිසාගෝතමියට අනුදැන වදාළේ ප්‍රායෝගික ක්‍රියාකාරකමකි. කිසාගෝතමිය ඒ වනවිට පත්ව සිටි මානසික තත්ත්වය සෘජු උපදේශනයකට සුදුසු තත්ත්වයක් නොවේ. කිසාගෝතමිය ගේ මානසික අසමතුලිත තත්ත්වය දුරු කිරීමට සරල ක්‍රියාකාරකමක් තෝරාගැනීම මෙහි ඇති එක් විශේෂත්වයකි.

කිසාගෝතමියගේ ක්‍රියාකාරකම ලෙස අබ සොයාගෙන ඒමට නිර්දේශ කිරීම තුළද විශේෂ වැදගත්කමක් ඇත. අබ යනු ඖෂධීය ගුණයක් සහිත දෙයක් සොයාගෙන එන ලෙස නිර්දේශ කළ විට කිසාගෝතමිය එම ක්‍රියාකාරකම විශ්වාස කිරීමට පෙළඹේ. එසේම අබ ඖෂධයක් සේම කුළුබඩුවක් වන නිසා කිසාගෝතමියට නගරයේ සෑම නිවසකටම යෑමට අවස්ථාව සැළසුනි. ඒ හරහා බුදුරදුන්ට අවශ්‍ය පණිවිඩය සෑම නිවසකින්ම කිසාගෝතමියට අසන්නට ලැබුණි. එනම්, මරණය තමන්ගේ පුතුට සීමාවූවක් නොව කාටත් පොදු සාමාන්‍ය ධර්මතාවයක් බවයි. ඖෂධීය ගුණයත්, සෑම නිවසකම සුලභවීමත් යන ලක්ෂණ දෙකම දරණ අබ මේ ක්‍රියාකාරකම සඳහා තෝරාගැනීම ඒ අනුව පුළුල් මනෝවිද්‍යාත්මක අර්ථයකින් යුතුය.

මෙම ක්‍රියාකාරකමේ ස්වභාවය අනුව කිසාගෝතමිය චිකිත්සාවට ලක්වන්නේ පුළුල් සමාජ පරිසරයක් තුළය. වැරදි විශ්වාසය දුරුවීම  හා ගැඹුරු අවබෝධයක් ලැබීම ඇයගේ අභ්‍යන්තරය තුළ සිදුවූවත්, මේ සඳහා අවකාශ සැලසෙන්නේ සමාජ පරිසරය තුළය. එය හුදෙකලා පරිසරයක සිදුවන්නක් නොවේ. මෙවැනි මානසික කම්පනයකට පත්වූ කෙනකු හුදෙකලා නොකර, සමාජ ආරක්ෂාව ලබාදීම ඉතා වැදගත්ය. බොහෝ නිවෙස්වලට ඇය යෑම, ඒ නිවෙස්වල අය සමග කතා කිරීම, ඒ අයගේ මියගිය අය ගැන තොරතුරු පැවසීම යන ක්‍රියාකාරකම් තුළින් කිසාගෝතමියට සමාජ පරිසරය හා මුහුවීමේ අවස්ථාවක් සැලසේ. ඒ අතරතුර ඇයගේ මානසික තත්ත්වය හා අවබෝධය වෙනස් වේ. බුදුරදුන් අපේක්ෂා කළ ඇගේ මානසික පරිවර්තනය සමාජ පරිසරය තුළ සිදුවීමට අවස්ථාව සැළසීමද, මේ සිදුවීමේ විශේෂ වැදගත්කමකි. (බෞද්ධ මනෝවිද්‍යාව)

මහණෙනි... මම රාගාදී කෙලෙස් මුල් උදුරාදමන ශල්‍ය වෛද්‍යවරයෙක්මි - බුදුරාජාණන් වහන්සේ (ඉතිවුත්තක පාලිය)



කර්නල් එම්ජීපී පෙරේරා
(විශ්‍රාමික)

# වියළි සලාක පරිත්‍යාගයක්





හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ජීවත්වන ආර්ථික අපහසුතාවලින් පෙළෙන පවුල් 600 ක් සඳහා වියළි ආහාර පාර්සල් තොගයක් බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජූනි 08 වන දින 12 වන පාබල සේනාංක හමුලපිරිස් විසින් පවත්වන ලදී. තලගල ශ්‍රී සිද්ධාර්ථ පදනම හා කළුතර ශාසනාරක්ෂක මණ්ඩලය ඒ සඳහා අනුග්‍රහය දක්වන ලදී. 12 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම උත්සවය සඳහා 122 වන පාබල බලසේනාධිපති, නිලධාරීන්, සෙසුනිලයින් සහ එම ප්‍රදේශයේ රාජ්‍ය නිලධාරීන් පිරිසක් සහභාගි වූහ.

# බැඩ්මින්ටන් පුහුණු වැඩසටහනක්





55 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්කේයූපී ගුණරත්න ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ගේ මගපෙන්වීම හා උපදෙස් මත යාපනය පාසල් ළමුන් හා තරුණ තරුණියන් අතර බැඩ්මින්ටන් ක්‍රීඩාව ප්‍රචලිත කිරීමේ අරමුණින් බැඩ්මින්ටන් පුහුණු වැඩසටහනක් ඉකුත් ජූනි 11 වන දින 55 වන පාබල සේනාංක ශාස්ත්‍ර ක්‍රීඩාගාරයේදී පැවැත්විණ.

යාපනය අර්ධද්වීපය තුළ පාසල්, දිස්ත්‍රික් සහ පළාත් මට්ටමේ තරග සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණු කිරීම හා ඔවුන් ජාතික තලයට රැගෙන ඒමේ අරමුණින් මෙම පුහුණු වැඩසටහන සංවිධානය කෙරිණ. මෙම සැසිය සඳහා පේදුරුතුඩුව, නගර්කෝවිල්, මරුදන්කේනි, අයියකච්චි, පලෙයි සහ කඩෙයිකාඩු ප්‍රදේශවල පාසල් සහ ක්‍රීඩා සමාජ නියෝජනය කරමින් 35 දෙනකු සහභාගි වූහ. තවද මෙම අවස්ථාවට 55 වන පාබල සේනාංකාධිපති, මරුදන්කේණි ප්‍රාදේශීය ලේකම් ඇතුළු පිරිසක් සහභාගි වූහ.

# නිසට සෙවණක්



621 වන පාබල බලසේනා බලප්‍රදේශයට අයත් අංක 36, කහටගොල්ලෑව පදිංචි අඩු ආදායම්ලාභී පවුලක් වන එච්ඒ සුරේෂ් කුමාර වෙත නව නිවසක් පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් ජූනි 10 වන දින සිදුකෙරිණ. 14(සේවා) ශ්‍රී ලංකා පාබල හමුදා හටපිරිස් විසින් මෙම නිවස ඉදිකිරීම සඳහා ශ්‍රම දායකත්වය ලබාදෙනු ලැබූහ. මෙම අවස්ථාවට 621 වන පාබල බලසේනාවේ හිටපු බලසේනාධිපති, 14(සේවා) ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරී ඇතුළු පිරිසක් සහභාගි වූහ.

# ලේ දන්දීමේ වැඩසටහනක්





144 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් කේඑම්ව් කොඩිතුවක්කු ගේ උපදෙස් පරිදි 10 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ අණදෙන නිලධාරී ගේ අධීක්ෂණය යටතේ සංවිධානය කෙරුණු ලේ දන්දීමේ වැඩසටහනක් ඉකුත් ජූනි 03 වන දින අකුරේගොඩ අභිනවාරාම විහාරස්ථානයේදී පැවැත්විණ. යුද්ධ හමුදා සාමාජිකයින් සහ සිවිල් අයවලුන් 120 දෙනකුගේ දායකත්වයෙන් පැවති මෙම ලේ දන්දීමේ වැඩසටහනේදී නාරාහේන්පිට රුධිර පාරවිලයන මධ්‍යස්ථානය වෙත රුධිරය පරිත්‍යාග කෙරුණු අතර, ඒ සඳහා නාරාහේන්පිට රුධිර පාරවිලයන මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය පූර්ණ සහය ලබාදෙන ලදී.

# දිළිඳු පවුලක් වෙත නව නිවසක්





651 වන පාබල බලසේනාවට අයත් තුනුක්කායි, උයිලන්කුලම් හි ආර්ථික දුෂ්කරතා රැසකට මුහුණදෙමින් ජීවත්වන අකිලන් දර්ශිකා මහත්මියට පදිංචියට ස්ථිර නිවසක් ඉදිකර භාරදීම ඉකුත් මැයි 26 වන දින 65 වන පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේජ් සමරසිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ. 651 වන පාබල බලසේනාධිපති බ්‍රිගේඩියර් කේඑම්එන් බංඩාර ආර්එස්පී ගේ පුද්ගලික ඉල්ලීම පරිදි දකුණු ඕස්ට්‍රේලියාවේ "වෙල්බීන්" සංවිධානය හා එහි පදිංචි ශ්‍රී ලාංකික ඉංජිනේරුවන්ගේ මූල්‍යමය අනුග්‍රාහකත්වය මත මෙම නිවස ඉදිකළ අතර, 17 (සේව) ශ්‍රී ලංකා පාබල හමුදා හටපිරිස් විසින් ඊට ශ්‍රම දායකත්වය ලබාදෙන ලදී. තවද, එදින එම ප්‍රදේශයේ පාසල් දරුවන් සඳහා පාසල් උපකරණ, රසකැවිලි පාර්සල් සහ නිවස අවට පදිංචිකරුවන් වෙත දිවා ආහාර පාර්සල් බෙදාදීමද සිදුකෙරිණ. මෙම අවස්ථාවට 651 වන පාබල බලසේනාධිපති, 17 (සේව) ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරී ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# කතරගම පාද යාත්‍රා බැතිමතුන් වෙත පරිත්‍යාගයක්



යාපනය බල ප්‍රදේශයේ හින්දු බැතිමතුන් විසින් තොණ්ඩමනාරු ශ්‍රී සෙල්ව සන්නදි මුරුගන් කෝවිල් පරිශ්‍රයේ සිට කතරගම පූදබිම දක්වා ගමන් ගන්නා වාර්ෂික පාද යාත්‍රාව ඉකුත් ජූනි 04 වන දින ආරම්භ කෙරුණු අතර, එම පාද යාත්‍රාවට 52 වන පාබල සේනාංක බල ප්‍රදේශයේදී තේ පැන් සංග්‍රහයක් ලබාදෙන ලදී. එහි පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්එම්යූ හේරත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී ගේ උපදෙස් මත ඉකුත් ජූනි 06 වන දින මෙම මාහැඟි කටයුත්ත සිදුකෙරිණ.





# යුද්ධ හමුදාවට නෑකම් කියන සිංහල සිනමාවේ ජ්‍යෙෂ්ඨතම රංගධරයා

# අමරසිරි කලංසූරිය



සටහන:
ලුතිනන් දුමින්ද සෙනරත්
ශ්‍රීලයුපොදුසෙබ,
ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය

**හන්තානේ කතාව, යස ඉසුරු, අහස් මාලිගා, අහස් ගව්ව, පූජා, අපේක්ෂා, පොඩි විජේ ආදී සිංහල සිනමාවේ ජය කෙහෙලි නැංවූ චිත්‍රපට රැසකට මෙන්ම ශ්‍රී ලාංකික ටෙලි නාට්‍ය කලා ඉතිහාසයේ ප්‍රථම ප්‍රාසංගික ටෙලි නාට්‍ය වන "දිමුතු මුතු" ටෙලි නාට්‍යයෙන්ද සිය අද්විතීය රංගන කුසලතාවයන් පිළිඹිබු කළ ප්‍රවීණ රංගනවේදියකු වන අමරසිරි කලංසූරිය කලක් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේද සේවය කර ඇත. මෙම ප්‍රතිභාපූර්ණ කලාකරුවා සිය කලා දිවිය තුළ සම්මාන රැසකින්ද පිදුම් ලබා ඇති අතර, ඔහු සමගින් පැවති විශේෂ පිළිසඳරක් ඇසුරින් රණවිරුවා පාඨක ඔබ සැමගේ රසවින්දනය උදෙසා මෙම විශේෂාංග ලිපිය සකස් කෙරිණි.**

**ප්‍රශ්නය -: එක්තරා අවධියකදී ඔබ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට සාමාන්‍ය සෙබළෙකු වශයෙන් එක්වෙනවා. ඒ පිළිබඳව යමක් සඳහන් කළහොත්?**

පිළිතුර -: මා යුද්ධ හමුදාවේ සිටියදී රාජකාරිය අකුරටම ඉටුකළ පුද්ගලයෙක්. මම යුද්ධ හමුදාවට එක්වුයේ වර්ෂ 1958 දී 2 වන (ස්වේච්ඡා) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට සාමාන්‍ය සෙබළකු වශයෙනි. යුද්ධ හමුදාවට බැඳීමට මා ආවත් මගේ උස ප්‍රමාණය නියමිත ප්‍රමාණයට වඩා මදිවීම නිසා සම්මුඛ පරීක්ෂණයෙන් සමත්වීම පිළිබඳව මා සිටියේ අවිනිශ්චිත බවකින්. කෙසේ වුවත් පාසල් සමයේ සිට බොක්සිං, මළල ක්‍රීඩා මෙන්ම ශිෂ්‍යභට බළකායේද මා කටයුතු කර තිබූ නිසා එහි සුදුසුකම්ද සැලකිල්ලට ගනිමින් මා සම්මුඛ පරීක්ෂණයෙන් සමත් කරවීමට සම්මුඛ පරීක්ෂක මඩුල්ලේ සිටි නිලධාරීන් කටයුතු කර තිබුණා. ඒ වගේම දියතලාවේ පැවති මූලික පුහුණුවීම්වලින් පසු එම කණ්ඩායමේ ප්‍රගුණ වෙඩික්කරු ශූරතාවය දිනාගැනීමට ද මා සමත් වුණා. මා යාපනය ඇතුළු දිවයිනේ ප්‍රදේශ කිහිපයක සේවය කර ලාන්ස් කෝප්‍රල්වරයකු දක්වා උසස්වීම් ද ලැබුවා. එවකට කර්නල්වරයකු වූ කොබ්බෑකඩුව මෙන්ම බ්‍රිගේඩියර්



අමරසිරි කලංසූරිය ශූරීන් එවකට යුද්ධ හමුදාවේ කෝප්‍රල්වරයෙකු වශයෙන් කටයුතු කළ අවධියේ ලබාගත් ඡායාරූපයක්.

පානබොක්කේ යන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් යටතේත් මා සේවය කර තිබෙනවා. එමෙන්ම සය වසරක හමුදා සේවයකින් පසු මා සක්‍රිය හමුදා සේවයෙන් ඉවත්වුනේ සිනමා රංගනයට වරම් ලැබීමෙන් අනතුරුවය. ඇත්තෙන්ම යුද්ධ හමුදාවෙන් මා ලැබූ පන්නරය පසුකාලීනව මගේ සිනමා දිවිය තුළ මා ලද ජයග්‍රහණයන් සියල්ලටම ඉමහත් රුකුලක් වූවා.

**ප්‍රශ්නය -: ඔබ එක්තරා වකවානුවක සිංහල සිනමාවේ ජනප්‍රියම නළුවකුව සිටියා. එමෙන්ම ඉන්පසු ඔබව සිනමා නිර්මාණයකින් යළි දැකගත හැකි වූයේ උදයකාන්ත වර්ණසූරිය අධ්‍යක්‍ෂණය කළ "දිය යට ගින්දර" චිත්‍රපටය තුළින්... මෙසේ වීමට හේතුව කුමක්ද?**

පිළිතුර -: සිංහල සිනමාව තුළ මේ තත්ත්වය උදාවූයේ මට පමණක් නෙවෙයි. ධර්මසේන පතිරාජ, ගාමිණී ෆොන්සේකා, ලෙස්ටර් ජේම්ස් පීරිස් වැනි සිනමාවේ යෝධයන්ව සිටි අයටත් මේ තත්වය උදාවුණා. අනික විදේශීය රටවල වගේ වෘත්තීය මට්ටමින් සිනමා කර්මාන්තයේ යෙදීමට අපේ රටේ නළු නිලියන්ට වාසනාවක් නැහැ. පූර්ණ කාලීනව සිනමා කර්මාන්තයේ යෙදුණහොත් ආර්ථික අපහසුකම්වලට මුහුණදීමට සිදුවන නිසා අපේ සිනමා ශිල්පීන්ටත් අද සිදුවෙලා තියෙන්නෙ වෙනත් රැකියාවක් හෝ ව්‍යාපාරයක් කරන ගමන් සිනමා කර්මාන්තයේ නියැලීමටය. ඉතිං මාවත් ඔය වගේ සිනමා කර්මාන්තයෙන් විසිවෙලා ගිහින් තිබූ යුගයක උදයකාන්ත වර්ණසූරිය මහතා මට කථා කරල තිර පිටපතක් පෙන්වූවා. පිටපත බලපුවාම හොඳයි කියල හිතුණ නිසා ටෝනි රණසිංහ, සනත් ගුණතිලක වගේම අවලා අලස් වගේ අපේ සහෝදර කලා ශිල්පීන් හා ශිල්පිනියන් එම නිර්මාණයට දායක වී සිටි නිසා "දියයට ගින්දර" චිත්‍රපටයේ එම චරිතය භාරගැනීමට මා පැකිලුනේ නැහැ.

**ප්‍රශ්නය -: ඔබ සිනමාවට පැමිණි මුල් අවධිය පිළිබඳව යමක් සඳහන් කළහොත්?**

පිළිතුර -: ඇත්තෙන්ම කියනවානම් මම ජීවිතය පටන් ගත්ත මුල් කාලයේ රඟපෑමේ ආසාවට නෙමෙයි. ජීවිතයේ උපරිම දුකක් විඳපු කෙනෙක් මම. ඉතිං චිත්‍රපටිවල රඟපානවට වැඩිය මට තිබුණේ ජීවත්වීමේ අරගලයයි. ඒ නිසාම උදේ ඉඳන් එදා වේල සොයාගන්න විශාල ජීවන සටනක නියැලෙන්නට මට සිද්ධ වුණා. බඩගින්නේ සිටි දවස් අනන්තයි. ඇතැම් දවස්වල බඩගින්න උහුලගන්න බැරුව මඤ්ඤොක්කා අල හාරලා තම්බල කාපු දවසුත් තිබුණා. ඔය අවධියේ මගේ පාසල් මිතුරකු වූ ධර්මසේන පතිරාජයන් මාව මුණගැහෙන්න ඇවිත් විශ්වවිද්‍යාල කතාවක් තේමා කරගත් චිත්‍රපටයක් නිර්මාණය කරන බවත්, මම වගේ අයට එහි ගැලපෙන චරිත තියෙන නිසා එම චිත්‍රපටයේ සම්මුඛ පරීක්‍ෂණයක් සඳහා පැමිණෙන ලෙසත් මට දැන්වූවා. ඒ අනුව කොළඹ ජුබිලි ශාලාවේදී එකළ පැවති සම්මුඛ පරීක්‍ෂණයේ එම චිත්‍රපටියට දෙදෙනකු තෝරාගත්තා. එක්කෙනෙක් විජය කුමාරතුංග. අනික් කෙනා මම. එම චිත්‍රපටය තමයි "හත්හාරෙ කතාව".

> **"මා යුද්ධ හමුදාවේ සිටියදී රාජකාරිය අකුරටම ඉටුකළ පුද්ගලයෙක්. මම යුද්ධ හමුදාවට එක්වූයේ වර්ෂ 1958 දී 2 වන (ස්වේච්ඡා) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට සාමාන්‍ය සෙබළකු වශයෙනි. යුද්ධ හමුදාවට බැඳීමට මා ආවත් මගේ උස ප්‍රමාණය නියමිත ප්‍රමාණයට වඩා මදිවීම නිසා සම්මුඛ පරීක්‍ෂණයෙන් සමත්වීම පිළිබඳව මා සිටියේ අවිනිශ්චිත බවකින්. කෙසේ වුවත් පාසල් සමයේ සිට බොක්සිං, මළල ක්‍රීඩා මෙන්ම ශිෂ්‍යභට බළඇණියේද මා කටයුතු කර තිබූ නිසා එහි සුදුසුකම්ද සැලකිල්ලට ගනිමින් මා සම්මුඛ පරීක්‍ෂණයෙන් සමත් කරවීමට සම්මුඛ පරීක්‍ෂක මඩුල්ලේ සිටි නිලධාරීන් කටයුතු කර තිබුණා. ඒ වගේම දියතලාවේ පැවති මූලික පුහුණුවීම්වලින් පසු එම කණ්ඩායමේ ප්‍රගුණ වෙඩික්කරු ශූරතාවය දිනාගැනීමට ද මා සමත් වුණා. එමෙන්ම යාපනය ඇතුළු දිවයිනේ ප්‍රදේශ කිහිපයක සේවය කළ මා ලාන්ස් කෝප්‍රල්වරයකු දක්වා උසස්වීම් ද ලැබුවා. එවකට කර්නල්වරයකු වූ ඩෙන්සිල් කොබ්බෑකඩුව මෙන්ම බ්‍රිගේඩියර් පානබොක්කේ යන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් යටතේත් සේවය කිරීමට මට වාසනාව ලැබුණා."**



**ප්‍රශ්නය -: විජය කුමාරතුංග ඔබ හා පැවති සමීප සබැඳියාව පිළිබඳ යමක් සඳහන් කළහොත්?**

පිළිතුර -: විජය කුමාරතුංගයත් මට මුලින්ම හම්බවුණේ "හන්තානේ කතාව" චිත්‍රපටයට නළු නිළියන් තෝරාගන්න සම්මුඛ පරීක්ෂණයක් පැවත්වූ දවසේදිය. එදා ඒ සම්මුඛ පරීක්ෂණයට පන්සීයක් පමණ තරුණ තරුණියන් පිරිසක් පැමිණ සිටියා. අන්තිමේ විජය, ස්වර්ණා, සෝබනී ඇතුළු තවත් පිරිසක් එම චිත්‍රපටය වෙනුවෙන් තෝරාගනු ලැබුවා. ඉතිං ඔය විදියට ආරම්භ කළ අපේ සිනමා ජීවිතවල මුල්ම කාලවලදී අපට එතරම් මුදලක් ලැබුණේ නැහැ. ඉතිං මුල් යුගයේම කාටවත් අතනොපා ජීවත්වෙන්න ඕනි නිසාම මමත් විජයත් ඒ කාලේ රෙදි බිස්නස් එකකුත් පටන් ගත්තා. ඉතිං ඒ කාලේ කොටුව, පිටකොටුව ආදී ප්‍රදේශවලින් කලිසම්, කමිස, ඩෙනිම් ආදිය ලාභයට අරගෙන ඒවා තවත් ලාභ තියාගෙන මහනුවර, කටුගස්තොට ආදී පැතිවල ගෙයින් ගෙට ගොස් අපි වෙළඳාම් කළා. ඉතිං අපෙන් වැඩිපුරම කමිස, කලිසම් මිලදී ගත්තේ තරුණියන්. ඔය කාලෙ විජය කුමාරතුංගගේ තරුණම කාලෙ. කුමාරයෙක් වගේ ලස්සනයි. මට උදව්වට එනවා. කමිස කලිසම් හොයන්න පිටකොටුව පුරාම ඇවිදල හොඳටම මහන්සි වෙච්ච දවස්වලට විජයත් මමත් කොහේහරි හෝටලයකට රිංගලා සයිවර් පාරක් දාලා, ප්ලේන්ටියක් බීලා කොටුව ඉස්ටේෂමේ බංකුවක් උඩ නිදාගත්ත දවසුත් තිබුණා.

**ප්‍රශ්නය -: ප්‍රතිභාපූර්ණ කලා ශිල්පියකු වශයෙන් වත්මන් කලා ක්ෂේත්‍රය පිළිබඳ ඔබ දරණ අදහස පැහැදිලි කළහොත්.**

පිළිතුර -: විශේෂයෙන්ම අද සිනමාවට උදාවී ඇති තත්වය පිළිබඳව නම් මට ඇත්තේ ලොකු කනගාටුවකි. ඩීබී නිහාල්සිංහ මහතා චිත්‍රපටි සංස්ථා සභාපතිව සිටියදී නම් අපේ සිනමාව ඉතා හොඳ මට්ටමක තිබුණා. විශේෂයෙන් 1982 වැනි වසරවලදී මිලියන හතකට ආසන්නව පැවති සිනමා ප්‍රේක්ෂක පිරිස 1989 වැනි කාල වකවානුවලදී මිලියන හතර දක්වා සීඝ්‍ර වශයෙන් අඩුවී ගියා. ඉතිං මේ තත්වයට යම් ප්‍රමාණයකට සිනමා ශාලා හිමියන්ද වගකිව යුතුයි. අද වනවිට කොළඹ අවට තිබෙන සුපිරි මට්ටමේ සිනමා ශාලා කිහිපයක් ඇරෙන්නට අනිකුත් ප්‍රදේශවල ඇති සිනමා ශාලාවල තත්වය ඉතාමත් අසතුටුදායකයි. ප්‍රේක්ෂකයන්ට සුව පහසුව ඇවිත් සිනමා පටයක් රස විඳීමට තරම් වාතාවරණයක් එම සිනමාහල් තුළ නැහැ. ඒ වගේම ඇතැම් චිත්‍රපටි අධ්‍යක්ෂකවරු පසුගිය කාලවකවානු තුළ දේශපාලන හිතවත්කම් මත චිත්‍රපට කිරීමට කියා චිත්‍රපටි සංස්ථාවෙන් ණය අරගෙන පොලු තියලා රටෙනුත් පැනලා ගිහිල්ලා තියෙනවා. තවත් සමහරු චිත්‍රපටි හදන්න කියා ණය අරගෙන ඒ අයගෙ ගෙවල් තට්ටු දෙක තුනට ගහගෙන තිබුණා. ඉතිං මේ රටේ චිත්‍රපටි කර්මාන්තයක් ඉතිරි වෙයිද? අද රටේ ඉන්න පෝසත් මිනිස්සු සිංහල චිත්‍රපටි බලන්න එන්නෙ නැහැ. ඒ කලෙ සිංහල චිත්‍රපටි බැලුවෙ රටේ හිටපු දුප්පත් අහිංසක මිනිස්සුයි. දුප්පත් මිනිස්සු ගැලරියෙ ඉඳගෙන අපට විසිල් ගහල, චියර්ස් එක දාපු නිසා තමයි අපි මේ රටේ නළුවන් විදියට යම් තැනක ඉන්නේ. හැමදෙයක්ම මුදල මත තීරණය වන සමාජයක කලාවත් බිස්නස් එකක වන බව ඇත්තයි. නමුත් ඒ නිසා අද බොහෝ අය නිර්මාණ කරන්නේ මුදල්ම පමණක් ඉපයීමේ පරමාර්ථයෙන්. ඒ නිසාවෙන්ම එම නිර්මාණයේ ගුණාත්මක බව පිළිබඳව ඔවුන් එතරම් සැලකිල්ලක් දක්වන්නේ නැහැ. ඉතිං මේ තත්වය වෙනස්විය යුතු කාලය දැන් උදාවෙලා තියෙනවා. ඒ කොහොම උණත් උදයකාන්ත වර්ණසූරිය, ජැක්සන් ඇන්තනී වැනි නිර්මාණයේ ගුණාත්මක පැත්තට මුල්තැන දෙන පෙර දැනුමක් තිබෙන සිනමාකරුවන් අතලොස්සක් හෝ තව අප රටේ සිටීම සිංහල සිනමාවේ වාසනාවක්.

**ප්‍රශ්නය -: අද ටෙලිනාට්‍ය ක්ෂේත්‍රයට අවතීර්ණ වී සිටින නවක පරපුර මෙන්ම අත්දැකීම් බහුල දක්ෂ නළු නිළියන් පවා අවසානයේ ඉන්දියානු ආභාසය සහිත මෙගා රැල්ලකට එකතු වී ඇති බව දක්නට ලැබෙනවා. මේ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?**

පිළිතුර -: ඇත්තෙන්ම ඔබ ඔය සඳහන් කළ දක්ෂතම හා ප්‍රවීණතම නළු නිළියන්ගේ නම් සඳහන් කරමින් මේ පිළිබඳව විවේචනය කිරීමට මා කැමති නැහැ. ඔවුන් පවා අද මේ අකාරයෙන් මෙවැනි අවර ගණයේ නිර්මාණවලට දායක වන්නේ මන්ද යන්න අදටත් මට ගැටළුවක්. විශේෂයෙන්ම මෙවැනි ඉන්දීය ආභාසය සහිත අවර ගණයේ ටෙලිනාට්‍යයන්ට සම්බන්ධවීම අපගේ ප්‍රවීණතම නළු නිළියන්ගේ දක්ෂතාවයන් මොටවී යාමට එක් හේතුවක් ලෙස මා දකිනවා. කෙසේ වුවත් මේ සම්බන්ධයෙන් ඔවුන්ට දොස් පැවරීමට කිසිවෙකුටත් හැකියාවක් නැහැ. එයට හේතුව ප්‍රමාණවත් අයුරින් රටේ ප්‍රශස්ථ මට්ටමේ සිනමා නිර්මාණයන් සිදුනොවන්නේ නම් නළු නිළියන්ගේ වියහියදම් පිරිමසා ගැනීම සඳහා ලැබෙන ඕනෑම අවස්ථාවක් භාරගනීමට ඔවුන්ට සිදුවෙනවා.

# ENGLISH VISION

***English Vision*** පාඩම් මාලාව ඔස්සේ ***Art of the language*** (භාෂාවේ කලාව) අධ්‍යයනය සඳහා "රණවිරුවා" මාසික සඟරාව මගින් ඔබ හමුවට ගෙන එන තවත් එක් සරල ඉංග්‍රීසි වාක්‍ය රචනක භාවිතය පිළිබඳව මෙම මස කලාපය තුළින් අවධානය යොමු කරමු.

## Something to

**"යමක් තියෙනවා"** යන අර්ථය ප්‍රකාශ කිරීම සඳහා මෙම වාක්‍යය රටාව භාවිතා වේ.

***Fomular*** :- සූත්‍රය

**Subject + Have/Has + Something to + Verb (Infinitive) + Object + Rest.**
සබ්ජෙක්ට්+හැව්/හැස් + සම්තින්ග් ටු + වර්බ් (ඉන්ෆිනිටිව්) + ඔබ්ජෙක්ට් + රෙස්ට්.
කර්තෘ + උපකාරක ක්‍රියා පද + යමක් තියනවා + ක්‍රියාපදයේ මූලික ස්වරූපය + කර්මය + ඉතිරිය.

***Ex*** / *උදා* :-

1. I have something to tell you.
   අයි හැව් සම්තින්ග් ටු ටෙල් යූ.
   මට යමක් තියනවා ඔයාට කියන්න.

2. She has something to give you.
   ෂී හැස් සම්තින්ග් ටු ගිව් යූ.
   ඇයට යමක් තියනවා ඔබට දෙන්න.

3. We have something to share with you.
   වී හැව් සම්තින්ග් ටු ෂෙයාර් විත් යූ.
   අපිට බෙදා ගන්න දෙයක් තියනවා ඔයාලත් සමඟ.

***Nota Bene*** / සැ.යු :-

වාක්‍යය නිර්මාණය කිරීමේදී පහත පෙන්වා දී ඇති කරුණු පිළිබඳව සැලකිලිමත් වන්න.

- **Subject :-** කර්තෘ පදය ඒකවචන හා බහුවචන කර්තෘ පද උගත් ව්‍යාකරණ රීතීන්ට අනුකූල වන.

- **Something to :-** "යමක් තියනවා" ආදී වශයෙන් අර්ථය ගැනීම සඳහා මෙම කණ්ඩය කිසිදු වෙනසකින් තොරව වාක්‍යයේ භාවිතා වේ.

- **Verb :-** ක්‍රියා පදය වාක්‍යයේ භාවිතා කිරීමේදී ක්‍රියා මූල පදයක් ලෙස භාවිතා කළ යුතුය.

**<u>Analysis of the sentence formation</u>** <u>- වාක්‍යය රටාවෙහි සැකැස්ම විශ්ලේෂණය.</u>

**Subject + Have/Has + Something to + Verb (Infinitive) + Object + Rest.**
සබ්ජෙක්ට් + හැව්/හැස් +සම්තින්ග් ටු +වර්බ්(ඉන්ෆිනිටිව්) + ඔබ්ජෙක්ට් රෙස්ට්.
කර්තෘ + උපකාරක ක්‍රියා පද + යමක් තියනවා + ක්‍රියාපදයේ මූලික ස්වරූපය + කර්මය + ඉතිරිය.

We have something to share with you.
වී හැව් සම්තින්ග් ටු ෂෙයාර් විත් යූ.
අපිට බෙදා ගන්න දෙයක් තියනවා ඔයාලත් සමඟ.

***"English vision"*** නව පාඩම් මාලාවක් ඔස්සේ ඔබගේ ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය සඳහා "රණවිරුවා" මීළඟ කලාපය සමඟ එක්වන්න. තවද ඔබට මගහැරුණු පාඩම් අධ්‍යයනය කිරීම සඳහා පහත දී ඇති වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.



මේජර් චමින්ද ලියනගේ
[illegible]
ජනමාධ්‍ය අංශ - යුහමු
*www.englishvision.lk*




### කාලය හා කර්මය...

කුරුල්ලකු ජීවත්ව සිටින විට
ඌ කුහුඹුවන් අනුභව කරයි
කුරුල්ලකු මියගිය විට
කුහුඹුවන් කුරුල්ලන් අනුභව කරයි
එක් ගසකින් ගිනි කූරු මිලියන ගණනක්
සෑදිය හැක
නමුත් එක් ගිනි කූරකින් ගස් මිලියන ගණනක්
විනාශ කළ හැක
එක් මොහොතකින් සියල්ල වෙනස් වී යා හැක
නමුත් කාලය අප හැමට වඩා ප්‍රබලය

සෙ/420256
සැරයන් මධුසංක අයිකේයූ
8 ගැටෙම්බ (මිහිඳුසෙත් මැදුර)

### මගේ අම්මා...

කුස දරා මා දස මසක්
පොවා ලේ කිරි සමුදුරක්
දයා ගුණයෙන් මා හැදූ වැඩූ
නුඹයි මගේ අම්මා

සෙ/415493
බඹ 11 අමරසිංහ එච්එච්එන්ජේ
3 ගැටෙම්බ (අභිමංසල 03)

### මල් කැකුලක්...

මා යනෙනා නුඹ නොයනා අතීත කඳවුරේ
අසන්දා පෙම් සොම්යෙන සිතුවම් පිළිලයේ
නුඹට දාව මා බිහිකළ අපේම උරුමයේ
මල් කැකුලක් පිදෙනවා ගැරහුම් මැද ලොවේ

සෙ/505140
බඹ 11 කරුණාතිලක ඩබ්ලිව්ජීඑම්ඩබ්ලිව් ආර්එස්පී
4 විපාරෙ (අභිමංසල 03)

### රිදුම්දෙන සිත...

හිරු එළිය සඳ කිරණ හමන සුළඟේ පවා
මල් සුවඳ පිණි බිඳක නුඹේ සුවඳ තැවරිලා
රිදුම් දෙන සිත තවම නුඹ එනැයි සිත සිතා
නොඑන බව දැන දැනම
මඟ බලයි රැවටිලා

සෙ/420441
සැරයන් එදිරිසිංහ ඊච්ච්ච්
12 ගැටෙම්බ (අභිමංසල 03)

### දැන් ටිකෙන් ටික හරි බරයි...

උදේ එළිවෙන තුරුම නිදියල
අයියරයාණේ අට පහුවෙලයි
මන්ම රත්කළු මොනවහරි උඹ
ගිල්ලේ ගාණක් නැතුවමයි
ගෙදර මිදුලේ මලක් පිපුණේ
නුඹේ අතැගිලි වැදිලමයි
කුරුළු තටුවක් විලස තිබූ හිත
දැන් ටිකෙන් ටික හරි බරයි

සෙ/321394
කෝප්‍රල් මදුශංක එච්එම්පී
අභිමංසල 03

### සිහසුන රකිනා රජ්ජුරුවෝ...

ඔටුනු පළඳවන්නට බැරි රජ්ජුරුවෝ
කරගැට මිලින් කුස පුරනා රජ්ජුරුවෝ
සිහසුන රකින පුතු සිඹිනා රජ්ජුරුවෝ
මං විතරද සිහින දකින පිය රජ්ජුරුවෝ

ගිනි දුම් මැදින් සුදු පැහැ සඳ වඩම්මා බිසෝ
ගගනට සඳ බෙදා කඳුළු සඟවුවා බිසෝ
හිස අළු පිසදමා නෙතඟින් මදෙස බලා බිසෝ
රජ බොජුන් වළඳමු අපි පිලේ ඉඳන් බිසෝ

සෙ/300042
කෝප්‍රල් කොඩිතුවක්කු කේවීඩී
6 ශ්‍රීලපාහ (අභිමංසල 03)

### දැනුණේ නැතිදෝ ආදරේ...

වැහි වලාවක් නිම්හි කීවා
වැස්ස අත ළඟම එන බව කීවා
මගෙ හිත මට රහස් කීවා
ඔබත් මාගෙන් දුරක යන බව

සිහින මාවතේ ඇවිදමින් මම
බඹේ උණුහුම සෙවූ තරම්
දැනුණේ නැතිදෝ නුඹට මා ගැන
ආදරේ හිත් කොනකවත්

සෙ/101570
ලා/කෝ කරුණාතිලක ඩීවීඩීකේ
17 විපාරෙ (අභිමංසල 03)

### රිදෙන හදවත...

පුරා දින සති ගෙවී ගියමුත්
ඇඟිලි ගනිමින් තිස් පැයේ
උදා නොම වී ගෙදර යන දින
දෑස කඳුලින් බරවුනත්
හිනා නොවුනත් වෙනසකර බව
දිවා රෑ තුළ කඳවුරේ
නිමාවක් නෑ ඔබගේ මතකයේ
හද රිදුම් දෙන රිද්මයේ

සෙ/703064
මා/කෝ සමන්ත කුමාර එච්ඩීපීඑස්
1 ශ්‍රීලංසෙහ

### උදව් උපකාර...

උදව් උපකාර කරන්න
නැවත සිතාවක්වත්
බලාපොරොත්තු නොවී

සෙ/2එල්00833
මා/සැ අජිත ජයවීර ඊවීඑල්
2(සේවා) ශ්‍රීලයුසෙම

### මා ආශාවන්...

කැවුනත් කටුව පුරා ගතේ
ආශාව මෝරා නහර දිගේ
දුටුවම මා කෝල සිතේ
තුටුවන් සේ හැඟුමන් නැගේ
තිබ්බත් ඇනුම් සතර අතේ
නොකරයි වෛරයක් අතේ
මොනව සිතුවත් වටපිටේ
අවැඩක් නොවේ ආසාවකි මේ
මොනව කීවත් මට මෙසේ
ගණන් නොගනිම් මා කෙසේ
මා ආශාවකි කෝල සිතේ

සෙ/485516
කෝප්‍රල් වනිගසේකර ඩීඩබ්ලිව්වීඑස්
12 ගරෙ (අභිමංසල 03)

### මට මුළු ලෝකයක්...

අද පටන් නුඹ මසිතට වනාවක්
සිතුවිල්ලකින් වත් නැත මට නිදහසක්
ඒ ගැන සිතුවේ නම් නෑ මම උදාසක්
නුඹ නම් මා වසඟෙට ගත් ඉනාවක්

ගෙවනා තුන් යමය නුඹ භාවනාවක්
නොනිදන නෙතු අතර රැඳි සුව සිහිනයක්
හදවත පුරාවට සරනා වේගයක්
සත්තයි නුඹව නම් මට මුළු ලෝකයක්

සෙ/242735
කෝප්‍රල් වැලිකලගේ ඩබ්ලිව්ඩීඑන්යූකේ
6 ශ්‍රීලංරෙ (අභිමංසල 03)

### ශාප නොදෙන් දුවේ...

ඔය තරු ඇස් යට හැංගුමට
මුතු කඳුලක් රැයේ
නිතුවක්කාරෙට කොපුලක්
කිප ගත්තද දුවේ
මම අම්මයි උඹ බිහිකළ
වාවනු මං කෙසේ
තාතිත් අසරණ අම්මට
ශාප නොදෙන් දුවේ

සෙ/479181
සැරයන් නිශාන්ත ඊච්ච්ච්
16 ගරෙ (අභිමංසල 03)

### නිව්ටන්ගේ අවසන් නියමයන්...

කාල ගංගාව මත ඊට අනුලෝමය
ජීවන යාත්‍රාව ගමන් ගන්නා කළ
යාත්‍රාවට මගත් වද දුන්
බොහෝමයක් ප්‍රශ්න
තිලිණ කෙරුවා ගංගා දියට
විරුද්ධව එලෙස ගෙව්වත්
ඉදිරියේදී රුදුරු සුළියක් එවි
මතක් කරමින්
නිව්ටන්ගේ අවසන් නියමයන්

සෙ/66792
මේජර් ආර්එම්පී රණනායක ආර්එස්පී
18 විපාරෙ (අභිමංසල 03)

# ලීක් එක...

දුන්හිඳ ඇල්ල පෙන්වීමට අරාබි සංචාරකයින් කැඳවාගෙන ගිය සංචාරක මගපෙන්වන්නා මෙසේ ඇසුවා.

''ඔබේ රටවලත් මේ වගේ දියඇලි තියෙනවද?''

''නැහැ. ඒ වුනාට මීට වඩා විශාල ලීක් එකක් උනත් පැය බාගෙන් නවත්තල දෙන්න පුළුවන් දක්ෂයො එහෙ ඉන්නවා''



# දෙකේ දෙකේ පරාල...

**බිරිඳ :** ඔයාගේ නින්දෙන් ගෙරවිල්ල එන්න එන්නම ඉවසන්න බැරි තරම් සද්දයි.

**සැමියා :** ඒක ඒ තරම් දරුණුද?

**බිරිඳ :** ඔයා දෙකේ දෙකේ පරාල ඉරුවනම් හලාවත, පුත්තලම පලාතේ එක පොල්ගහක් ඉතුරුවෙන එකක් නැහැ.






# තාත්තගෙ හැටි...

**ගුරුතුමා :** චන්ද්‍රපාලට මම රුපියල් දහයක් දෙනව. චන්ද්‍රපාල තාත්තගෙන් රුපියල් අටක් ඉල්ලා ගන්නවා. එතකොට ඔබ ළග රුපියල් කීයක් තියෙනවද?

**චන්ද්‍රපාල :** රුපියල් දහයයි සර්.

**ගුරුතුමා :** චන්ද්‍රපාල ගණන් දන්නෙ නැහැනෙ.

**චන්ද්‍රපාල :** සර් අපේ තාත්තගෙ හැටි දන්නෙ නැහැනෙ.

# ලියුම...

මිසිස් පෙරේරා රෑ කෑම පිළියෙල කරමින් සිටින විට ඇගේ පුංචි පුතා මුළුතැන්ගෙය තුළට ආවේය.

''අම්මීගෙ හුරතලා අද දවසෙ මොනවද කළේ?''

''මම ලියුම් බෙදන්නෙක් විදියට තනිවම සෙල්ලම් කළා'' යැයි පුංචි පුතා කීය.

''ලියුම් බෙදන්නා එක කරන්නේ කොහොමද? ඔයාට කෝ ලියුම්?''

''මට ලියුම් මිටියක් හම්බු උණා. ඒ මිටිය පරණ ටුන්ක පෙට්ටිය ඇතුළෙ රිබන් පටිවලින් ගැටගහල තිබුණෙ. මං ඒව ඔක්කොම අපේ පාර දෙපැත්තෙ තියෙන ගෙවල් ඔක්කොටම බෙදුවා''.



# සල්ලි...

රුපියල් පහේ කාසි මිටියකුයි ශත පනහෙ මිටියකුයි බැංකුවෙ කවුන්ටරය මත තබාගෙන සිටි මිනිසෙක් ඒ මිටි දෙන්ට තැනක් සොයමින් යමක් අහගෙන ඉන්නවා වගේ සිටියේය.

**බැංකුකරු :** මොකක් හරි ශබ්දයක් ඇහෙනවද?

**මිනිසා :** ඔව්. මේ රුපියල් පහේ මිටිය ශත පනහෙ මිටියට කියනවා යාලුවා අපි බස්වලින් රට පුරාම ඇවිදලයි මෙතනට ආවෙ කියල. එතකොට ශත පනහෙ මිටිය ඇතුළෙන් කිව්වා මම නම් මේ රටේ සල්ලියක් පන්සලක් නැර ගිහිල්ලයි මෙතනට ආවෙ කියල.



**වෘත්තීය දිවියේ නේකවිධ කඩඉම් පසුකොට සුබ මොහොතින් නව තනතුරු ලැබූ**
**ඔබ සියලු දෙනාට දිරිය, විරිය,රැකවරණය ලැබේවායි**
**"රණවිරුවා" ද මෙසේ සුබ පැතුම් එක්කරයි.**



ආරක්ෂක සේනා (යාපනය)
ආඥාපති ලෙස

**මේජර් ජෙනරාල්**
**ඩබ්ලිව්එම්ජීසීඑස්පී විජයසුන්දර**
**ආර්එස්පී යූඑස්පී එන්ඩියූ**

**2022 ජූනි මස 12 වන දින සිට**



ගැමුණු හේවා බලකායේ
රෙජිමේන්තු අධිපති ලෙස

**මේජර් ජෙනරාල්**
**ඒසී ලමාහේවා ඩබ්ලිව්ඩබ්ලිව්වී**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**

**2022 මැයි මස 13 වන දින සිට**



ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ
රෙජිමේන්තු අධිපති ලෙස

**මේජර් ජෙනරාල්**
**පීආර්ආර්පී ජයවර්ධන**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ**

**2022 ජූනි මස 23 වන දින සිට**



ක්ෂේත්‍ර ඉංජිනේරු කාර්යාලයේ
ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු ලෙස

**මේජර් ජෙනරාල්**
**එම්කේ ජයවර්ධන**
**ආර්එස්පී යූඑස්පී එන්ඩියූ**

**2022 ජූනි මස 11 වන දින සිට**



ශ්‍රී ලංකා සංඥා බලකායේ
බලකාධිපති ලෙස

**මේජර් ජෙනරාල්**
**එච්එම්එල්ඩී හේරත්**
**ආර්එස්පී යූඑස්පී පීඑස්සී**
**2022 ජූනි මස 06 වන දින**
**රාජකාරි භාරගන්නා ලදි.**

තවද, ප්‍රධාන සංඥා නිලධාරී
ලෙස 2022 ජූනි මස 03 වන
දින රාජකාරි භාරගන්නා ලදි.



ආරක්ෂක සේවා අණ හා
මාණ්ඩලික විද්‍යාලයේ
සේනාවිධායක ලෙස

**මේජර් ජෙනරාල්**
**බීකේජීඑම්එල් රොද්‍රිගෝ**
**ආර්එස්පී පීඑස්සී අයිජී**

**2022 ජූනි මස 20 වන දින සිට**



යුද සේවා ලේකම් ලෙස

**මේජර් ජෙනරාල්**
**එම්පීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී**
**වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී එන්ඩියූ පීඑස්සී**

**2022 ජූනි මස 03 වන දින සිට**



51 වන පාබල සේනාංකයේ
සේනාංකාධිපති ලෙස

**මේජර් ජෙනරාල්**
**කේඒජී උදය කුමාර**
**ආර්එස්පී යූඑස්පී**
**ඩබ්ලිව්එස්ඩබ්ලිව්සී පීඑස්සී**

**2022 ජූනි මස 07 වන දින සිට**



කෘෂිකර්ම හා පශු සම්පත්
බලකායේ
මධ්‍යස්ථාන සේනාවිධායක ලෙස

**බ්‍රිගේඩියර්**
**ආර්එම්ජේබී රත්නායක**
**ආර්එස්පී**
**2022 මැයි මස 31 වන දින සිට**



58 වන පාබල සේනාංකයේ
සේනාංකාධිපති ලෙස

**බ්‍රිගේඩියර්**
**ඩබ්ලිව්ටීඩබ්ලිව්පී ඉහලගේ**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී**

**2022 ජූනි මස 03 වන දින සිට**



ඉදිරි නඩත්තු පෙදෙස (උතුර)
ආඥාපති ලෙස

**බ්‍රිගේඩියර්**
**ඒසීඑ ද සොයිසා**
**යූඑස්පී එච්ඩීඑම්සී එල්එස්සී**

**2022 ජූනි මස 09 වන දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය
(වන්නි) බ්‍රිගේඩියර් ප්‍රමාණි ලෙස

**බ්‍රිගේඩියර්**
**ඒපී වික්‍රමසේකර යූඑස්පී**
**පීඑස්සී**

**2022 ජූනි මස 01 වන දින සිට**



ප්‍රගුණ හා සැඟවුණු වෙඩිකරු පුහුණු පාසලේ සේනාවිධායක ලෙස

**බ්‍රිගේඩියර්**
**ජේඑම්එස්පීබී ජයමහ**
**ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී යූඑස්පී**

**2022 ජුනි මස 01 වන දින සිට**



වත්කම් කළමණාකරණ අධ්‍යක්ෂක ලෙස

**බ්‍රිගේඩියර්**
**ජේකේඑස් පැරකුම්**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**

**2022 ජුනි මස 13 වන දින සිට**



පිරිස් පාලන අධ්‍යක්ෂ ලෙස

**බ්‍රිගේඩියර්**
**කේඒයූ කොඩිතුවක්කු**
**ආර්එස්පී යූඑස්පී පීඑස්සී අයිජී**

**2022 ජුනි මස 03 වන දින සිට**



593 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ලෙස

**කර්නල්**
**ඊඊඩීපී කුලතිලක යූඑස්පී පීඑස්සී**

**2022 මැයි මස 26 වන දින සිට**



583 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ලෙස

**කර්නල්**
**ටීඑන්කේ පෙරේරා**

**2022 ජුනි මස 01 වන දින සිට**



22 වන පාබල සේනාංකයේ කර්නල් ප්‍රමා ලෙස

**කර්නල්**
**එස් විජේසිරවර්ධන**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**

**2022 මැයි මස 28 වන දින සිට**



68 වන පාබල සේනාංකයේ කර්නල් ප්‍රමා ලෙස

**කර්නල්**
**ඒකේ පීරිස් ආර්එස්පී**

**2022 ජුනි මස 10 වන දින සිට**



යුද්ධ හමුදා මූලස්ථානයේ ජ්‍යෙෂ්ඨ ආරක්ෂක සම්බන්ධීකරණ නිලධාරී ලෙස

**කර්නල්**
**එච්කේජේයූ ජයරත්න**

**2022 ජුනි මස 20 වන දින සිට**



යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ කර්නල් (සම්බන්ධීකරණ) ලෙස

**කර්නල්**
**එන් මහවිතාන කේඑස්පී**

**2022 ජුනි මස 16 වන දින සිට**



ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ මධ්‍යස්ථාන සේනාවිධායක ලෙස

**කර්නල්**
**එච්ඒ කීර්තිනාත ආර්එස්පී**
**කේඑස්පී පීඑස්සී**

**2022 ජුනි මස 13 වන දින සිට**



55 වන පාබල සේනාංකයේ සිවිල් සම්බන්ධීකරණ නිලධාරී ලෙස

**ලුතිනන් කර්නල්**
**කේකේඩීආර් චමින්ද**

**2022 මැයි මස 04 වන දින සිට**



රෙජිමේන්තු මූලස්ථාන බලඇණිය, ගජබා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ලෙස

**මේජර්**
**ආර්එම්එල්යූඩී රත්නායක**

**2022 මැයි මස 12 වන දින සිට**

# බලඇණි පුහුණු පාඨමාලාව සාර්ථකව අවසන් කෙරේ





12 වන ගැමුණු හේවා බලකායේ නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ ප්‍රහාරක බලය, සාමූහික ශක්තිය වර්ධනය කරගැනීම හා පාබල සොල්දාදුවකු සැම අතින්ම පරිනත අයකු බවට පත්කිරීමේ අරමුණින් සාමූහික බළඇණි පුහුණුවීම් පාඨමාලාව ඉකුත් අප්‍රේල් 25 වන දින 52 වන පාබල සේමු බළඇණි පුහුණු පාසල විඩත්තපලෙයි හිදී ආරම්භ කරන ලදි. අණදෙන නිලධාරී මේජර් ආර්ඒඑස්එල් රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ නායකත්වය යටතේ සිදුකරන ලද මෙම පාඨමාලාව ඉකුත් ජුනි 12 වන දින සාර්ථකව අවසන් විය.



# රණවිරුවා


පරිගණක අකුරු සංයෝජනය,
කවර නිර්මාණය හා පිටු සකසුම

සෙ/752158 බනි II සේනාරත්න ජීඩී 3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජීජීඑම් 11 ඉසේරෙ
සෙ/754676 ලා/කෝප්‍රල් ලක්තිළිණ ඩබ්ලිව්ආර් 11 ඉසේරෙ

**රණවිරුවා ලිපිනය**

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
කොළඹ

**ඊමේල්**

dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**

011 2993076

**ගුප්ත දිගුව**

51445/51446

"රණවිරුවා" අන්තර්ජාලය ඔස්සේ කියවීමට

**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය






**අධීක්ෂණය**

බ්‍රිගේඩියර්
කේපීපී ද සිල්වා ආර්එස්පී පීඑස්සී







**උපදේශකත්වය**

කර්නල්
ඩීඑම්ඩී දිසානායක ආර්ඩබ්ලිව්පී

**ප්‍රධාන සංස්කාරක**

ලුතිනන් කර්නල්
සුජිත් චමින්ද එදිරිසිංහ

**සහය සංස්කාරක**

කපිතාන්
එච්එල්ඩී ලක්ෂිකා

# සෙසුනිලයන්ට නව නේවාසික පහසුකම් සංකීර්ණයක්





ශ්‍රී ජයවර්ධනපුර පිහිටි යුද්ධ හමුදා මූලස්ථානයේ සේවයේ නියුතු සෙසුනිලයන් 740 දෙනකුගේ දීර්ඝ කාලීන අවශ්‍යතාවයක් සපුරාලමින් ආරක්ෂක මූලස්ථාන සංකීර්ණයට නුදුරින් පිහිටි තලංගම උතුර ප්‍රදේශයේ ඉදිකරනු ලැබූ නව නේවාසික පහසුකම් සංකීර්ණය ඉකුත් ජුනි 08 වන දින නිල වශයෙන් විවෘත කෙරිණ.

මෙම නව නේවාසික පහසුකම් සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු ඉංජිනේරු සේවා බලකායේ සහ ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ හටපිරිස් මෙන්ම නාවික හා ගුවන් හමුදා සාමාජිකයින්ගේ ඉංජිනේරු සහ තාක්ෂණික දැනුම මත සිදුකරනු ලැබූහ. නේවාසික පහසුකම් සංකීර්ණය විවෘත කිරීමේ උත්සව අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් සහ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ ආරාධනයෙන් ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) සහභාගී විය.

සුබසාධන ආපන ශාලාවක්, සේවා වනිතා වෙළඳසැලක්, වෛද්‍ය පරීක්ෂණ ඒකකයක් ඇතුළු අත්‍යාවශ්‍ය පහසුකම්වලින් සමන්විත මෙම නේවාසික සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු සඳහා මහා භාණ්ඩාගාරයේ මාර්ගෝපදේශයන් මත ආරක්ෂක මූලස්ථාන අයවැය මඟින් අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වෙන්කරන ලදී.









රණබිමේ මතක

# තුන්කල් රකිනා මෙහෙවර...

රණවිරුවන් වෙර වීරියෙන් ඉතුරු කළ දෙයක් වේනම් ඒ මේ රටයි. උපයාගත් දෙයක් වේ නම් ඒ මේ රටේ ජනතාවයි. හමුදාව තරම් අනුන් වෙනුවෙන් අසීමිතව ජීවිතවල අවස්ථා කැපකළ තවත් පිරිසක් නැහැ. රණවිරුවෝ කියන්නෙම එහෙම ජාතියක්. ඔබ නිදහසේ තබන හැම පියවරක් ගානෙම, නිදහසේ ගන්නා හැම හුස්මක් පාසාම ඇත්තේ ඔවුන්ගේ තුන්කල් මෙහෙවරෙහි ප්‍රතිඵලයි.

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.